# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2023

මෙය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් එහි වාර්ෂික වාර්තාව යි. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වැනි වගන්තියට අනුකූලව මෙය ඉදිරිපත් කර තිබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ප්‍රධාන කාර්යාලය
නො.14, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04
දුරකතන අංක: (94) 0112505580, 2505581, 2505582
ෆැක්ස් අංකය: (94) 0112505591
විද්‍යුත් තැපැල් ලිපිනය: sechrcsl@gmail.com
වෙබ් අඩවිය: www.hrcsl.lk

# 2023 වර්ෂයේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන්

සභාපති

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය

කොමසාරිස්වරු

මහාචාර්ය තායියාමුතු තානරාජ්

මහාචාර්ය ෆාතිමා ෆර්සානා හනීෆා

නිමල් ජී.පුංචිහේවා මහතා

ආචාර්ය ගෙහාන් දිනුක් ගුණතිලක

# සභාපතිතුමාගේ පණිවිඩය

ව්‍යවස්ථාපිත පනතක් යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යනු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පවතින ප්‍රධාන අධීක්ෂණ ආයතනය වේ. මෙරට ඉතිහාසය තුළ ඇති වූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් පසුව රටක් වශයෙන් නැවත යථා තත්ත්වයට පැමිණෙමින් තිබූ ශ්‍රී ලංකාව විසින් 2023 වර්ෂයේ දී මානව හිමිකම්වලට අදාළව ප්‍රගාමී සංවර්ධනයන් මෙන්ම පරිහානික තත්ත්වයන් ද අත්දකින ලදී. රට තුළ පවතින මානව හිමිකම් ගැටලු සාකල්‍ය ප්‍රවේශයකින් විසඳීමේ අරමුණ ඇතිව, රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා මැදිහත්වීමේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එහි විවිධ අංශ තුළ ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකරන ලදී. මේ සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් ධාරිතාවය වැඩිදියුණු කිරීමට සහ උපදේශක, අධීක්ෂණ, විමර්ශන, අධ්‍යාපනික සහ එහි සමාජ කැපවීම සහ බලපෑම යන කර්තව්‍යයන් සවිමත් කිරීම සඳහා එහි සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් උපයෝජනය කරන ලදී.

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධානතම ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍රය වූයේ කොමිෂන් සභාව වෙත පුරවැසියන්ගේ ප්‍රවේශතාවය ඉහළ නැංවීම යි. ඒ අනුව, කොමිෂන් සභාව විසින් රත්නපුරයේ සහ නුවරඑළියේ නව උප-කාර්යාල දෙකක් ස්ථාපනය කරන ලද අතර මෙහි දී විශේෂයෙන් අවධානය යොමු වූයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එම කලාපයේ වතු අංශයේ සේවකයන්ගේ ප්‍රවේශතාවය ඉහළ නැංවීම යි. මීට අමතරව, මෙහෙයුම් ධාරිතාවය වැඩිකිරීම සඳහා පිළිවෙලින් ජාත්‍යන්තර සබඳතා අංශය සහ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය වශයෙන් නම් කරන ලද නව අංශයක් හා විශේෂිත ඒකකයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය තුළ ස්ථාපනය කරන ලදී. ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිති සමඟ අනුකූල වන පරිදි ජාතික නීති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රජය වෙත උපදෙස් හා නිර්දේශ ලබාදීම සඳහා ජාත්‍යන්තර සබඳතා අංශය ස්ථාපනය කරන ලදී. ඒ අනුව, 2023 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් පනත් කෙටුම්පත් කිහිපයක් සමාලෝචනය කර සිය නිරීක්ෂණ හා නිර්දේශ ලබාදෙන ලද අතර, ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත, ජාතික කාන්තා කොමිෂම පිළිබඳ පනත් කෙටුම්පත, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත, ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත් කෙටුම්පත මෙම පනත් කෙටුම්පත් අතරට අයත් වේ. මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ බරපතල සිද්ධි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් ආරම්භ කරන පරීක්ෂණවලට (*suo motu* cases) අදාළව කාලානුරූපි ආකාරයෙන් ප්‍රතිකර්ම හා නිර්දේශ ලබාදීමේ

අරමුණැතිව ස්ථාපිත කරන ලද කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය විසින් 2023 වර්ෂයේ දී කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ සංචාර හයක් සිදුකර ඇත. සුවිශේෂී කරුණ වනුයේ මෙම සිද්ධි හයම ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ නියැලෙන නිලධාරින් විසින් පුද්ගල නිදහස අහිමිකරවීම්වලට අදාළ වීම ය.

තවත් ක්‍රමෝපායික වශයෙන් අවධානිත කරුණක් වූයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ සහ නියෝග ක්‍රියාත්මකවීමේ ශීඝ්‍රතාවය ඉහළ නැංවීම යි. එනිසා, ක්‍රියාත්මක නොකිරීමේ ඒකකය සක්‍රිය අයුරින් යළි පණ ගන්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොමිෂන් සභාව විසින් නිකුත් කළ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම උදෙසා වගඋත්තරකරුවන් විසින් අනුගමනය කළ පියවර පිළිබඳ යාවත්කාලීන තොරතුරු යෝග්‍ය පරිදි කොමිෂන් සභාව වෙත ලැබීම සිදුවිය. පවත්නා ක්‍රමය තුළට මානව හිමිකම් සම්බන්ධිත සංස්කෘතියක් අන්තර්ගත කිරිම සඳහා වන සාමූහික මෙහෙවර සඳහා මෙය සාධනීය පියවරකි. එසේ වුව ද, ඇතැම් සිද්ධීන්වල දී, නිර්දේශ සමාලෝචනය කිරීම සඳහා වන අභියාචනා ද කොමිසම වෙත ඉදිරිපත් කෙරෙන අතර, එවැනි අවස්ථාවන්හි දී අදාළ අභියාචනාවල සාධාරණත්වය මත පදනම්ව වර්තමාන වාතාවරණය තුළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවය සමාලෝචනය කිරීම පිණිස කොමිෂන් සභාව විසින් පියවර ගනු ලැබේ.

පූර්ව වර්ෂවල දී පරිදිම, 2023 වර්ෂය තුළ ද නීතිවිරෝධී මානව හිමිකම් කඩකිරීම්වලට අදාළව පුද්ගලික නිදහස සම්බන්ධිතව වැඩිම පැමිණිලි ලැබී තිබූ ප්‍රධාන කාණ්ඩ ත්‍රිත්වය වූයේ වධ හිංසා පමුණුවාලීම, හිරිහැර කිරීම් සහ අත්තනෝමතික අයුරින් අත්අඩංගුවට ගැනීම හා රඳවාගැනීම යි. පුද්ගල නිදහස අහිමිකරවීමේ සිද්ධි වළක්වා ගැනීම පිණිස පූර්ව ක්‍රියාකාරී පියවර ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වර්ෂය මුළුල්ලේම අදාළ මානව හිමිකම් නීති හා ප්‍රමිති පිළිබඳ පුහුණු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු රාශියක් ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා පවත්වන ලදී. භූගෝලීය කලාප අටක බන්ධනාගාර නිලධාරීන් සඳහා පවත්වන ලද ධාරිතා ගොඩනැංවීමේ පුහුණු සහ රට තුළ විවිධ පොලිස් ස්ථානවල උප පොලිස් පරීක්ෂකවරු එකසිය හැත්තෑවක් සඳහා පවත්වන ලද වධ හිංසා පමුණුවාලීම වළක්වාලීම පිළිබඳ පුහුණුව මීට ඇතුළත් විය. අත්අඩංගුවේ සිටින තැනැත්තන්ගේ මානව හිමිකම් එහි උපරිම මට්ටම දක්වා ගරු කෙරෙන බව සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස් ස්ථාන සහ රඳවාගැනීමේ මධ්‍යස්ථාන වෙත නිශ්චිත හා නිරන්තර සංචාර සිදුකරනු ලැබී ය.

රට තුළ නැවත නැවත සිදුවන හා බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රජය වෙත ද පොදු මාර්ගෝපදේශ හා නිර්දේශ කිහිපයක් ද නිකුත් කරන ලදී. මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ නිර්දේශ, සංක්‍රාන්ති ලිංගිකත්වය සහිත පුද්ගලයන් ආරක්ෂා කිරීම පිණිස පොලිස් නිලධාරීන් වෙත මාර්ගෝපදේශ, සිවිල් ජනතාවගේ විරෝධතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ

දී රජය සහ නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා නිර්දේශිත මාර්ගෝපදේශ සහ පොලිස් නිලධාරියෙකු (නිලධාරීන්) ඍජු හෝ වක්‍ර ක්‍රියාමාර්ගයක් හෝ රාජකාරි පැහැර හැරීමක් හේතුවෙන් පොලිසිය භාරයේ සිටින තැනැත්තෙකු මිය යෑම හෝ නීතිමය රාමුවෙන් පරිබාහිරව පොලිස් නිලධාරියෙකු (නිලධාරීන්) අතින් පුද්ගලයෙකු මරණයට පත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය සහ අනෙකුත් අදාළ බලාධිකාරීන් වෙත නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ කෙටුම්පත මෙසේ නිකුත් කරන ලද ප්‍රධාන මාර්ගෝපදේශ කිහිපය වේ.

මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා සිවිල් සමාජ සංවිධානවල වැදගත් භූමිකාව හඳුනාගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එම සංවිධාන සමඟ සක්‍රියව සම්බන්ධවී කටයුතු කිරීම සඳහා වූ සිය කැපවීම අඛණ්ඩව සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද ඉතා වැදගත් පියවරක් වූයේ කොමිෂන් සභාව විසින් ස්ථාපනය කරන ලද තේමාත්මක උප කමිටුවල හවුල්කරුවන් වශයෙන් පැවතීම සඳහා එකී සිවිල් සමාජ සංවිධානවල නියෝජිතවරුන්ට ආරාධනා කිරීම යි. සියලු මට්ටම්වල මානව හිමිකම් ගැටලු නිරාකරණය සඳහා සිවිල් සමාජ සංවිධාන සමඟ අර්ථාන්විතව හා ඵලදායි අයුරින් සම්බන්ධවීමට එවැනි නියෝජනයක් ඔස්සේ කොමිෂන් සභාවට හැකියාව ලැබුණි.

ජාත්‍යන්තර මානව හිමිකම් සඳහා රාජ්‍යය සතු බැඳීම්වලට අනුකූලව සහ රට තුළ මානව හිමිකම් ප්‍රගාමී සංවර්ධනය සහතික කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රජාව සමඟ එක්ව කටයුතු කිරීමේ වැදගත්කම හඳුනාගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සම්මුතිවලට අදාළ සංවිධාන වෙත සහ කලාපීය මානව හිමිකම් සංවිධාන වෙත සිය සමාන්තර වාර්තා සහ ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුවේ 25 වැනි සැසිය සඳහා ඉදිරිපත් කළ ප්‍රකාශනය, ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කළ සමාන්තර වාර්තාව, සහ මානව හිමිකම් කමිටුවේ 137 වැනි සැසිවාරය සඳහා ඉදිරිපත් කළ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ 6 වැනි කාලාන්තර වාර්තාව එවැනි දායකත්වයන් යටතට ඇතුළත් ය.

මෙම වාර්ෂික වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇති පරිදි, කොමිෂන් සභාවට මුහුණ දීමට සිදුවූ බොහෝ අභියෝග මධ්‍යයේ වුව ද, පවතින සම්පත් මත පදනම්ව සිය උපරිම හැකියාවැති මට්ටම දක්වා රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වර්ෂය මුළුල්ලේ බොහෝ ඵලදායි හා තිරසර මැදිහත්වීම් සිදුකර තිබේ. ඉතාමත් අහිතකර වාතාවරණයන් සහිත කාල සීමාවන් තුළ වුව ද, මානව හිමිකම්වලට ගරු කිරීම සිදුකරන මට්ටම දක්වා ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළට මානව හිමිකම්වලට ගරු කිරීම ඒකාබද්ධ කිරීම ක්‍රමෝපායික මැදිහත්වීම් ඔස්සේ සහතික කරනු වස් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය නොසැලෙන කැපවීම අඛණ්ඩව දියත් කරනු ලබන බව වගකීමෙන් යුතුව සඳහන් කරමි.

***සභාපති***

***ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව***

# පටුන

**කොමිෂන් සභාවේ සාමාජිකයන්**

**සභාපතිතුමාගේ පණිවිඩය**

**පටුන**

**කෙටි යෙදුම් ලැයිස්තුව**

**1 වැනි පරිච්ඡේදය: කොමිෂන් සභාව පිළිබඳව**

1.1. කොමිෂන් සභාව පිළිබඳ කෙටි විග්‍රහයක්
1.1.1. දැක්ම
1.1.2. මෙහෙවර
1.1.3. හරයාත්මක වටිනාකම්
1.1.4. ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍ර
1.1.5. කොමිෂන් සභාවේ නිල ලාංඡනය
1.2. පැවරී ඇති බලයේ ස්වභාවය සහ විෂය පථය
1.3. පිහිටුවීම සහ ස්වාධීනත්වය

**2 වැනි පරිච්ඡේදය: කොමිෂන් සභාවේ ව්‍යුහය සහ පාලනය**

2.1. සංවිධාන ව්‍යුහය
2.2. කොමිෂන් සභාවේ සංයුතිය
2.3. කාර්ය මණ්ඩලයේ සංයුතිය
2.4. පරිශ්‍රය (ප්‍රවේශවීමේ හැකියාව)
2.5. කාර්යය ඉටුකිරීමේ ක්‍රමවේද
2.6. ආයතනික සංවර්ධනය
2.6.1. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උප කාර්යාල දෙකක් පිහිටුවීම
2.6.2. ජාත්‍යන්තර සබඳතා අංශයක් ස්ථාපනය කිරීම
2.6.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකයක් ස්ථාපනය කිරීම

**3 වැනි පරිච්ඡේදය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංඛ්‍යාලේඛන**

3.1. ලැබූ පැමිණිලිවලට අදාළ සංඛ්‍යාලේඛන
3.2. 2023 වර්ෂය තුළ නිමාකළ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යාලේඛන
3.3. නිර්දේශ
3.4. අධීක්ෂණ චාරිකා

**4 වැනි පරිච්ඡේදය: මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පැවරී ඇති බලය**

4.1. අර්බුදකාරී වාතාවරණයන්හි දී මානව හිමිකම් ආරක්ෂා කිරීම

4.2. කඩිනම් ප්‍රතිචාර
*4.2.1.*කඩිනම් ප්‍රතිචාර ඒකකය (RRU)
*4.2.2.*සභාපතිවරයාගේ කාර්යාලය මගින් සිදුකරන මැදිහත්වීම්
4.3. උපදේශක කාර්යයන්
*4.3.1.*ජාතික නීතිවලට අදාළව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
*4.3.2.*ප්‍රතිසංස්කරණ සඳහා අනෙකුත් සහාය
*4.3.3.*ජාත්‍යන්තර ප්‍රමිති අපරානුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීම
4.4. අධීක්ෂණ කාර්යයන්
*4.4.1.*නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම
*4.4.2.* රඳවා ගැනීමේ ස්ථාන සහ සත්කාර නිවාස අධීක්ෂණය
*4.4.3.*එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවල සේවය සඳහා ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා පිරිස් නියුක්ත කරවීම පිළිබඳව පරික්ෂාකාරීව සලකා බැලීම
*4.4.4.* OPCAT යටතේ ජාතික නිවාරක යාන්ත්‍රණය
*4.4.5.*බන්ධනාගාර පිළිබඳව සිදුකළ ජාතික අධ්‍යයනයේ ප්‍රතිඵලවල ප්‍රගතිය
4.5. විමර්ශන
*4.5.1.*ලැබී ඇති පැමිණිලි පිළිබඳව
*4.5.2.*මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් ආරම්භ කරන විමර්ශන (suo motu interventions)
4.6. අධ්‍යාපනික හා කොමිෂන් සභාව ප්‍රජාවට සමීපස්ථ වීමේ කාර්යයන්
මානව හිමිකම් සම්බන්ධිත සම්මතයන් හා ගැටලු පිළිබඳව දැනුවත්බව ඉහළ නැංවීම
අ) ජාත්‍යන්තර සැමරුම් දින උත්සවාකාරයෙන් සැමරීම
ආ) විවිධ අවධානිත කණ්ඩායම් සඳහා පුහුණු සහ සාකච්ඡා
ඇ) උපදේශනය
*4.7.* මාධ්‍ය සමඟ සම්බන්ධතාවය
සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය හා ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය සමඟ කටයුතු කිරීම
මාර්ගගත වේදිකා භාවිතය
*4.8.* සිවිල් සමාජය සමඟ සම්බන්ධතාවය
ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධිකරණ කමිටු
මානව හිමිකම් සඳහා ප්‍රජා කාර්යසාධක බලකායන් **(CTF4HR)**
තේමාත්මක උප-කමිටුවල සාමාජිකයන් වශයෙන් සිවිල් සංවිධාන නියෝජිතවරුන්
සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන විවිධ අවස්ථාවන් සඳහා සහභාගිත්වය
සිවිල් සමාජ සංවිධාන සඳහා පුහුණුව

**5 වැනි පරිච්ඡේදය: තේමාත්මක මැදිහත්වීම්**
5.1. තේමාත්මක උප කමිටු
5.2. පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් මැදිහත්වීම්
*5.2.1.*අත්අඩංගුවේදී සිදුවන මරණ සහ නීති විරෝධී ඝාතන
*5.2.2.*වධහිංසා පැමිණවීම
*5.2.3.*සාමකාමී ලෙස රැස්වීමේ අයිතිය

*5.2.4.*ප්‍රකාශනයේ නිදහස
*5.2.5.*සුළුතර අයිතිවාසිකම්
*5.2.6.*LGBTIQ අයිතිවාසිකම්
*5.2.7.*ළමා අයිතිවාසිකම් සහ අධ්‍යාපනයේ අයිතිය
*5.2.8.*සෞඛ්‍ය අයිතිය
*5.2.9.*ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්
*5.2.10.*වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්
*5.2.11.*ආදිවාසීන්ගේ අයිතිවාසිකම්
*5.2.12.*ජීවනෝපාය සඳහා අයිතිය

6 **වැනි පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගීතාවය**
6.1. ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම
6.2. ජාත්‍යන්තර ආයතනවලට වාර්තා සහ ප්‍රකාශ ඉදිරිපත් කිරීම
6.3. කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම
6.4. ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයන් සමඟ වෙනත් සහයෝගිතා
*6.4.1.*ද්විපාර්ශ්වික රැස්වීම්
*6.4.2.*විදේශ අරමුදල් ලැබීම්

7 **වැනි පරිච්ඡේදය: මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය කටයුතු**
7.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්
*7.1.1.* දේශීය පුහුණු අවස්ථා
*7.1.2.* ජාත්‍යන්තර වැඩසටහන්
7.2. සේවා නියුක්තිය සහ පුරප්පාඩු
7.3. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

**පරිශිෂ්ට**

පරිශිෂ්ටය 1: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ස්ථාන - සිතියම
පරිශිෂ්ටය 2: නිර්දේශ ලැයිස්තුව
පරිශිෂ්ටය 3: විධිමත් පැමිණිල්ලකින් තොරව වුවද මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව විමර්ශනය කිරීම

# 1 වැනි පරිච්ඡේදය: කොමිෂන් සභාව පිළිබඳව


1.1. කොමිෂන් සභාව පිළිබඳ කෙටි විග්‍රහයක්
  1.1.1. දැක්ම
  1.1.2. මෙහෙවර
  1.1.3. හරයාත්මක වටිනාකම්
  1.1.4. ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍ර
  1.1.5. කොමිෂන් සභාවේ නිල ලාංඡනය
1.2. පැවරී ඇති බලයේ ස්වභාවය සහ විෂය පථය
1.3. පිහිටුවීම සහ ස්වාධීනත්වය

## 1.1.කොමිෂන් සභාව පිළිබඳ කෙටි විග්‍රහයක්

### 1.1.1. දැක්ම

විවිධත්වය පිළිගනු ලබන සහ සැමගේ මානව හිමිකම්වලට ගරු කරන සමාජයක්.

### 1.1.2. මෙහෙවර

ජනතාවගේ ස්වාධිපත්‍යය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදය තුළ මානව අයිතිවාසිකම්, මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය සහ සුරැකීම උදෙසා ශ්‍රී ලංකාව තුළ නායකත්වය ලබාදීම.

### 1.1.3. හරයාත්මක වටිනාකම්

- මානව අභිමානය සඳහා ගරුත්වය
- විධිධත්වය සඳහා ගරු කිරීම
- සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම
- සාමය, සත්‍යය සහ සාධාරණත්වය
- ස්වාධීනත්වය
- වගවීම
- සේවය
- නිහතමානිත්වය
- අවංකත්වය
- විනිවිදභාවය

### 1.1.4. ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍ර

කොමිෂන් සභාවේ ක්‍රමෝපායික මෙහෙයුම්හි අවධානිත ක්ෂේත්‍ර වනුයේ:

- විශේෂයෙන් දුගී සහ වෙනස්ව සැලකීමට බඳුන් වූ පිරිස් ද ඇතුළුව සියලුම ජනතාවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ එහි සේවා වෙත ප්‍රවේශතාවය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ සහ එහි වැඩසටහන් හා සේවා ඔස්සේ ඒකාබද්ධ කිරීම.
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ සහ එහි වැඩසටහන් හා සේවා ඔස්සේ විවිධත්වය හඳුනාගැනීම සහ ඒ සඳහා ගරුකිරීම.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වැදගත් ක්‍රමෝපායික අවධානිත ක්ෂේත්‍ර වනුයේ:

- ශාරීරික වධහිංසා පමුණුවාලීම/ අත්අඩංගුවේ දී සිදුවන ප්‍රචණ්ඩත්වය
- සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපන, සෞඛ්‍ය සහ ඉඩම් පිළිබඳ අයිතිවාසිකම් ද ඇතුළුව ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලු
- සුළු ජාතිකයන්ගේ අයිතිවාසිකම්
- උඩරට දමිළ සහ වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම්
- ආපදා කළමනාකරණය සහ නැවත යථා තත්ත්වයට පැමිණීම
- ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම්
- සමරිසි, සමලිංගික, සංක්‍රාන්තික ලිංගික, අන්තර් ලිංගික පුද්ගලයන්ගේ අයිතිවාසිකම්
- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්
- සිරකරුවන් හා රැඳවියන්ගේ අයිතිවාසිකම්

### 1.1.5. කොමිෂන් සභාවේ නිල ලාංඡනය

ජාතික මට්ටමේ දී මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික මානව හිමිකම් ආයතනයෙහි වගකීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිල ලාංඡනය මගින් පෙන්නුම් කෙරේ. මානව වර්ගයේ සජීවිභාවය සහ නිර්මාණශීලිත්වය එම ලාංඡනයේ නිල් වර්ණය මගින් පිළිබිඹු කෙරේ. ආරක්ෂාව සහ ආරක්ෂාව සඳහා පියවර ගැනීම පිළිබඳව දෙඅත් මගින් හැඟවීමක් කෙරේ. මානව හිමිකම්වල විශ්වීයබව සහ ජාත්‍යන්තර තලයේ දී ඒ සඳහා ලබාදී ඇති ආරක්ෂාව ලෝක ගෝලය මගින් නිරූපණය වේ. ජාතික මට්ටමේ දී මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පියවර ගැනීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකාවේ සිතියම මගින් පිළිබිඹු වේ. කාන්තාවකගේ, පුරුෂයෙකුගේ සහ ළමයෙකුගේ රූප මගින් සංකේතවත් කරනුයේ සැමට සමාන ආකාරයෙන් මානව හිමිකම් ආරක්ෂාව ලැබිය යුතු බව යි.

## 1.2. පැවරී ඇති බලයේ ස්වභාවය සහ විෂය පථය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යනු රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන කොමිෂන් සභාවකි. ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සමඟ අනුකූලවීම සහතික කිරීම සඳහා ද කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැවරී ඇති බලයෙන් බැහැර වී ඇති සුවිශේෂී අයිතිවාසිකම් නොමැත. මූලික අයිතිවාසිකම් සහ මානව අයිතිවාසිකම්වලට අනුකූලව කොමිෂන් සභාවෙහි නීතිමය බල අධිකාරිය පනත මගින් හඳුනාගෙන තිබේ. විමර්ශන හා නීති සම්පාදනය සහ පරිපාලන නියෝග සහ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමේ දී මූලික වශයෙන් පැවරී ඇති බලය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති හරයාත්මක වශයෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වශයෙන් සැලකෙන මූලික අයිතිවාසිකම්වලට සීමා වේ. එසේ වුව ද, ජාතික නීති සහ පරිපාලන පියවර සහතික කිරීම පිණිස ගතයුතු පියවරවලට අදාළව රජය වෙත නිර්දේශ ලබාදීම වශයෙන් කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රමුඛතම බලය වනුයේ මානව හිමිකම් පැමිණිලි වන අතර, මෙය සියලු ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් හා ප්‍රමිති දක්වා ව්‍යාප්ත වේ.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කර්තව්‍යයන් (පනතේ 10 වැනි වගන්තිය යටතේ දක්වා ඇති පරිදි) වනුයේ:

- මූලික අයිතිවාසිකම්වලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අරමුණින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස කාර්යපටිපාටි සම්බන්ධයෙන් වන පැමිණිලි පිළිබඳව විභාග කිරීම සහ විමර්ශනය කිරීම;
- උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට ඉතා ආසන්න මූලික අයිතිවාසිකම්වලට අදාළ පැමිණිලි පිළිබඳ විභාග කිරීම සහ විමර්ශනය කිරීම සහ සාමදාන කිරීම සහ බේරුම් කිරීම ඔස්සේ ඒවා විසඳීම සඳහා තීරණ ලබාදීම;
- මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ නීතිමය හා පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සම්පාදනය කිරීමේ දී රජය වෙත උපදෙස් සහ සහාය ලබාදීම;
- ජාතික නීති සහ පරිපාලනමය පියවර ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් හා ප්‍රමිතිවලට අනුකූලබවට සහතික කිරීම පිණිස ගතයුතු පියවර සම්බන්ධයෙන් රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍රවල ප්‍රකාශවලට අත්සන් තැබීමේ සහ පිළිගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ
- මානව අයිතිවාසිකම්වලට අදාළව දැනුවත් කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපනයක් ලබාදීම.

මෙම ව්‍යවස්ථාපිත කර්තව්‍යයන් ඉටුකර ගෙනයෑම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත බලතල පැවරී ඇත (පනතේ 11 වැනි වගන්තිය යටතේ දක්වා ඇති පරිදි);

- උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට ඉතා ආසන්න මූලික අයිතිවාසිකම් පිළිබඳ විමර්ශනය කිරීම;

- කොමිෂන් සභාව විසින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරන සංඛ්‍යාවකින් පළාත් මට්ටමින් එසේ යම් සංඛ්‍යාවකින් උප කමිටු පත්කිරීම;
- උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට ඉතා ආසන්න මූලික අයිතිවාසිකම්වලට අදාළව යම් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතුවලට, එකී අදාළ අධිකරණයේ අවසරය සහිතව මැදිහත්වීම;
- අධිකරණ නියෝගයක් හෝ අන්‍යාකාරයකින් හෝ රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභසිද්ධිය, ඔවුන් එසේ රඳවාගෙන සිටින ස්ථානවලට නිසි පරිදි සිදුකරන පරීක්ෂා කිරීම් ඔස්සේ අධීක්ෂණය කිරීම සහ ඔවුන් එසේ රඳවාගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන නිර්දේශ ඉදිරිපත් කිරීම;
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන යම් කරුණකට අදාළව, කොමිෂන් සභාව විසින් ගත යුතුබවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරනු ලබන පියවර ගැනීම;
- පර්යේෂණ සිදුකිරීම, සහ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම ඔස්සේ මානව හිමිකම් පිළිබඳ දැනුවත්බව ප්‍රවර්ධනය කිරීම හා එසේ සිදුකරන පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම හා බෙදා හැරීම;
- අතෘප්තියට පත් වූ තැනැත්තෙකු හෝ අතෘප්තියට පත් වූ තැනැත්තෙකු වෙනුවෙන් කටයුතු කරන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සිදුකිරීමේ දී ඔහු විසින් සාධාරණ අයුරින් දරන ලද වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීම;
- කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දෑ සිදුකිරීම.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය මගින් ප්‍රකාශ කොට පිළිගෙන අයිතිවාසිකමක් වශයෙන් 'මානව හිමිකමක්' ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 33 වැනි වගන්තිය යටතේ අර්ථ නිරූපණය කර තිබේ. එබැවින්, ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ පනත් කෙටුම්පතෙහි පිළිගෙන ඇති සිවිල්, දේශපාලනික, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සමස්තය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය යටතේ ආවරණය වේ.

## *1.3. පිහිටුවීම සහ ස්වාධීනත්වය*

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත යටතේ මෙම කොමිෂන් සභාව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නීතිමය පදනම සහ මෙහෙයුම් ප්‍රතිපත්ති මෙම පනත මගින් දක්වා තිබේ. ශ්‍රී

ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාව යටතේ වන උපලේඛනයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් පිළිගෙන තිබේ. එබැවින් මෙම කොමිෂන් සභාව නීති සම්පාදනය කර එමගින් ස්ථාපනය කර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔස්සේ ස්ථාපනය කිරීම තහවුරු කර තිබේ. කොමිෂන් සභාව වගවිය යුත්තේ පාර්ලිමේන්තුව වෙත පමණි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් පත්කරනු ලැබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකුම පත්කරනු ලබන්නේ ඔවුන්ගේ පුද්ගලික මට්ටමින් මිස යම් විශේෂ ආයතනයක සාමාජිකයන් හෝ නියෝජිතවරුන් වශයෙන් නොවේ. ව්‍යවස්ථාදායක සභාව යනු 2022 වර්ෂයේ දී 21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීමත් සමඟින් නැවත ස්ථාපනය කරන ලද ප්‍රධාන පත්වීම් ලබාදීම නිර්දේශ කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බල ගැන්වී ඇති බහු-පාක්ෂික සභාවකි. ස්වාධීන කොමිෂන් සභා සඳහා සිදුකරන පත්වීම්වලට අදාළව විධායක ජනාධිපති වෙත කේන්ද්‍රගතව පැවති බලය සඳහා විසඳුමක් මෙම සංශෝධනය මගින් අපේක්ෂා කෙරිනි. එබැවින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය එහි පත්කිරීමේ ක්‍රියාවලිය ඔස්සේම ප්‍රමුඛව සහ අන් සියලු කාර්යයන්වලට පෙර සහතික කර තිබේ.

පනත ප්‍රකාරව, කොමසාරිස්වරු වසර තුනක කාලසීමාවක් සඳහා ධූරය දැරිය යුතු අතර නැවත පත්කිරීම සඳහා ද සුදුසුකම් ලබති. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයන් අත්තනෝමතික අයුරින් ඉවත් කිරීම වැළැක්වීම සඳහා වන විධිවිධාන ඇතුළත් වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්වයකාරවරුන් ඉවත් කිරීමට සමාන කාර්ය පටිපාටියක් ඔස්සේ පමණක් කොමසාරිස්වරු ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීමෙන් ඔවුන්ට සිය ධූර කාලය පිළිබඳ සුරක්ෂිතතාවයක් ලබාදේ. අනවශ්‍ය බලපෑම් හෝ දේශපාලනික අනියම් විපාක හෝ අත්තනෝමතික අයුරින් ඉවත් කිරීම පිළිබඳ බියකින් තොරව කොමිෂන් සභාවේ සාමාජිකයන් වෙත සිය රාජකාරී ඉටුකළ හැකිබවට මෙම සුරක්ෂිතතාවය ඔස්සේ සහතික කෙරේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 4(1)(අ)(ii) වැනි වගන්තිය යටතේ ළබැඳියාවන් අතර ගැටුම් වළක්වාලීම සඳහා හැකියාව ලබාදේ. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විසින් සිය ධූරයේ කාර්යයන්ට බාහිරව, යම් ගෙවීම් ලබන සේවා නියුක්තියක නිරතවුවහොත්, කතානායකවරයා සහ විපක්ෂ නායකවරයා වෙතින් විමසා අග්‍රාමාත්‍යවරයා විසින් ලබාදෙන නිර්දේශ මත පදනම් ජනාධිපතිවරයාගේ මතය අනුව කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිය කාර්යභාරය ඉටුකිරීමේ දී ළබැඳියාවන් අතර ගැටුමක් ඇතිවුවහොත් එකී

සාමාජිකයා කොමිෂන් සභාවෙන් ඉවත්කළ හැකි බවට එමගින් විධිවිධාන සලස්වා තිබේ.

තව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායක සභාව විසින් අනුමත කර ඇති පත්කිරීමේ ක්‍රියාවලිය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස වූ තනතුරුවලට නම්කරන තැනැත්තන්ට සහ අයදුම්කරුවන්ට ළබැඳියා අතර ගැටුම් පවතී නම් ඒවා  අනාවරණය කිරීම ව්‍යවස්ථාදායක සභාව විසින් අපේක්ෂා කෙරේ.  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාව ප්‍රකාරව, කොමිෂන් සභාවට පත්කරනු ලබන ස්වාධීන සාමාජිකයෙකු වශයෙන් සිය රාජකාරිවලදී ගැටුම් හෝ ගැටුම් ඇතිවිය හැකිබවට සාධාරණ වශයෙන් තේරුම්ගත හැකි ආයෝජන, කොන්ත්‍රාත්, බැඳීම්, වගකීම්, පොරොන්දු, පැවරුම්, හෝ ඔවුන් හෝ ඔවුන්ගේ කලත්‍රයන් හෝ දරුවන් සතු සබඳතා ආදිය මීට ඇතුළත් ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ අනෙකුත් නිලධාරීන් සිය නිල තත්ත්වය අනුව ගනු ලබන පියවර සඳහා නෛතික වගකීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 26 (1) වැනි වගන්තිය යටතේ ඔවුන්ට ආරක්ෂාව හිමි වේ. ‘කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හෝ කොමිෂන් සභාවට සහායවීම පිණිස පත් කරන ලද යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව හෝ අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් හැර කොමිෂන් සභාවට වෙනත් යම් ආකාරයකින් සහාය වන වෙනත් යම් තැනැත්තෙකුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය’ යනුවෙන් එහි දක්වා ඇත.

## 2 වැනි පරිච්ඡේදය: කොමිෂන් සභාවේ ව්‍යුහය සහ පාලනය

2.1. සංවිධාන ව්‍යුහය
2.2. කොමිෂන් සභාවේ සංයුතිය
2.3. කාර්ය මණ්ඩලයේ සංයුතිය
2.4. පරිශ්‍රය (ප්‍රවේශවීමේ හැකියාව)
2.5. කාර්යය ඉටුකිරීමේ ක්‍රමවේද
2.6. ආයතනික සංවර්ධනය
  2.6.1. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උප කාර්යාල දෙකක් පිහිටුවීම
  2.6.2. ජාත්‍යන්තර සබඳතා අංශයක් ස්ථාපනය කිරීම
  2.6.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකයක් ස්ථාපනය කිරීම


## 2.1.සංවිධාන ව්‍යුහය


සංවිධානයේ කේන්ද්‍රීය වශයෙන් පවතිනුයේ සභාපති සහ කොමසාරිස්වරුන්ගෙන් සමන්විත කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය යි. කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිත වශයෙන් පැවරී ඇති බලය ක්‍රියාත්මක කිරීම සහා මෙම මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබේ. සෑම මාසයකදී ම කොමිෂන් සභාව් රැස්වීම් පවත්වනු ලැබේ.

වර්තමානයේ දී, 148 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සමගින් කොමිෂන් සභාව විසින් සිය කාර්යයන් ඉටු කරනු ලැබේ. පරීක්ෂණ සහ විමර්ශන (I&I), අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් (ED&SP), පර්යේෂණ සහ අධීක්ෂණ (R&M), පාලන සහ මූල්‍ය (A&F) සහ ජාත්‍යන්තර සබඳතා (IR) වශයෙන් කොමිෂන් සභාවේ අංශ 05කි. අධ්‍යක්ෂවරයෙකු විසින් සෑම අංශයකම ප්‍රධානත්වය දරන අතර සභාපති සහ/හෝ කොමසාරිස්වරයෙකු/ කොමසාරිස්වරුන් විසින් අධීක්ෂණ කාර්යය සිදුකරනු ලැබේ.

මීට අමතරව, කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය කාර්යාල 10ක් (අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුනේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය සහ වවුනියාව) සහ උප-කාර්යාල 04ක් (කිලිනොච්චිය, මන්නාරම, හැටන් සහ පුත්තලම) ඔස්සේ සිය කාර්යයන් ඉටු කරනු ලැබේ (පරිශිෂ්ටය 1 බලන්න). සෑම ප්‍රාදේශීය කාර්යාලයකම මූලිකත්වය ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයෙකු විසින් දරන අතර සභාපති සහ/හෝ කොමසාරිස්වරයෙකු/ කොමසාරිස්වරුන් විසින් අධීක්ෂණ කාර්යය සිදුකරනු ලැබේ. 2023 වර්ෂයේ දී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සබරගමු පළාත වෙත ද සිය ජාලය පුළුල් කරමින් රත්නපුරයේ නව උප-කාර්යාලයක් පිහිටුවා සිය කටයුතු ආරම්භ කරන ලදී. කොමිෂන් සභාව විසින් මානව හිමිකම් ආරක්ෂා කිරීමේ කටයුතු වැඩිකිරීමට සහ කොමිෂන් සභාවේ කාර්යයන් මහජනතාවට වඩාත් සමීප කරලීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වේ. බහුතරයක් වූ මහජනතාව කොමිෂන් සභාව වෙත ප්‍රවේශ වනුයේ ප්‍රාදේශීය කාර්යාල සහ උප-කාර්යාල ඔස්සේ ය. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය වශයෙන් වාසය කරන ජනතාව අතර හුදු සම්බන්ධයක් වීම අභිබවා යමින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය ඵලදායි අයුරින් ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල සහ උප-කාර්යාල විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. පැමිණිලි භාර ගැනීම, හිමිකම් උල්ලංඝනය වීමේ චෝදනාවලට එරෙහිව විමර්ශන සිදුකිරීම, මානව හිමිකම් නීතිවිරෝධී ආකාරයෙන් උල්ලංඝනය කිරීමේවලට එරෙහිව උපදෙස් ලබාදීම, ආරවුල් විසඳීමෙහිලා බේරුම්කරණ කටයුතු, උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් නිර්දේශ ලබාගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම, අධීක්ෂණ කටයුතු සිදුකිරීම, ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීම් ඉහළ නැංවීමේ කටයුතු සිදුකිරීම, සිවිල් සංවිධාන සමඟ සහයෝගීතාවය සහ සම්බන්ධිකරණය පවත්වා ගැනීම ඇතුළුව පූර්ණ පරාසයක කටයුතු රාශියක් මෙම කාර්යාල විසින් සිදුකරනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය






ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලවල සංවිධාන ව්‍යුහය

## *2.2. කොමිෂන් සභාවේ සංයුතිය*

ශ්‍රී ලංකාව බහු සංස්කෘතික, බහුවාර්ගික, සහ බහු ආගමික සමාජයක් සහිත රටකි. ශ්‍රී ලාංකික සමාජය තුළ සිටින බහුවිධ ප්‍රජාවන්ගේ නියෝජිතයා වශයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ (3) ව්‍යවස්ථාව මඟින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංයුතියේ බහුත්ව ස්වභාවය සහතික කර තිබෙන අතර එහි මෙසේ දක්වා තිබේ: *'මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත්කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත්කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම (ව්‍යවස්ථාදායක) සභාවේ කාර්යය වන අතර, ඒ නිර්දේශවලින්* ***ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිබිඹු වන*** *බවට වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය'* (ඒ බව අවධාරණය කර තිබේ).

මීට අමතරව, කොමිෂන් සභාව '*මානව හිමිකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තන් අතුරින් තෝරාගනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු*' බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 3 (1) වගන්තිය මගින් දක්වා තිබේ. එසේම, *'...යටතේ නිර්දේශ කිරීමේ දී සුළු ජාතීන් කොමිෂන් සභාවේ නියෝජනය වීමේ අවශ්‍යතාවය ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ... විසින් සැලකිල්ල යොමුකළ යුතු ය'* වශයෙන් එකී පනතේ 3 (3) වගන්තිය මගින් දක්වා ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වර්තමාන සංයුතිය මගින් බහුත්ව ස්වභාවය, විවිධත්වය සහ සියලු දෙනා ඇතුළත්වීම යන මූලධර්ම පිළිබිඹු වේ. එහි වර්තමාන සභාපති වන විනිසුරු ලක්ෂ්මන් දෙහිදෙණිය මහතා දශක කිහිපයක වෘත්තිමය ජීවිතය තුළින් බොහෝ අත්දැකීම් සපුරාලූ විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකි. කොමිෂන් සභාව වර්තමානයේ දී විනිසුරු දෙහිදෙණිය මහතාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ. මහාචාර්ය ෆර්සානා හනීෆා මහත්මිය යනු ස්ත්‍රී පුරුෂ භාවය හා ආගම ඇතුළුව මානව හිමිකම් පිළිබඳ තේමා සහ විෂය ප්‍රස්තුත පරාසයක් ආවරණය කරන රාජකාරි කටයුතු සහ අත්දැකීම් සහිත විද්වතෙකි. ඇය විසින් කොමිෂන් සභාවේ පර්යේෂණ සහ අධීක්ෂණ අංශයේ කටයුතු අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යාපනය සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ පිළිබඳ කීර්තිමත් පසුබිමක් සහිත මහාචාර්ය තායියාමුතු තානරාජ් මහතා විසින් අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශය අධීක්ෂණය කරනු ලැබේ. නීතිඥවරයෙකු වන නිමල් පුංචිහේවා මහතා ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිසමේ හිටපු සභාපතිවරයෙකු වන අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු අතිරේක ලේකම්වරයෙකු ද වේ. එබැවින් මොහු සතුව ස්වාධීන ආයතනවල රාජකාරි ඉටුකිරීම සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් පවතී. මොහු විසින් පරීක්ෂණ සහ විමර්ශන අංශය අධීක්ෂණය කරනු ලැබේ. ආචාර්ය ගෙහාන් ගුණතිලක මහතා පර්යේෂණ, නඩු කටයුතු, සහ සිවිල් සංවිධානවල සහයෝගීතාවය සහිතව කටයුතු කිරීම පිළිබඳ වසර ගණනාවක අත්දැකීම් සහිත ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ විශේෂයෙන් කටයුතු කරන නීතිඥවරයෙකි. මොහු විසින් ජාත්‍යන්තර

සබඳතා අංශයේ කටයුතු අධීක්ෂණය කෙරේ. ඒ අනුව, සෑම සාමාජිකයෙකුටම ජාතික මෙන්ම ජාත්‍යන්තර යන මට්ටම් දෙකෙහිම, මානව හිමිකම් ක්ෂේත්‍රයේ පුළුල් බුද්ධිමය සහ ප්‍රායෝගික පලපුරුද්ද සතු ය.

මෙම සංයුතිය ඔස්සේ ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය සහ ආගමික විවිධත්වය පහත පරිද්දෙන් පිළිබිඹු වේ:

| නම | ස්ත්‍රී/ පුරුෂබව | ජාතිය | ආගම |
|---|---|---|---|
| 1. විනිසුරු ලක්ෂ්මන් දෙහිදෙණිය මහතා | පුරුෂ | සිංහල | බෞද්ධ |
| 2. මහාචාර්ය ෆර්සානා හනීෆා මිය | ස්ත්‍රී | මුස්ලිම් | ඉස්ලාම් |
| 3. මහාචාර්ය තායියාමුතු තනරාජ් මහතා | පුරුෂ | දෙමළ | හින්දු |
| 4. නිමල් පුංචිහේවා මහතා | පුරුෂ | සිංහල | බෞද්ධ |
| 5. ආචාර්ය ගෙහාන් ගුණතිලක මහතා | පුරුෂ | සිංහල | කතෝලික |

## *2.3. කාර්ය මණ්ඩලයේ සංයුතිය*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කාර්ය මණ්ඩලය අනුයුක්ත කරගැනීම සම්බන්ධයෙන් සුවිශේෂී ව්‍යවස්ථාපිත සීමාකිරීමක් පනවා නොමැත. මුදල් අමාත්‍යාංශයේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ බඳවා ගැනීමේ පටිපාටියකට අනුව කාර්ය මණ්ඩල තනතුරු ඇති කිරීම සහ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකරනු ලැබේ. සියලු සම්මුඛ පරීක්ෂණ, තෝරාගැනීම් සහ බඳවා ගැනීම් කොමිෂන් සභාව විසින් සෘජුවම සිදුකරනු ලැබේ. රජය විසින් පොදුවේ සියලු බඳවා ගැනීම් අත්හිටුවීම සඳහා සිදුකර තිබූ නියෝගය මධ්‍යයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය විසින් කොමිෂන් සභාව වෙත නීති නිලධාරීන් සහ මානව සම්පත් නිලධාරීන් බඳවා ගැනීම සඳහා විශේෂ අනුමැතියක් ලබාදීමට තීරණය කර තිබුණි. එමගින් බාධාවලින් තොරව අඛණ්ඩව කොමිෂන් සභාවේ කටයුතු සිදුකිරීම සහතික කරන අතර, සේවාවල හදිසි අවශ්‍යතාවය ද සැලකිල්ලට ගනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 25 වැනි වගන්තියට අනුව තාවකාලිකව යම් කාල සීමාවක් සඳහා රජයේ නිලධාරීන් ද්විතීයන පදනමින් ඉල්ලා සිටීමට, සහ විශේෂ තත්ත්වයන් යටතේ ස්ථිර පදනමින් පත්කර ගැනීමට අවසර හිමි වේ. දැනට රාජ්‍ය අංශයේ නිලධාරීන් පහළොස් දෙනෙකු ද්විතීයන පදනමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පත් කර ඇති අතර, එය සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 10.1ක ප්‍රතිශතයකි. රාජ්‍ය අංශයෙන් ද්විතීයන පදනමින් මුදාහරින තැනැත්තෙකුගෙන් පිරවිය යුතු ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකම තනතුර වනුයේ අධ්‍යක්ෂ පාලන සහ මූල්‍ය තනතුර ය.

සිය කාර්ය මණ්ඩලය තුළ බහුත්ව ස්වභාවය, විවිධත්වය සහ සියලු දෙනා ඇතුළත්වීම යන මූලධර්ම වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කැපවී සිටී. සියලු ජන ප්‍රජාවන් ඔස්සේ ප්‍රාදේශීය හා ජාතික නියෝජනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 ජූනි මාසයේ දී නීති නිලධාරී සහ මානව හිමිකම් නිලධාරී තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන ලදී. බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂබව, ජාතිය සහ ආගම සම්බන්ධිත විවිධත්වය සේම ආබාධ සහිත තැනැත්තන් නියෝජනය වීම සම්බන්ධයෙන් ද විශේෂ අවධානය යොමු කරනු ඇත. කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී පුරුෂ සහ වාර්ගික ව්‍යාප්තිය පහත පරිදි වේ:

| කාණ්ඩ | සමස්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල) | ප්‍රතිශතය |
|---|---|---|
| පුරුෂ | 82 | 55% |
| ස්ත්‍රී | 67 | 45% |

ස්ථිර කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී/ පුරුෂ බව අනුව ව්‍යාප්තිය

| කාණ්ඩ | සමස්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් (ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල) | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 116 | 77.9% |
| දෙමළ | 24 | 16.1% |
| මුස්ලිම් | 09 | 6.0% |

ස්ථිර කාර්ය මණ්ඩලයේ වාර්ගිකත්වය අනුව ව්‍යාප්තිය

## *2.4. පරිශ්‍රය (ප්‍රවේශවීමේ හැකියාව)*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන පරිශ්‍රය වනුයේ කොළඹ 04, ආර්.ඒ. ද මෙල් මාවතේ අංක 14 දරන ස්ථානයේ පිහිටි මහල් 07කින් සමන්විත ප්‍රධාන කාර්යාලය යි.

කොමිෂන් සභාව පොදු ජනතාව වෙත සමීප කරවීමේ සහ ශ්‍රී ලංකාව පුරා පුළුල් ආවරණයක් සහතික කරලීමේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දැනට ඇති කැපවීමේ අංගයක් වශයෙන් විශේෂයෙන් 2009 වර්ෂයේ අවසන් වූ ශ්‍රී ලංකාවේ යුද ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශ ද ඇතුළුව ප්‍රධාන ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල සහ උප-කාර්යාල ජාලයක් ස්ථාපනය කර තිබේ (යථෝක්ත 2.1 කොටස බලන්න). මෙම ක්‍රියාමාර්ග ඔස්සේ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ විශේෂයෙන් සුළු වාර්ගික ප්‍රජාවන් ඇතුළුව සියලුම ප්‍රජාවන්

සඳහා එහි කාර්යය වඩාත් සමීප කරලීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඇති කැපවීම නැවත වෙරගැන්වී ඇත.

ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය හෝ උප-කාර්යාල වෙත පුද්ගලයන් වශයෙන් පැමිණ පැමිණිලි ඉදිරිපත් කිරීම, කොමිෂන් සභාවේ පැය 24 මුළුල්ලේ ක්‍රියාත්මක අංක 1996 දරන දුරකතනය ඔස්සේ සම්බන්ධ වීම, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ පැමිණිල්ල ඉදිරිපත් කිරීම (https://www.hrcsl.lk/make-a-complaint/complaint-form), හෝ විද්‍යුත් තැපැල හෝ දුරකතනය ඔස්සේ කොමිෂන් සභාව හෝ එහි විශේෂිත අංකයක් හෝ නිලධාරියෙකු සමඟ සම්බන්ධ වීම ඔස්සේ පොදු ජනතාවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල වෙත ප්‍රවේශය ලබාගත හැකි ය. විදුලි සෝපාන සහ රෝද පුටු ද ප්‍රධාන කාර්යාලය තුළ පවත්වාගැනීම තුළින් භෞතික ආබාධ සහිත තැනැත්තන්ට වුව ද, පහසු හා සුවපහසු ප්‍රවේශයක් සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය තුළ පහසුකම් සලස්වා ඇත.

පොදු ජනතාව අතුරින් ඕනෑම තැනැත්තෙකුට රාජ්‍ය භාෂා ද්විත්වයෙන් එක් භාෂාවකින් (සිංහල හෝ දෙමළ) හෝ නැතහොත් ඉංග්‍රීසි භාෂාවෙන් සිය පැමිණිලි ඉදිරිපත් කළ හැකි ය. පැමිණිලි ඉන් අනතුරුව පැමිණිලිකරු විසින් රුචිකත්වය දරන භාෂාවෙන් පවත්වාගෙන යන අතර, අදාළ අවස්ථාවල දී පැමිණිල්ල විභාග කරන අවස්ථාවේ දී සහභාගිවන පාර්ශවවලට වඩාත්ම පහසු භාෂාවෙන් පවත්වා ගෙන යනු ලැබේ.

## 2.5. කාර්යය ඉටුකිරීමේ ක්‍රමවේද

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2017-2019 සහ 2020-2022 කාල සීමාවන් සඳහා ක්‍රමෝපායික සැලසුම් ක්‍රියාත්මක කළ අතර, 2024-2026 කාල සීමාව සඳහා ද නව සැලසුමක් සකස් කරමින් සිටී. කොමිෂන් සභාව විසින් දැනට මෙම සැලසුම සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ඔස්සේ පහසුකම් සහාය ලබාගැනීමට ද සාකච්ඡා කරමින් සිටී. මෙම සැලසුමේ ප්‍රධාන අංග වශයෙන් ඇතුළත් වනුයේ යාවත්කාලීන කළ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය, SWOT විශ්ලේෂණයක්, අවදානම් අවම කිරීමේ ක්‍රමෝපාය, කොමිෂන් සභාවේ ක්‍රමෝපායික ප්‍රමුඛතා, ඉලක්ක, ක්‍රමෝපාය, ක්‍රියාකාරකම් හා ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළිබඳ කොටසක්, සහ වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුම් සකස් කරනුයේ කෙසේ ද පිළිබඳ කොටසකි.

- ### නියමිත කාලාන්තරවල දී පැවැත්වෙන රැස්වීම්

කොමිෂන් සභාවේ සාමාජිකයන් වර්තමානයේ දී සැලසුම්කරණ හා ක්‍රමෝපාය රැස්වීමක් සඳහා මාසයකට වරක් රැස්වෙන අතර, මින් පරිබාහිරව කොමිෂන් සභාවේ මණ්ඩලය ද මාසයකට වරක් රැස්වේ. සැලසුම්කරණ හා ක්‍රමෝපාය රැස්වීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් පමණක් රැස්වන අතර වැදගත්, හරයාත්මක හා ක්‍රියාවලි ආශ්‍රිත කරුණු පමණක් මෙහිදී සාමාන්‍යයෙන් සාකච්ඡා කෙරේ. කොමිෂන් සභාවේ මණ්ඩල රැස්වීමේ දී පරිපාලන සහ මූල්‍ය කරුණුවලට අදාළව

මෙන්ම වැදගත් වැඩසටහන් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ද විධිමත් තීරණ ගනු ලැබේ. සාමාජිකයන් සමඟ සාකච්ඡා කර කොමිෂන් සභාවේ ලේකම් විසින් මණ්ඩල සටහන් පිළියෙළ කරනු ලැබේ. ලේකම් සැමවිටම මේ සඳහා සහභාගී වන අතර අධ්‍යක්ෂවරු (අවශ්‍යතාවය අනුව) මෙම රැස්වීමට සහභාගී වනු ලැබේ.

- ක්‍රියාකාරී කණ්ඩායම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඓතිහාසික වශයෙන් හා සමස්තයක් වශයෙන් වෙනස්ව සැලකීමට හා කොන්වීම තුළින් පීඩාවට පත් ප්‍රජාවන්ට අදාළ ගැටලු පිළිබඳ අවධානය යොමුකරමින් තේමාත්මක උප-කමිටු පිහිටුවන ලදී. මෙම උප-කමිටුවල ප්‍රධානත්වය දරනුයේ කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් වන අතර, සිවිල් සමාජ සංවිධාන, ක්‍රියාකාරීන්, විශේෂඥයන් හා ශාස්ත්‍රඥයන් අතුරින් සාමාජිකයන් වන පිරිසගෙන් සමන්විත වේ. උප-කමිටුවල යොමුකිරීමේ අනුදේශ පහත පරිදි වේ: '1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 වැනි වගන්තිය යටතේ වන බලය පැවරීමට අදාළව ශ්‍රී ලංකා රජය විසින් සිදුකළ යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම සඳහා සෑම තේමාවකටම අදාළ නීතිමය අණපනත්, ප්‍රතිපත්ති සහ නිල පරිචයන් සමාලෝචනය කිරීම පිණිස. තව ද, ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ සඳහා අවශ්‍ය නියෝජනයන් සිදුකිරීමට අදාළ වන තේමා සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබාදීම ද උප-කමිටු වෙතින් අපේක්ෂා කෙරේ.'

කොවිඩ් -19 වසංගත තත්ත්වය සහ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන්, මෙම උප -කමිටු අඛණ්ඩව සිය කාර්යන්වල නියැලීම අභියෝගයට බඳුන්වූ අතර, මෙම උප-කමිටු ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවේ. එසේ වුව ද, කොමිෂන් සභාවේ වර්තමාන සාමාජිකයන් විසින් මෙම උප-කමිටු ක්‍රමය කඩිනමින් යළි පණ ගැන්වීමට සැලසුම් කරන අතර අලුතින් පත්කරනු ලබන උප-කමිටු නියමිත කාලාන්තරවලදී රැස්වීම සිදුකර සිය තේමාගත ක්ෂේත්‍රයට අදාළව දැනට පවතින ජාතික නීති අණ පනත් සහ නියෝග සම්බන්ධයෙන් සිය මතයන්, යෝජනා සහ දැක්ම හවුලේ බෙදාගැනීම සහතික කෙරේ.

## *2.6. ආයතනික සංවර්ධනය*

### *2.6.1. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උප කාර්යාල දෙකක් පිහිටුවීම*

වතු කම්කරු ප්‍රජාව සඳහා යුක්තිය වෙත ප්‍රවේශය *සහ කොමිෂන් සභාව වෙත ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම සඳහා* JURE *ව්‍යාපෘතිය මගින් ලබාදුන් මූල්‍ය සහයෝගිතාවය මත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රත්නපුර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල උප-කාර්යාල පිහිටුවීම මගින් එහි ප්‍රාදේශීය කාර්යාල ජාලය පුළුල් කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ උප-කාර්යාලය හැටන්හි පිහිටුවා ඇති අතර එය 2023.09.26 දිනැතිව ආරම්භ කරන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයේ උප-*

*කාර්යාලය 2023.12.01 දිනැතිව ආරම්භ කරන ලදී. දැනට මෙහෙයුම් තත්ත්වයේ ඇති මෙම උප-කාර්යාල සඳහා ව්‍යාපෘති සහකාරවරු දෙදෙනෙකු බඳවා ගන්නා ලදී.*

### 2.6.2. ජාත්‍යන්තර සබඳතා අංශයක් ස්ථාපනය කිරීම

ජාතික නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතිවලට අනුකූල බවට සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 (ඈ) (ඉ) වගන්තිවලට අනුව, කොමිෂන් සභාවට රජය වෙත උපදෙස් දීම සහ නිර්දේශ ලබාදීම සිදුකළ හැකි ය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා 2023 ජූනි මාසයේ දී ජාත්‍යන්තර සබඳතා අංශය පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන යන ද්විත්වය සඳහාම වාර්තා ඉදිරිපත් කිරීම; මෙම යාන්ත්‍රණ සමඟ සාධනීය සබඳතා ගොඩනැංවීම; සහ ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම්වල ප්‍රගමනය හා ආරක්ෂාව සඳහා තාක්ෂණික සහාය උපයෝගී කරගැනීම සඳහා මෙම අංශයට බලය පැවරී ඇත. ජාත්‍යන්තර සබඳතා අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ:

(අ) ජාත්‍යන්තර සම්මුති ආයතන වෙත අවශ්‍ය කරන වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම

(ආ) ජාත්‍යන්තර වගකීම් දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය පියවර ගැනීම පිණිස නිර්දේශ ලබාදීම

(ඇ) කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ සමඟ සම්බන්ධීකරණය කිරීම

### 2.6.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තුළ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකයක් ස්ථාපනය කිරීම

රට තුළ මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ බරපතල සිද්ධි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් ආරම්භ කරන පරීක්ෂණවලට (*suo motu* cases) අදාළව කාලානුරූපී ආකාරයෙන් ප්‍රතිකර්ම හා නිර්දේශ ලබාදීමේ අරමුණැතිව පරීක්ෂණ සහ විමර්ශන අංශය යටතේ 2023 වර්ෂයේ දී කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය (RRU) පිහිටුවන ලදී. පරීක්ෂණ සහ විමර්ශන අංශයේ කොමසාරිස්වරයාගේ සෘජු අධීක්ෂණය සහ එහි අධ්‍යක්ෂවරයාගේ නියෝග යටතේ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය ක්‍රියාත්මක වේ (වැඩිදුර විස්තර සඳහා 4.3 බලන්න).

# 3 වැනි පරිච්ඡේදය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංඛ්‍යාලේඛන


3.1. ලැබූ පැමිණිලිවලට අදාළ සංඛ්‍යාලේඛන
3.2. 2023 වර්ෂය තුළ නිමාකළ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යාලේඛන
3.3. නිර්දේශ
3.4. අධීක්ෂණ චාරිකා

## 3.1. පැමිණිලිවලට අදාළ සංඛ්‍යාලේඛන

සමස්තයක් ලෙස, 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි 9,714 ක් ලැබී ඇත. පසුගිය වර්ෂයේ එනම් 2022 වර්ෂයේ දී ලැබී ඇති 9,219ක් වූ පැමිණිලි සංඛ්‍යාවට සාපේක්ෂව, මෙය 5%ක වැඩිවීමකි. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත සමස්තයක් ලෙස මෙම පැමිණිලි සංඛ්‍යාව ලැබී ඇත. පසුගිය වර්ෂවල දී මෙන්ම, ඕනෑම තනි පැමිණිලි කාණ්ඩයකට අදාළව ලැබී ඇති ඉහළම පැමිණිලි සංඛ්‍යාව (2,253) එනම් මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 23%ක් ම ලැබී ඇත්තේ පුද්ගලික නිදහස උල්ලංඝනය වීම සම්බන්ධයෙනි. අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවාගැනීම් (පැමිණිලි 987), හිරිහැර කිරීම් (පැමිණිලි 560), අත්අඩංගුවට ගෙන සිටිය දි සිදුකර ඇති ශාරීරික වධහිංසා පමුණුවාලීම් ද ඇතුළුව ශාරීරික වධහිංසා සිදුකිරීම් (පැමිණිලි 546) පිළිබඳ පැමිණිලි ද ලැබී ඇත. සමස්තයක් ලෙස, පුද්ගලික නිදහසට අදාළව ලැබී ඇති පැමිණිලි, පෙර වර්ෂයේ අගයට (2,228) සමාන අගයකින් මෙම වර්ෂයේ ද වාර්තා විය.

පෙර වර්ෂයට පටහැනිව, 2023 වර්ෂයේ දී දෙවැනියට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තාවී ඇත්තේ සේවා නියුක්තියට අදාළවන අතර පසුගිය වර්ෂවල දී මේ සම්බන්ධයෙන් ලැබී තිබෙනුයේ රජයේ ආයතනවල කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් පවතින මන්දගාමී ස්වරූපයයි. 2023 වර්ෂයේ දී සේවා නියුක්තිය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 1,774ක් වන අතර, රජයේ ආයතනවල කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් පවතින මන්දගාමී ස්වරූපයට අදාළව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 1,686 කි. ඉන් පැමිණිලි 904ක් ම ලැබී ඇත්තේ පොලීසියට එරෙහිව වන අතර, 2022 වර්ෂයේ දී එසේ පොලීසියට එරෙහිව ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව 1,267 කි. තව ද, අනෙකුත් රජයේ ආයතනවල කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් පවතින මන්දගාමී ස්වරූපයට එරෙහිව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 782 කි.

සමස්ත පැමිණිලිවලින් 45%ක් එනම් පැමිණිලි 4,429 ක් ලැබී ඇත්තේ ප්‍රාදේශීය කාර්යාලවලට වන අතර, ඉතිරි 55% - එනම් පැමිණිලි 5,285 ක් සෘජුවම ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇත. 2022 වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 3,813ක් වන අතර, ඊට සාපේක්ෂව සැලකීමේ දී මෙම වර්ෂයේ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවේ යම් ඉහළ යෑමක් පෙන්නුම් කෙරේ.




**සෑම කාණ්ඩයකටම අදාළව 2022 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව සමඟ 2023 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවෙහි සංසන්දනය**

**<u>ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව</u>**
**<u>ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලිවල විස්තර - 2023</u>**


| ඉදිරිපත් කර ඇති පැමිණිලිවල ආකාරය | කලාපය | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | සමස්ත එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය/ කිලිනොච්චිය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව/ මන්නාරම | පුත්තලම | | | |
| **පුද්ගලික නිදහස** | 31 | 181 | 34 | 43 | 143 | 28 | 93 | 220 | 36 | 56 | 92 | 957 | 1296 | 2253 |
| (අ) වධහිංසා පමුණුවාලීම (ශාරීරික සහ මානසික) | 10 | 54 | 01 | - | 27 | 01 | 34 | 44 | 02 | 18 | 10 | 201 | 345 | 546 |
| (ආ) පහත් කොට සැලකීම | - | - | - | - | 16 | 01 | | 04 | 01 | - | - | 22 | - | 22 |
| (ඇ) කරදර හිරිහැර කිරීම | 04 | 13 | 10 | 28 | 38 | 09 | 42 | | 18 | 24 | 28 | 214 | 346 | 560 |
| (ඈ) තර්ජනය කිරීම | - | 04 | - | - | 31 | 02 | 06 | 30 | - | - | - | 73 | - | 73 |
| (ඉ) ලිංගික හිංසනය | - | - | - | - | - | - | - | - | - | - | 01 | 01 | 03 | 04 |
| (ඊ) අත්තනෝමතික ආකාරයෙන් අත්අඩංගුවට ගැනීම/ රඳවාගැනීම | 17 | 110 | 22 | 14 | 30 | 15 | 08 | 135 | 14 | 13 | 53 | 431 | 556 | 987 |
| (උ) රැඳවුම් භාරයේ සිටිය දී මියයෑම * | - | - | 01 | - | - | - | 03 | 02 | 01 | 01 | - | 08 | 16 | 24 |
| (ඌ) අධිකරණ ක්‍රියාවලින් බැහැරව | - | - | - | 01 | 01 | - | - | 01 | - | - | - | 03 | 12 | 15 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාතනය කිරීම* | | | | | | | | | | | | | | |
| (එ) සිරකරුවන්ගේ අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | 04 | - | - | - | 04 | 18 | 22 |
| අනෙකුත් සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් | 01 | 02 | - | 06 | 09 | - | - | - | 01 | 01 | - | 20 | 08 | 28 |
| සේවා නියුක්තිය | 62 | 97 | 80 | 66 | 50 | 41 | 147 | 117 | 22 | 38 | 74 | 794 | 980 | 1774 |
| අධ්‍යාපනය | 03 | 12 | 11 | 27 | 13 | 17 | 48 | 32 | 05 | - | 14 | 182 | 182 | 364 |
| රජයේ සුබසාධක සේවා | 05 | 05 | 05 | - | 11 | 04 | - | 13 | 02 | 02 | - | 47 | 16 | 63 |
| යටිතල පහසුකම් සහ උපයෝගිතා | 01 | - | 07 | - | 06 | - | 08 | 12 | - | 02 | - | 36 | 50 | 86 |
| ඡන්දදායකයන් ලියාපදිංචියට අදාළ පැමිණිලි | 50 | - | - | - | - | - | 01 | - | - | 02 | - | 53 | 20 | 73 |
| රජයේ ආයතනවල අක්‍රිය ස්වභාවය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි | 50 | 232 | 45 | 223 | 106 | 62 | 222 | 61 | 39 | 74 | 73 | 1187 | 499 | 1686 |
| (අ) පොලීසිය | 16 | 70 | 39 | 139 | 71 | 43 | 73 | 30 | 30 | 45 | 51 | 607 | 297 | 904 |
| (ආ) අනෙකුත් රජයේ ආයතන | 34 | 162 | 06 | 84 | 35 | 19 | 149 | 31 | 09 | 29 | 22 | 580 | 202 | 782 |
| ළමා අයිතිවාසිකම් | - | - | - | - | 14 | 14 | 01 | - | - | - | 01 | 30 | 04 | 34 |
| ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් | - | - | 01 | - | 01 | 02 | - | - | - | - | - | 04 | 01 | 05 |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | - | 03 | - | - | 02 | - | 02 | 07 | - | 07 |
| සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් | - | 06 | 01 | 02 | - | 02 | - | - | 02 | 01 | - | 14 | 14 | 28 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **LGBT අයිතිවාසිකම්** | - | - | 01 | - | 09 | 01 | 02 | 18 | - | - | - | 31 | 71 | 102 |
| **සෞඛ්‍ය අයිතිවාසිකම්** | - | 03 | 01 | - | 04 | 02 | - | 01 | - | - | - | 11 | 19 | 30 |
| **ඉඩම් සහ දේපළ හිමිකම්** | 17 | 47 | 59 | 02 | 40 | 11 | 14 | 28 | 11 | 28 | 66 | 323 | 255 | 578 |
| **පාරිසරික අයිතිවාසිකම්** | - | 03 | - | 02 | 02 | 06 | 02 | 11 | - | - | 03 | 29 | 17 | 46 |
| **පරිපාලන කරුණු** | 02 | - | 20 | - | 06 | - | 211 | 80 | 22 | 20 | 53 | 414 | 99 | 513 |
| **කාන්තාවන්ගේ අයිතිවාසිකම්** | - | - | - | - | - | 02 | - | 01 | - | - | - | 03 | - | 03 |
| **අනෙකුත් කාණ්ඩ (කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය තුළ ක්‍රියාත්මක විය නොහැකි පැමිණිලි ද ඇතුළුව)** | - | 78 | 32 | 04 | 18 | 06 | 01 | 133 | 05 | 02 | - | 279 | 1749 | 2028 |
| (අ) අනෙකුත් ආයතන වෙත යොමු කිරීම් | - | - | - | - | 08 | - | - | - | - | - | - | 08 | - | 08 |
| වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | 01 |
| ආගමික අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 04 | 04 |
| **එකතුව** | 222 | 666 | 297 | 375 | 432 | 201 | 750 | 727 | 147 | 226 | 378 | 4429 | 5285 | **9714** |

**උ* - රැඳවුම් භාරයේ සිටිය දී මියයෑමේ සිද්ධි 14ක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට පැමිණිලි 16 ක් ලැබී ඇත.**

**ඌ* - අධිකරණ ක්‍රියාවලින් බැහැරව ඝාතනය කිරීමේ සිද්ධි 09ක් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට පැමිණිලි 12 ක් ලැබී ඇත**


2023 වර්ෂයේ දී ලැබී ඇති පැමිණිලි
2500
2000
1500
1000
500
0
පුද්ගලික නිදහස
ද්ශපාලනික අයිතිවාසිකම්
සේවා නියුක්තිය
අධ්‍යාපනය
රජයේ සුබසාධක සේවා
යටිතල පහසුකම් සහ උපයෝගිතා
ඡන්දායකයන් ලියාපදිංචිය
රජයේ ආයතනවල අක්‍රිය ස්වභාවය
ළමා අයිතිවාසිකම්
වැඩිහිටි අයිතිවාසිකම්
ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම්
භාෂා අයිතිවාසිකම්
සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්
LGBT අයිතිවාසිකම්
සෞඛ්‍ය අයිතිවාසිකම්
ඉඩම් සහ දේපළ හිමිකම්
සංස්කෘතික අයිතිවාසිකම්
පාරිසරික අයිතිවාසිකම්
පරිපාලන කරුණු
කාන්තාවන්ගේ අයිතිවාසිකම්

## 3.2. 2023 වර්ෂයේ දී නිමාකළ නඩු කටයුතු සම්බන්ධ සංඛ්‍යාලේඛන

| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය/ කිලිනොච්චිය | මහනුවර | කල්මුණේ | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | මන්නාරම | පුත්තලම | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමථයකට පත්වීම් | 12 | 77 | 48 | 17 | 183 | 39 | 10 | 18 | 14 | 37 | 05 | 35 | 495 | 63 | 558 |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීමක් සිදුනොවීම | 74 | 199 | 105 | 133 | 93 | 278 | 19 | 191 | 64 | 57 | 06 | 25 | 1244 | 337 | 1581 |
| ඉල්ලා අස්කර ගැනීම | 06 | 11 | 06 | 07 | 05 | 18 | -- | 27 | 04 | 17 | -- | 51 | 152 | 216 | 368 |
| ඉදිරිපත් කළ පැමිණිලි සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම | 60 | 129 | 16 | 71 | 34 | 175 | 26 | 186 | 49 | 49 | 11 | 57 | 863 | 1441 | 2304 |
| කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලයේ විෂය සීමාව තුළට ඇතුළත් නොවීම | 65 | -- | 56 | -- | 20 | 04 | 02 | 164 | 05 | 03 | -- | 05 | 324 | 437 | 761 |
| සහනයන් ප්‍රදානය කිරීම | 50 | 128 | 23 | 266 | 39 | 102 | 47 | 79 | 28 | 27 | -- | 41 | 830 | 257 | 1087 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අධිකරණ ක්‍රියාමාර්ග අපේක්ෂිත | 21 | 56 | 18 | 66 | 20 | 71 | 14 | 62 | 09 | 33 | 05 | 13 | 388 | 454 | 842 |
| නියෝග නිකුත් කිරීම් | 548 | -- | -- | -- | -- | 48 | -- | -- | -- | -- | -- | 03 | 599 | 07 | 606 |
| කාල සීමාව වලංගු නොවීම | 04 | 02 | 22 | -- | -- | 08 | 01 | 43 | -- | 01 | -- | -- | 81 | 03 | 84 |
| නිර්දේශ (නිකුත් කරන ලද) | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | 72 | 72 |
| වෙනත් ආයතන වෙත යොමු කළ | -- | 22 | 62 | 32 | 28 | 133 | 02 | 34 | 10 | 25 | -- | 20 | 368 | 61 | 429 |
| එකතුව | **840** | **624** | **356** | **592** | **422** | **876** | **121** | **804** | **183** | **249** | **27** | **250** | **5344** | **3348** | **8692** |

### 3.3.නිර්දේශ

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශ 72 ක් ල ලබාදී ඇති අතර, එයින් නිර්දේශ 24ක් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වන අතර නිර්දේශ 25ක් පුද්ගලික නිදහස සම්බන්ධිත අයිතිවාසිකම්වලට අදාළ වේ. නිර්දේශ 23ක් අධ්‍යාපනික අයිතිවාසිකම්වලට අදාළව ලබා දී තිබුණි.

2023 වර්ෂයේ දී පුද්ගලික නිදහසට අදාළ ගැටලු සම්බන්ධයෙන් නිකුත් කළ නිර්දේශ සමස්ත නිකුත් කළ නිර්දේශ සංඛ්‍යාවෙන් 31% කි. පුද්ගලික නිදහසට අදාළ ගැටලු සම්බන්ධයෙන් නිකුත් කළ නිර්දේශ 23 අතුරින්, 16ක් වධහිංසාවලට අදාළ වන අතර 04ක් අත්තනෝමතික ආකාරයෙන් අත්අඩංගුවට ගැනීම් හෝ රඳවා ගැනීම්වලට අදාළ වේ (2023 වර්ෂයේ දී නිකුත් කළ නිර්දේශවල සම්පූර්ණ ලැයිස්තුව පරිශිෂ්ටය 2හි දැක්වේ). මෙම සියලු නිර්දේශ වෙත අවශ්‍ය පරිදි මහජනතාවට යොමුවීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.


| විෂයය/ක්ෂේත්‍රය | නිර්දේශ සංඛ්‍යාව |
|---|---|
| **ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම්** | **47** |
| - අධ්‍යාපනයට අදාළ අයිතිවාසිකම් * | 23 |
| - අනෙකුත් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ** | 24 |
| **පුද්ගලික නිදහසට අදාළ අයිතිවාසිකම් *** ** | **25** |
| **එකතුව** | **72** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දත්ත සමුදාය

* පාසැල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී සිදුවන නීති උල්ලංඝනයවීම්, සිසුන්ගේ විනය පිළිබඳ ගැටලු, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීම්වල දී පැන නඟින ගැටලු, අධ්‍යාපන ආයතනවල සිදුවන විවිධ හිංසනයන්, සහ අධ්‍යාපනික ආයතනවල රැකියාවල උසස්වීම් මෙම නිර්දේශවලට අදාළ වේ.

** ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම්වලට අදාළව ලබාදී ඇති නිර්දේශ යටතට විශ්‍රාම වැටුප්, ජීවනෝපාය, වැටුප් වර්ධක, ස්ථාන මාරු, බඳවාගැනීම් සහ සේවා නියුක්තියේ කොන්දේසි, සේවයෙන් පහ කිරීම, සේවය අත්හිටුවීම, වන්දි ගෙවීම සහ බලය අයුතු ලෙස භාවිතා කිරීම ආදි කටයුතුවල දී අයිතිවාසිකම් උල්ලංඝනයවීම ඇතුළත් වේ.

*** නීති විරෝධී අත්අඩංගුවට ගැනීම සහ රඳවා තැබීම, වධ හිංසා පමුණුවාලීම, සහ අත්අඩංගුවේ පසුවීමේ දී සිදුවන මරණයන් පුද්ගලික නිදහසට අදාළ අයිතිවාසිකම් යටතට ඇතුළත් වේ.




## 3.4. අධීක්ෂණ චාරිකා

2023 වර්ෂයේ දී, කොමිෂන් සභාව විසින් එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල හරහා විවිධ ආයතන වෙත අධීක්ෂණ චාරිකා 739ක් සිදුකර ඇති අතර, එයින් 653ක් පොලිස් ස්ථාන වෙත ද, 69ක් බන්ධනාගාර සහ ළමා සුරක්ෂිත නිවාස ආදිය සිදුකර ඇත (වැඩිදුර විස්තර සඳහා 4.4.2 බලන්න).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන නිසි පරිදි සැලසුම් කළ චාරිකා වශයෙන් පොලිස් ස්ථාන අධීක්ෂණය කිරීම සිදුවන බව සඳහන් කළ යුතු ය. චාරිකා සැලසුම් කරගැනීමේ පහසුව සඳහා, කොමිෂන් සභාව විසින් පොලිස් ස්ථාන පිහිටා ඇති ස්ථානවල මාර්ග අනුව නියමිත සැලැස්මක් සකස් කරන අතර, දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන ආසන්න වශයෙන් 491ක් මෙයින් ආවරණය වේ. පොලිස් ස්ථානවලට අමතරව, බන්ධනාගාර වැනි අනෙකුත් රැඳවුම් ස්ථාන වෙත ද සංචාරයන් සිදුකරනු ලැබේ.

| | ප්‍රධාන කාර්යාලය | අම්පාර | අනුරාධපුරය | මඩකලපුව | බදුල්ල | යාපනය සහ කිලිනොච්චිය | මහනුවර | කල්මුණේ | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව සහ මන්නාරම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පොලිස් ස්ථාන** | 103 | 40 | 42 | 101 | 20 | 120 | 27 | 67 | 71 | 43 | 19 | **653** |
| **බන්ධනාගාර** | 5 | 1 | | 7 | 4 | 7 | 2 | 3 | 6 | 2 | 1 | **38** |
| **ළමා ආරක්ෂක/ ළමා නිවාස** | | | | 1 | | 10 | | 13 | 7 | | | **31** |
| **පුනරුත්ථාපන මධ්‍යස්ථාන** | | | 1 | | | | | | | 1 | 1 | **3** |
| **කාන්තා නිවාස** | | | | | | 1 | | | | | | **1** |
| **ආබාධිත තැනැත්තන් සඳහා නිවාස** | | | | | | | | 3 | | | | **3** |
| **අපරාධ විමර්ශන අංශය/ ත්‍රස්ත විමර්ශන අංශය** | 5 | | | 5 | | | | | | | | **10** |
| **එකතුව** | | | | | | | | | | | | **739** |

4 වැනි පරිච්ඡේදය: මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පැවරී ඇති බලය

4.1. අර්බුදකාරී වාතාවරණයන්හි දී මානව හිමිකම් ආරක්ෂා කිරීම

4.2. කඩිනම් ප්‍රතිචාර

4.2.1. කඩිනම් ප්‍රතිචාර ඒකකය (RRU)

4.2.2. සභාපතිවරයාගේ කාර්යාලය මගින් සිදුකරන මැදිහත්වීම්

4.3. උපදේශක කාර්යයන්

4.3.1. ජාතික නීතිවලට අදාළව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

4.3.2. ප්‍රතිසංස්කරණ සඳහා අනෙකුත් සහාය

4.3.3. ජාත්‍යන්තර ප්‍රමිති අපරානුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීම

4.4. අධීක්ෂණ කාර්යයන්

4.4.1. නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම

4.4.2. රඳවා ගැනීමේ ස්ථාන සහ සත්කාර නිවාස අධීක්ෂණය

4.4.3. එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවල සේවය සඳහා ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා පිරිස් නියුක්ත කරවීම පිළිබඳව පරික්ෂාකාරීව සලකා බැලීම

4.4.4. OPCAT යටතේ ජාතික නිවාරක යාන්ත්‍රණය

4.4.5. බන්ධනාගාර පිළිබඳව සිදුකළ ජාතික අධ්‍යයනයේ ප්‍රතිඵලවල ප්‍රගතිය

4.5. විමර්ශන

4.5.1. ලැබී ඇති පැමිණිලි පිළිබඳව

4.5.2. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් ආරම්භ කරන විමර්ශන (suo motu interventions)

4.6. අධ්‍යාපනික හා කොමිෂන් සභාව ප්‍රජාවට සමීපස්ථ වීමේ කාර්යයන්

4.6.1. මානව හිමිකම් සම්බන්ධිත සම්මතයන් හා ගැටලු පිළිබඳව දැනුවත්බව ඉහළ නැංවීම

අ) ජාත්‍යන්තර සැමරුම් දින උත්සවාකාරයෙන් සැමරීම

ආ) විවිධ අවධානිත කණ්ඩායම් සඳහා පුහුණු සහ සාකච්ඡා

ඇ) උපදේශනය

4.6.2. මාධ්‍ය සමඟ සම්බන්ධතාවය

- සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය හා ඉලෙක්ට්‍රොනික් මාධය සමඟ කටයුතු කිරීම
- මාර්ගගත වේදිකා භාවිතය

4.6.3. සිවිල් සමාජය සමඟ සම්බන්ධතාවය

- ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු
- මානව හිමිකම් සඳහා ප්‍රජා කාර්යසාධක බලකායන් (CTF4HR)
- තේමාත්මක උප-කමිටුවල සාමාජිකයන් වශයෙන් සිවිල් සංවිධාන නියෝජිතවරුන්
- සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන විවිධ අවස්ථාවන් සඳහා සහභාගිත්වය
- සිවිල් සමාජය සඳහා පුහුණුව

## 4.1. අර්බුදකාරී වාතාවරණයන්හි දී මානව හිමිකම් ආරක්ෂා කිරීම

2019 වර්ෂයේ දී සිදුවූ පාස්කු ප්‍රහාරය, කොවිඩ් -19 වසංගතය, සහ මෑත කාලීනව ඇති වූ ආර්ථික අර්බුදය ඇතුළුව බාහිර කම්පන කිහිපයකට ශ්‍රී ලංකාව මෑතකාලීනව මුහුණ දුන් අතර එයින් ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල තවමත් සංවේදනය වෙමින් පවතී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම තීරණාත්මක අවධියේ දී ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් පෙනී සිටි අතර මානව හිමිකම් ආරක්ෂාව සහ ප්‍රවර්ධනයට පක්ෂව කටයුතු කරන ලදී. නිදසුනක් ලෙස, ආර්ථික අර්බුදය සමයේ පැවති මහජන විරෝධතා කොමිෂන් සභාව විසින් සුපරික්ෂාකාරීව අධීක්ෂණය කළ අතර මානව හිමිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් විමර්ශන පවත්වන ලදී. විවිධ මානව හිමිකම් උල්ලංඝනයවීම් හෙළා දකිමින් මාධ්‍ය ප්‍රකාශන හරහා මහජනයා ඉදිරියේ පෙනීසිටි අතර උද්ඝෝෂණ කාලසීමාවල දී පොදු ජනතාව සිය අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහතික කරන ලදී. තව ද, මෙම කාල සීමාව තුළ දී සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයවීම්වල ස්වරූපවලට අවධානය යොමුකරමින් ප්‍රධාන රජයේ අධිකාරීවලට නිර්දේශ නිකුත් කරන ලදී. පහත දැක්වෙනුයේ එවැනි මැදිහත්වීමක් සම්බන්ධිත නිදසුනකි:

- සිසුන් විසින් මුහුණ දෙන අසීරුතා අවම කිරීම සඳහා අපොස උසස් පෙළ විභාගය පැවැත්වෙන කාලසීමාව එනම්, 2023 ජනවාරි මස 23 වැනි දිනෙන් ආරම්භ වී 2023 පෙබරවාරි 17 වැනි දින දක්වා විදුලිය කැපීම් වලින් තොර අඛණ්ඩ විදුලිබල සැපයුමක් සහතික කරන ලෙස කොමිෂන් සභාව විසින් නියෝගයක් (HRC/RM/M/02/2022) නිකුත් කරන ලදී. එම මැදිහත් වීමෙන් පසුව, ඊට අදාළ පාර්ශව විසින් සුහද එකඟතාවයකට පැමිණි අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් අපොස උසස් පෙළ විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ අඛණ්ඩ විදුලිබල සැපයුමක් පවත්වා ගැනීමට එකඟවිය.

  ලංකා විදුලිබල මණ්ඩලය විසින් එවැනි පැහැදිලි පොරොන්දුවක් ලබාදී තිබියදීත්, එසේ ඇතිකරගත් එකඟතාවයේ කොන්දේසි ක්‍රියාත්මක නොවිණි. එබැවින්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති, සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ/ සභාපති යන පිරිස හිතමතාම ඉහත නියෝගය උල්ලංඝනය වන අන්දමින් කටයුතු කළ බව සහ විශේෂයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා 1996 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විධිවිධාන යටතේ අපහාසයක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව විසින් 2023.01.30 දිනැතිව මාධ්‍ය නිවේදනයක් මගින් සිය ස්ථාවරත්වය ප්‍රකාශකර සිටින ලදී. විභාග කාලසීමාව තුළ අපොස උසස් පෙළ සිසුන් සඳහා අඛණ්ව විදුලිබලය ලබාදෙන

බවට යථෝක්තව සඳහන් කළ පාර්ශව අතර ඇතිවූ එකඟතාවයට පටහැනිව, ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිතාමතා සහ ද්වේෂ සහගත ආකාරයෙන් එකී එකඟතාවය නොසලකා හැරි අතර විදුලිය කැපීම අඛණ්ඩව සිදුකරන ලදී. විභාග කාලසීමාව තුළ අඛණ්ඩ විදුලිබල සැපයුමක් සැපයීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ එකී නොහික්මුණු නොසලකා හැරීම වනාහී අධ්‍යාපනය සඳහා ළමයෙකු සතු අයිතිය සාහසික ආකාරයෙන් උල්ලංඝනය කිරීමක් බවට කොමිෂන් සභාව විසින් සලකන ලදී. ඒ අනුව, කොමිෂන් සභාව විසින් අපහාස සහතිකයක් මනාව අත්සන් කර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව, අංක SC/Contempt/01/2023 දරන නඩුව ඔස්සේ ලංකා විදුලිබල මණ්ඩලයට එරෙහිව නඩුවක් ගොනු කරන ලදී. එසේ වුවද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉන් අනතුරුව තාක්ෂණික හේතු මත එකී නඩුව නිෂ්ප්‍රභා කරන ලදී.

## 4.2. කඩිනම් ප්‍රතිචාර

### 4.2.1. කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය (RRU)

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයැවීමෙන් ආරම්භ කළ යුතු හදිසි පරීක්ෂණ (*suo motu* cases) සඳහා මෙන්ම සෘජු පැමිණිලි සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය 2023 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. මානව හිමිකම් උල්ලංඝනයවීම් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම, කාලානුරූපී ප්‍රතිකර්ම සහ නිර්දේශ සහතික කිරීම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීමේ ධාරිතාවය සවිමත් කිරීම, සහ සභාව විසින් ස්ව මෙහෙයැවීමෙන් ආරම්භ කළ යුතු හදිසි පරීක්ෂණ (*suo motu* cases) සහ වාර්තාවන මානව හිමිකම් උල්ලංඝනයවීම් සඳහා අදාළවන තොරතුරු හා සාක්ෂි රැස්කර ගැනීම මෙම කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණු අතර ඇතුළත් විය. සෑම කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායමක්ම අවම වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත වන නමුදු, එක් එක් නිශ්චිත අවස්ථාවන්ගේ අවශ්‍යතාවය මත පදනම්ව මෙම සංඛ්‍යාව ගලපා ගනු ලැබේ. රඳවාගැනීමේ පහසුකම් සහිත ස්ථානවලට සිදුකරන සංචාරවලට අදාළ සිද්ධිවල දී, එකී ආයතනයේ ස්ත්‍රී හා පුරුෂ සංයුතිය මත කොමිෂන් සභාවේ කණ්ඩායමේ සංයුතිය තීරණය වේ. නිදසුනක් ලෙස, කාන්තා රැඳවුම් මධ්‍යස්ථානයකට සංචාරය කරන කණ්ඩායමක අවම වශයෙන් කාන්තා නිලධාරිනියන් දෙදෙනෙකු හා එක් පිරිමි නිලධාරියෙකු ඇතුළත් වේ. සෑම අවස්ථාවකදීම අවම වශයෙන් එක් කණ්ඩායම් සාමාජිකයෙකුවත් කාන්තා නිලධාරිනියක වන අතර, කණ්ඩායම නීති නිලධාරියෙකු හා මානව හිමිකම් නිලධාරියෙකු යන නිලධාරි ද්විත්වයෙන්ම සමන්විත විය යුතු ය. මීට අමතරව, අවම වශයෙන් කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකයේ එක් පසුවිපරම් නිලධාරියෙකු සිටිය යුතු අතර කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කටයුතු පවත්වාගැනීමේ හා එහි කටයුතු නිරීක්ෂීමේ කාර්යය ඔහුට පැවරේ. කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායමට රාජ්‍ය භාෂා ත්‍රිත්වයටම අදාළව නිපුණත්වයක් පැවතිය යුතු ය. අයිතීන් උල්ලංඝනය සිදුවන ස්ථානය කොළඹ නගරයේ පිහිටා ඇති අවස්ථාවන්හි දී, අදාළ පැමිණිල්ල ලැබී පැයක් ඇතුළත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන

කාර්යාලයේ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම පිටත් වනු ඇත. ප්‍රාදේශීය කාර්යාලවලට ආසන්නයේ සිදුවන සිද්ධිවලදී, අදාළ කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම අදාළ පැමිණිල්ල හෝ නියෝගය ලැබී පැයක් ඇතුළත එකී ස්ථානයට පිටත්වනු ඇත. කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ඒකකය විසින් 2023 වර්ෂයේ දී සංචාරයන් 06ක් සිදුකර තිබූ අතර, මෙහිදී ප්‍රධාන වශයෙන් විසඳීම කළ යුතු වූයේ සිවිල් කැලඹිලි, වධහිංසා, නීති විරෝධී රඳවා ගැනීම් හා නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් සිද්ධීන් වේ.

| සංචාරය සිදුකළ දිනය | අදාළ සිද්ධිය සංක්ෂිප්ත වශයෙන් | සංචාරය සිදුකළ ස්ථානය/ වාර ගණන | නඩු අංකය |
|---|---|---|---|
| **2023.10.17** | රුදවුම්භාරයේ සිටීමේ දී සිදුවූ මරණය - අවිස්සාවේල්ල පොලිස් ස්ථානය | අවිස්සාවේල්ල පොලිස් ස්ථානය | SUO/MOTU/17/23 |
| **2023.11.02** | කළුතර බන්ධනාගාරයට සිදුකළ සංචාරය - අගතියට පත් පාර්ශව වෙතින් ලබාගත් ප්‍රකාශය | කළුතර බන්ධනාගාරය | HRC/HO/4175/23, HRC/HO/3857/23, HRC/HO/4032/23 |
| **2023.12.01** | පොලීසිය විසින් වධහිංසා සිදුකිරීම සහ අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයෙකු අතුරුදහන්වීම | කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය - පෑලියගොඩ පෑලියගොඩ පොලිස් ස්ථානය කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය - නුගේගොඩ | HRC/HO/4687/23 |
| **2023.12.04** | කිතුදහම ව්‍යාප්ත කිරීමේ දේශකයෙකු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) පනත යටතේ අත්අඩංගුවට ගැනීම | නව මැගසින් බන්ධනාගාරය | SUO/MOTU/21/23 |
| **2023.12.21** | පොලීසිය විසින් වධහිංසා සිදුකිරීම | බිලූමැන්ඩල් පොලිස් ස්ථානය | අදාළ නඩුවක් නොමැත. |
| **27. 12. 2023.12.2** | බන්ධනාගාරගත වී සිටිය දී සිදුවූ මරණය - කළුතර බන්ධනාගාරය | කළුතර බන්ධනාගාරය | SUO/MOTU/23/23 |

### 4.2.2. සභාපතිවරයාගේ කාර්යාලය මගින් සිදුකරන මැදිහත්වීම්

ඉහත ආකාරවලට අමතරව, විමර්ශන සහ පැමිණිලි විභාග කිරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රමාදවීම් හා අනෙකුත් ගැටලුවලින් අගතියට පත්වන පැමිණිලිකරුවන් සඳහා සහන සැලසීම සඳහා සභාපතිවරයා විසින් මැදිහත්වීම සම්මතයක් වශයෙන් පවතී.

## 4.3. උපදේශක කාර්යයන්

### 4.3.1. ජාතික නීතිවලට අදාළව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

නීති සහ පරිපාලනමය විධාන මූලික අයිතිවාසිකම් හා ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් හා ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම පිණිස උපදෙස් ලබාදීමට පිළිවෙලින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 (ඇ) සහ (ඈ) වගන්ති යටතේ කොමිෂන් සභාවට බලය පැවරී තිබේ. මෙය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව විසින් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙතින් පනත් කෙටුම්පතෙහි පිටපතක් ඉල්ලා සිටින අතර, එකී පනත් කෙටුම්පත පරීක්ෂා කිරීම හා සියුම් ලෙස විග්‍රහ කිරීම සිදුකර, සිය නිරීක්ෂණ හා නිර්දේශ සකස් කිරීමට පූර්වයෙන් සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් ද ඇතුළුව අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සිදුකරනු ලැබේ. ඉන් අනතුරුව, කොමිෂන් සභාව විසින් අවස්ථානුකූලව සිය නිරීක්ෂණ හා නිර්දේශ අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත හෝ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූලික අයිතිවාසිකම් හා ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් හා ප්‍රමිතීන් සමඟ පනත් කෙටුම්පතෙහි අනුකූලතාවය වැඩිදියුණු කිරීම පිණිස රජයට සහාය වීමට මෙකී නිරීක්ෂණ හා නිර්දේශ වැදගත් වේ. කොමිෂන් සභාව විසින් සිය නිරීක්ෂණ හා නිර්දේශ සභාවේ සමාජ මාධ්‍ය ඔස්සේ සිය වෙබ් අඩවියෙහි ද පළ කරන අතර, අදාළ ලේඛනය සිය මාධ්‍ය ජාලය තුළ බෙදා හැරේ. 2023 වර්ෂයේ දී, කොමිෂන් සභාව විසින් නීති අණපනත් සම්බන්ධයෙන් පහත නිර්දේශ රජයට ලබාදී ඇත:

- **ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතෙහි ත්‍රස්තවාදය යන වචනය නිර්වචනය කර ඇති ආකාරය එහි පුළුල් විෂය පථය මූලික අයිතිවාසිකම් සමඟ බාධනය වන හෙයින් එකී නිර්වචනය සංශෝධනය කිරීම සඳහා නිර්දේශය.**

ත්‍රස්ත විරෝධී පනතේ 3(1) වගන්තියේ ත්‍රස්තවාදය නිර්වචනය කර ඇති ආ◌ාකරය නැවත සලකා බලන ලෙසට සහ එය තුළ ගැබ්වී ඇති විවිධාර්ථවත් බව බැහැර කිරීම සඳහා එම අර්ථ නිරූපණය තුළට ඇතුළත්වන ක්‍රියා පැහැදිලි හා පටු කිරීම පිණිස නිශ්චිත සංශෝධන නිර්දේශ කිරීමට කොමිෂන් සභාව විසින් 2023 අප්‍රේල් 06 දිනැතිව නිකුත් කළ ප්‍රවෘත්ති නිවේදනය ඔස්සේ රජය වෙත නිර්දේශ කර තිබේ. ඕනෑම සමාජයක සාමය, යුක්තිය හා යහ පාලනය සඳහා අත්‍යවශ්‍ය නීතියේ ආධිපත්‍යයේ සංකල්ප සහ මූලධර්ම ආරක්ෂා කිරීමේ වැදගත්කම කොමිෂන් සභාව විසින් අවධාරණය කර තිබේ.

එකී වැදගත්කම හේතුවෙන්, සාමාකාමී ආකාරයෙන් ක්‍රියාත්මක වන්නා වූ සමාජයක් උදෙසා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර මානව හිමිකම් හා මානුෂීය නීති යන දෙකම සඳහා ගරුත්වය දරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ සියලු පියවර නීතිය සමඟ අනුකූල විය බව එම නිර්දේශ ඔස්සේ තවදුරටත් අවධාරණය කර තිබේ. ආරක්ෂාව සැලකූ විට එයම මානව හිමිකමක් වන අතර, සිතීමේ නිදහස, ප්‍රකාශනය, ආශ්‍රය, ජීවිතය සඳහා අයිතිය, නිදහස, සහ පුද්ගලික ආරක්ෂාව වැනි

පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් මත ත්‍රස්තවාදය විසින් සෘජුවම තර්ජනයක් ඇති කෙරේ. එසේ වුව ද, ත්‍රස්තවාදය ආශ්‍රිත වැරදි ක්‍රියා නියාමනය සහ දඬුවම් පමුණුවන මෙකී පනත් කෙටුම්පතෙහි ත්‍රස්තවාදය නිර්වචනය කර ඇති ආකාරය මතභේදාත්මක සහ පුළුල් අර්ථ ගැන්වෙන අතර එමඟින් බොහෝවිට එය යොදාගැනීම සංකීර්ණ වනු ඇත. යම් මතවාදී අරමුණකට බලහත්කාරයෙන් නම්මවා ගැනීම හෝ බලපෑම් කිරීම සඳහා වන ප්‍රචණ්ඩකාරී ක්‍රියා ඇතුළත් වන ත්‍රස්තවාදය ඇතැම්විට එහි පුළුල් අර්ථ නිරූපණය ඔස්සේම පැවතියහොත් රජය විසින් විරුද්ධමතධාරීන් හා ක්‍රියාකාරින් ඉලක්ක කිරීමට හා නිහඬ කිරීමට දුර්භාවිතා කිරීමක් සිදු විය හැකි අතර, එමගින් අවසානයේ දී භාෂණයේ සහ විරෝධය පළ කිරීමේ නිදහස වැනි පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති අයිතිවාසිකම් උල්ලංඝනයවීමක් සිදුවිය හැකි ය.

මෙම පනත් කෙටුම්පත් 3 (2) (ඊ) වගන්තියේ දක්වා ඇති යෙදුම් අනුව, අත්‍යවශ්‍ය සේවා හෝ සැපයුම් කෙරෙහි සිදුවන බාධකයක් ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස සැලකෙන අතර, විරෝධතාවයකට හෝ රැළියකට සහභාගිවන ඕනෑම තැනැත්තෙකුද ‘ත්‍රස්තවාදියෙකු’ වශයෙන් සැලකීමේ විභවතාවයක් පවතී. අත්‍යන්ත වශයෙන් ජාතියක් ලෙස ළඟා කර ගැනීමට ප්‍රයත්න දරන යහපත් ප්‍රජාතන්ත්‍රවාදය කෙරේ තර්ජනයක් ඇති කරන භාෂණයේ හා සංචරණයේ නිදහස වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති අයිතිවාසිකම් මත මෙම පනත් කෙටුම්පත මගින් ඇති කරන සැඟවී ඇති තර්ජනය කොමිෂන් සභාව විසින් රජයේ අවධානයට යොමුකර තිබේ.

- අපරාධ කරුණුවලට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචන අධිකරණ බලය සම්බන්ධයෙන් නිර්දේශ

මරණීය දණ්ඩනය නියම කිරීමේ දී පවතින ආපසු වෙනස් කළ නොහැකි ස්වභාවය සැලකිල්ලට ගෙන, අපරාධ කරුණුවලට අදාළව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචන අධිකරණ බලය, විශේෂයෙන් අභියාචනාධිකරණය විසින් චූදිතයා වැරදිකරු කර මරණීය දණ්ඩනය නියම කිරීමේ නඩු කටයුතුවලට අදාළ නීතිය සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අධිකරණ සහ බන්ධනාගාර අමාත්‍යවරයා වෙත නිර්දේශ ලබා දී තිබේ. මෙම නිර්දේශය 2023 මැයි 04 දිනැති ප්‍රවෘත්ති නිවේදනය ඔස්සේ ප්‍රකාශයට පත්කර තිබේ.

- මූලික අයිතිවාසිකම් කරුණක් වශයෙන් පරිසරය සැලකීම සහතික කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා නිර්දේශය

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් විෂය පථය තුළ පරිසරය ඇතුළත් වී නොතිබුණ ද, පරිසරය හා අදාළ විධිවිධාන කිහිපයත් එහි අන්තර්ගත වී තිබේ. මේ කරුණ මත පදනම්ව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, 2023 මැයි 08 දිනැති ප්‍රවෘත්ති නිවේදනය හරහා එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධිත ව්‍යවසනය සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ලැබී ඇති විධිමත් පැමිණිල්ලක් සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකරන ලදී. මෙම ව්‍යවසනය මගින් ශ්‍රී ලංකාවේ පරිසරය (භූමිය හා භෞමික ජලය යන දෙකම මත), ආර්ථිකය, ප්‍රජාවේ සෞඛ්‍යය මත ඇති කළ බලපෑම අනුව එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ආශ්‍රිත ව්‍යවසනයේ ප්‍රමාණය සහ එහි දරුණුතාවය කොමිෂන් සභාව විසින් සඳහන් කර තිබේ. විෂ සහිත ප්ලාස්ටික් අංශු, සහ සමුද්‍රය සේම වෙරළ තීරය ඔස්සේ උතුරා පිටාර ගැලූ නයිට්‍රික් අම්ලයේ අතිමහත් ධාරිතාවය සැලකූ විට ජාත්‍යන්තර වශයෙන් මිනිසා විසින් ඇතිකළ විශාලතම සමුද්‍රීය පාරිසරික ව්‍යවසනය ලෙස , මෙය අවිවාදයෙන්ම සැලකිය හැකි ය. සියලු දෙනා වෙත ප්‍රාථමික සෞඛ්‍ය පහසුකම් සැපයීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් සුරක්ෂිත කළ මූලික අයිතිවාසිකමක් බවට ද සඳහන් කර, මෙම ව්‍යවසනයෙන් අනතුරුව ඇති වූ දරුණු අනපේක්ෂිත ආර්ථික ප්‍රතිඵල සහ සෞඛ්‍ය ගැටලු කොමිෂන් සභාව විසින් පෙන්වා දී තිබේ. මූලික අයිතිවාසිකම් කරුණක් වශයෙන් පරිසරය සැලකීම සහතික කරලීම  සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ  විභව්‍ය ඉලක්කය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කළ අනෙකුත් මූලික අයිතිවාසිකම් සඳහා සහතික කළ ඍජු සම්බන්ධතාවයක් සමගින් මෙම ගැටලුව විසඳීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රතිඥා දී තිබේ.

- **ජාතික කාන්තා කොමිසම පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ නිර්දේශ**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සඳහා ජාතික කාන්තා කොමිසම පිළිබඳ පනත් කෙටුම්පතෙහි අනුකූලතාවය සහතික කිරීමේ අරමුණින් ජාතික කාන්තා කොමිසම පිළිබඳ පනත් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය පොදු නිරීක්ෂණ හා නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. එසේ ඉදිරිපත් කළ පොදු නිරීක්ෂණ හා නිර්දේශ යටතට පහත කරුණු ඇතුළත් ය:

i. පද සංයෝජනය පැහැදිලි කරගැනීමට හා කාන්තාවන් ආරක්ෂා කරගත යුත්තේ කුමන කාණ්ඩවල හිංසාවලින් ද යන පැහැදිලිව දක්වා තිබීම සහතික කිරීම සඳහා 2(ඇ) වගන්තිය සංශෝධනය කිරීම.

ii. ජාතික කාන්තා කොමිෂමේ සියලු සාමාජිකයන් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත පත්කෙරෙන බව සහතික කිරීම සඳහා 4 වැනි වගන්තිය ශක්තිමත් කිරීම.

iii. ජාතික කාන්තා කොමිසම වෙත වාර්තා කිරීම හෝ කොමිසම ඉදිරියේ පෙනී සිටීම අවශ්‍ය කරනුයේ රජයේ නියෝජිතායතන බව පැහැදිලි දක්වා තිබීම සඳහා (ඊ) සහ (ඌ) උපවගන්ති සංශෝධනය කිරීම. කොමිසම

විසින් සිවිල් සමාජ ක්‍රියාකාරින් සමඟ කටයුතුවල නිරතවීම සඳහා සුවිශේෂී අයුරින් බලගැන්විය යුතු බවට ද නිර්දේශ කර තිබේ.

iv. පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය යටතේ පනවා ඇති කාල සීමාව සම්බන්ධයෙන් යළි සලකා බැලීම.

- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත තාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ නිර්දේශ සහ මූලික නිරීක්ෂණ

2023 සැප්තැම්බර් 18 දිනැතිව නිල ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත තාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ මූලික නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් 2023 ඔක්තෝබර් 02 දාතමින් යුතු ලිපිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ මාර්ගගත අවකාශය පුරවැසියන් සඳහා සුරක්ෂිත කිරීම වටිනා ව්‍යවස්ථාදායක අරමුණක් බව කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ. මාර්ගගත ක්‍රියාකාරකම්වලට අදාළ අපරාධ වැරදි සම්බන්ධයෙන් නව නීති හඳුන්වාදීමේ යෝජනාවලට පෙර නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිවල ආයතනික ධාරිතාවය සවිමත් කිරීම සඳහා සද්භාවයෙන් දැනට ක්‍රියාත්මක අපරාධ නීතිය අර්ථ නිරූපණය හා යොදාගැනීම සිදුකළ යුතු බව කොමිෂන් සභාවේ මතය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය සමඟ පනත් කෙටුම්පතෙහි අනුකූලතාවය සහතික කිරීම ද මෙම නිරීක්ෂණවලින් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන නිර්දේශ පහත පරිදි වේ:

i. පනත් කෙටුම්පත මගින් පුද්ගලයන් හුදු ‘පීඩාවට පත්කිරීම’ වශයෙන් සැලකෙන ප්‍රකාශ අපරාධ වශයෙන් නම් කිරීමේ වගන්ති ඉවත්කළ යුතු ය. ඊට හේතු වනුයේ ‘පීඩාවට පත්වීම’ යන හැඟීම එක් එක් මට්ටම්වගට වෙනස්වීම සහ ඉහළ මටට්මකින් පුද්ගල නිශ්‍රිත වීම යි. එවැනි හානි සඳහා සිවිල් නඩු විභාග ඔස්සේ වඩාත් හොඳින් කටයුතු කළ යුතු අතර ඒ සඳහා වන්දි එසේ හානියට පත්වූ තැනැත්තා විසින් ඉල්ලා සිටිය හැකි ය.

ii. යෝජිත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පත්කළ යුත්තේ පත්කිරීමේ යාන්ත්‍රණයකින් වන අතර, එමගින් එය දේශපාලනීකරණයෙන් නිදහස්වීම තහවුරු කෙරේ. කොමිෂන් සභාව වෙත ක්වාසි අධිකරණ බලය හෝ ‘ප්‍රකාශයට පත්කරන ලද මාර්ගගත ස්ථාන’ වශයෙන් මාර්ගගත ස්ථානයන් නම්කිරීම සඳහා බලය නොපැවරිය යුතු ය.

iii. පුද්ගලයන්ට එරෙහිව අහිතකර තීරණ ගනු ලැබීම සඳහා වන කාර්ය පටිපාටි සඳහා පනතෙහි විධිවිධාන සංගත ආකාරයකින් සංශෝධනය කළ යුතු ය. ස්වභාවික යුක්තියේ රීතිවලට අනුව එවැනි පුද්ගලයන් වෙතින් කරුණු විමසීමට අවස්ථාවක් ලබාදීම සහතික කරනු වස් එසේ සිදුකළ යුතු ය.

iv. අන්‍යයන් වැරදි කිරීම සඳහා පොළඹවාලන ආකාරයේ 'තහනම් ප්‍රකාශ'වලට අදාළව පනත් කෙටුම්පතේ දක්වා ඇති විවිධ වැරදි දැනටමත් දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් වන හෙයින් ඒවා පනතේ දක්වා ඇති නව වැරදිවලට වැඩිමනක් වශයෙන් හෙයින් ඉවත් කිරීම හෝ ඒවායේ මනා නිවැරදිතාවය තහවුරු වන පරිදි සහ තාර්කිකබව, සාධාරණත්වය සහ පනවන දණ්ඩනවලට සමානුපාතික වන පරිදි සැලකිය යුතු ආකාරයෙන් සංශෝධනය කිරීම හෝ සිදුකළ යුතු ය.

v. නිර්නාමිකව සිටීමට සහ හාස්‍යමය අනුකරණයන් හා උපහාසාත්මක ප්‍රබන්ධයන් ගෙතීම්වල නිරතවීම පිණිස මාර්ගගත පරිශීලකයන්ගේ නිදහස ආරක්ෂා වන පරිදි 'ව්‍යාජ මාර්ගගත ගිණුම්' වර්ගීකරණය සඳහා පැහැදිලි නිර්ණායක පනත් කෙටුම්පතට අන්තර්ගත කළ යුතු අතය.

vi. පොලිස් විමර්ශන සඳහා සහාය වීමට පත්කරන විශේෂඥයන් වෙත පොලිස් බලතල නොපැවරිය යුතු වනුයේ ඔවුන් ප්‍රසිද්ධියේ වගවිය යුතු නොවන පුද්ගලික ක්‍රියාකාරීන් විය හැකි බැවිනි.

vii. මාර්ගගත ආකාරයෙන් ළමා අපයෝජනය සිදුකිරීම සම්බන්ධිතව නව වරදක් හඳුන්වාදීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සතුටින් පිළිගැනෙන අතර වෙන් වූ වෙනත් නීති පනතක් හරහා එවැනි වරදක් හඳුන්වා දීම පිණිස අමාත්‍යාංශය විසින් අධිකරණ සහ ළමා කටයුතු යන විෂයයන් සම්බන්ධිතව කටයුතු කරන අදාළ අමාත්‍යාංශ සමඟ සමීපව කටයුතු කිරීම දිරිමත් කෙරේ.

- ජාතික කාන්තා කොමිසම පිළිබඳ පනත් කෙටුම්පත, ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත, කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන නිරීක්ෂණ හා නිර්දේශවලට අදාළව ගරු ජනාධිපතිවරයා වෙත සිදුකරන නිර්දේශ

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 නොවැම්බර් 17 දිනැතිව ගරු ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපියෙන් ජාතික කාන්තා කොමිසම පිළිබඳ පනත් කෙටුම්පත, ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත, කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත නිර්දේශ ගරු ජනාධිපතිවරයා වෙත යොමු කර ඇත:

i. ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ පනත් කෙටුම්පත තනි පනතක් වශයෙන් සම්බන්ධ කළ යුතු ය.

ii. ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාවය පිළිබඳ සභාව නව දෙපාර්තමේන්තුවක් තුළ ස්ථාපනය කළ යුතු අතර කාන්තා කාර්යාංශය ඒ සමඟ වැඩිදියුණු කළ යුතු ය.

iii. මෙම එකතු කිරීම සලකා බැලිය යුත්තේ කටයුතු අතිපිහිතවීම සහ සම්පත් නාස්තිය අවම කිරීම උදෙසා ය.

iv. එවැනි වෙනස් කිරීමක් සිදුකිරීම සඳහා 'ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සමානාත්මතාවය පිළිබඳ දෙපාර්තමේන්තුව' වශයෙන් දෙපාර්තමේන්තුව නම් කිරීම සලකා බැලිය යුතු ය.

v. ජාතික කාන්තා කොමිසමට අදාළ පත්කිරීමේ ක්‍රියාවලිය වඩාත් සවිමත් කළ යුතු අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සාමාජිකයන් පත් කිරීම සිදුකරන ආකාරයෙන් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත මෙම කොමිසමේ ද සාමාජිකයන් පත්කළ යුතු ය.

vi. මෙම පනත් කෙටුම්පත්වල හරයාත්මක විෂය කරුණු සම්බන්ධයෙන් අර්ථවත් මහජන විමසුමක් ලබාගැනීමට හැකිවන පරිදි හැකි ඉක්මනින් මෙම පනත් කෙටුම්පත් ත්‍රිත්වයම ප්‍රකාශයට පත්කිරීම සලකා බැලීම.

### 4.3.2. ප්‍රතිසංස්කරණ සඳහා අනෙකුත් සහාය

කොමිෂන් සභාව විසින් මැදිහත්වීම සුදුසුබවට සලකන ලද වැදගත් මානව හිමිකම් ගැටලු සඳහා 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැදිහත්වීම් සහාය ලබාදෙන ලදී. එවැනි මැදිහත්වීමකට නිදසුනක් පහත දැක්වේ:

- එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ව්‍යසනයට අදාළ විමර්ශනය මත පදනම්ව ගත යුතු පියවර සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන නිර්දේශ සහිත අතුරු වාර්තාව

එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය ව්‍යසනයට අදාළව දැනට කෙරීගෙන යමින් පවතින විමර්ශනයේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අතුරු වාර්තාවක් ගරු ජනාධිපතිවරයා වෙත 2023 මැයි 18 වැනි දින ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ සාක්ෂි සුපරීක්ෂාකාරීව ඇගයීමට යටත්ව මෙම අතුරු වාර්තාව ප්‍රකාශයට පත්කරන ලදී. නඩු පැවරීම සඳහා ප්‍රමාණවත් පියවර ගැනීම, සිවිල් කටයුතු ආරම්භ කිරීම, සහ පරිසරය, ජාතික ආර්ථිකය, ව්‍යසනයේ බලපෑමට ලක්වූ ප්‍රජාවන්ගේ ජීවනෝපාය වෙත එල්ල වූ හානිය සලකා වන්දි ලබාගැනීමට නඩු ගොනු කිරීම යන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ පාර්ශවයෙන් කටයුතු කිරීමට අපොහොසත්වීමේ ප්‍රතිඵල වශයෙන් ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 12(1) අනුව සමතාවය හා නීතියේ රැකවරණ සර්ව සාධාරණත්වය සහ 14(1)උ අනුව යම් නීත්‍යානුකූල රැකියාවක නියුක්තවීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවූ බව පෙත්සම්කරුවන් විසින් චෝදනා කර සිටී. තව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම්, එහි රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ, විශේෂයෙන් 27(14) ව්‍යවස්ථාව - "ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩිදියුණු කළ යුත්තේ ය" සහ 27(2) (ඇ) ප්‍රකාර සියලු පුරවැසියන් විසින් ප්‍රමාණවත් ජීවන මට්ටමක් අත්කර ගැනීම මගින් තවදුරටත් සනාථ කර තිබේ. මෙම වාතාවරණය හමුවේ, කොමිෂන් සභාව විසින් පහත නිර්දේශ ඉදිරිපත් කර තිබේ:

(අ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ පැහැදිලි සම්බන්ධීකරණයකින් යුතුව 2023 මැයි 19 වැනි දින වශයෙන් සඳහන් වන එකී කටයුතු නිමාකළ යුතු දිනයට පෙර වහාම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය යටතේ යෝග්‍ය සිවිල් නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නීතිපතිවරයා වෙත නියෝග කිරීම.

(ආ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ආයතන දෙකක් සහ සිංගප්පූරුව තුළ ලියාපදිංචි ආයතනවලින් අවම වශයෙන් එක් ආයතනයක් ද ඇතුළුව සංස්ථාපිත ආයතන කිහිපයකට එරෙහිව සිවිල් නඩු කටයුතු ආරම්භ කිරීම.

(ඇ) වෙනත් කරුණු ද ඇතුළුව ශ්‍රී ලංකාවේ අධිකරණවල නියමිත කාල වකවානුව තුළ සිවිල් වගකීම යටතේ නඩු නොපැවරීමේ තීරණය සහ එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය ව්‍යසනයට අදාළ විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ අනෙකුත් සියලුම තීරණ සම්බන්ධයෙන් සියලු රජයේ අධිකාරීන් විසින් පුළුල් වශයෙන් මහජනතාව වෙත සිදුවිය වගවීමේ මාර්ග නිශ්චය කිරීමේ සහ තහවුරු කිරීමේ අරමුණින් ස්වාධීන විමර්ශන මණ්ඩලයක් ස්ථාපිත කිරීම.

### 4.3.3. ජාත්‍යන්තර ප්‍රමිති අපරානුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීම

ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් අපරානුමත කිරීම නිර්දේශ කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 (ඉ) වගන්තිය යටතේ කොමිෂන් සභාවට බලය පැවරී ඇත. මෙම සම්මුතීන්වලට අමතරව, අතිරේක සාධන පත්‍ර අපරානුමත කිරීම හෝ ඒවා වෙත ප්‍රවේශ වීම සඳහා ශ්‍රී ලංකාවට ඇති විභවය තක්සේරු කිරීම පිණිස ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් පිළිබඳ නීතිය සමාලෝචනය කිරීම කොමිෂන් සභාව විසින් දැනට සිදුකර ගෙනයමින් පවතී. එවැනි සාධන පත්‍ර අතුරින් එකක් වනුයේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික

අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සඳහා වූ අතිරේක සන්ධාන පත්‍රය යි (එනම් තනි පුද්ගල පැමිණිලි කාර්ය පටිපාටිය සම්බන්ධයෙනි). බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ 31 වැනි වගන්තිය යටතේ තනි පුද්ගල පැමිණිලි කාර්ය පටිපාටිය පිළිගැනීමට ශ්‍රී ලංකාවට ඇති විභවය ද කොමිෂන් සභාව විසින් තක්සේරු කරමින් සිටී. ජාත්‍යන්තර ප්‍රමිති ක්‍රියාත්මක කිරීමට අදාළව අධිකාරීන් වෙත පහත නිර්දේශ කොමිෂන් සභාව විසින් සිදු කර තිබේ:

- මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කිරීම

1998 වර්ෂයේ දී, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේ දී, මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීමේ ප්‍රකාශය සම්මත විය. එසේ වුව ද, විශේෂයෙන් අත්අඩංගුවට ගැනීම්, රඳවාගැනීම් සහ ඔවුන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සඳහා නඩු පැවරීම්වලට ආදී වශයෙන් ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂකයින් විසින් සුවිශේෂී ගැටලු, සහ ඇතැම්විට ජයගත නොහැකි ගැටලුවලට මුහුණ දෙන බව කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි රාශියකින් පැහැදිලි වේ. ඔවුන් තුළ පවතින සද්භාවයෙන් යුතු අභිමතාර්ථ හමුවේ වුව ද, මානව හිමිකම් ආරක්ෂකයන් ප්‍රචණ්ඩත්වය, තර්ජන, පළිගැනීම්, බියවැද්දවීම්, යථාර්ථයෙන්ම හෝ නීත්‍යානුකූල අහිතකර වෙනස්ව සැලකීමේ කටයුතු, කරදර හිරිහැර, සහ වෙනත් අත්තනෝමතික ක්‍රියාවලට මුහුණ දෙන අතර බොහෝවිට මාධ්‍ය තුළ ද අපකීර්තියට පත් වේ.

මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම්වලට අදාළව රාජ්‍යය සතුව සුවිශේෂී බැඳීම්/ වගකීම් පවතී. පළමුව, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතු අතර, එම අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ අනවශ්‍ය ආකාරයෙන් සීමා කිරීම්වලින් වැළකී සිටිය යුතු ය. පුද්ගලික අංශ විසින් මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් ආරක්ෂා කිරීම පිණිස රාජ්‍යය විසින් සහතික වීම ද සිදුකළ යුතු ය. එවැනි උල්ලංඝනයවීම් සිදුවේ නම්, මානව හිමිකම් ආරක්ෂකයින් සඳහා ඵලදායි ප්‍රතිකර්ම ලබාදීම රාජ්‍යයේ වගකීම වේ.

මෙම වාතාවරණය හමුවේ, ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම් සඳහා වැදගත් ආකාරයෙන් ගරු කරන බව ආරක්ෂා කරන බව සහතික කිරීම පිණිස පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ සකස් කිරීමේ කඩිනම් අවශ්‍යතාවය කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සනිටුහන් කරමින් 2023 දෙසැම්බර් 11 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම සඳහා පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ එළිදක්වන ලදී.

- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිය වෙත ඉදිරිපත් කළ 2023 යෝජනාවට අනුමැතිය පළ කිරීම හා අනුග්‍රාහකත්වය සඳහා රජය වෙත නිර්දේශ කිරීම

2023 නොවැම්බර් 08 දිනැතිව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා යොමුකළ විධිමත් ඉල්ලීමක් ඔස්සේ ජාතික මානව හිමිකම් ආයතනය පිළිබඳ 2023 යෝජනාව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසියේ දී අනුමත කරගැනීම සඳහා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා රජයේ ප්‍රබල අනුමැතිය පළ කිරීම හා අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රජය වෙතින් ඉල්ලා සිටින ලදී. එකී යෝජනාව සඳහා සම-අනුග්‍රාහකත්වය දරන ලෙස ද කොමිෂන් සභාව විසින් රජයෙන් ඉල්ලා සිටින ලදී (වැඩි විස්තර සඳහා පහත 6.1 බලන්න).

## 4.4. අධීක්ෂණ කාර්යයන්

### 4.4.1. නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම

කොමිෂන් සභාවේ පෙර ක්‍රමෝපායික සැලැස්මේ හඳුනාගෙන තිබූ ඉලක්ක අතුරින් එකක් වන “ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විභාග කිරීමේ, විමර්ශන සහ අධීක්ෂණ යාන්ත්‍රණය සවිමත් කිරීම මගින් කඩිනම් සහ ඵලදායි විසඳුම් ලබාදීම” යන ඉලක්කයට අනුකූලව, කොමිෂන් සභාව විසින් නිකුත් කරන නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපිත කරන ලද පරීක්ෂණ සහ විමර්ශන අංශයේ ක්‍රියාත්මක නොකිරීම් පිළිබඳ ඒකකය 2023 වර්ෂයේ සිට සක්‍රියව පැවතිණි. නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව විභාග කිරීම පිණිස ආයතන කිහිපයක් කොමිෂන් සභාව හමුවට කැඳවන ලදී. මීට අමතරව, කොමිෂන් සභාව විසින් නිකුත් කරන නිර්දේශ ක්‍රියාත්මක නොකළ අදාළ සියලු ආයතනවලට පොදු පසු විපරම් ලිපි යොමු කර ඇත.

ක්‍රියාත්මක නොකිරීම් පිළිබඳ ඒකකයේ එවැනි ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ ආයතන විසින් එම නියෝග සම්බන්ධයෙන් අවධානය යොමු කර, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සඳහන් කරමින් කොමිෂන් සභාව වෙත ප්‍රතිචාර යොමුකර තිබේ.

තව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කළ නිර්දේශ යළි සලකා බලන ලෙසට අභියාචනා ආකාරයෙන් ඉල්ලීම් ද ලැබේ. එවැනි අභියාචනා සඳහා අනුරූපීව, කොමිෂන් සභාවේ සභාපති ඉදිරියේ පැමිණිලි විභාග කිරීමට තීරණය කර තිබේ. එවැනි විභාග කිරීම් වලින් අනතුරුව, එකී නිර්දේශ ඉවත් කරගනු ලබන්නේ ද හෝ ඉවත් කරගනු නොලබන්නේ ද යන්න සම්බන්ධයෙන් තීරණයන් ගනු ලැබේ.

### *4.4.2. රඳවා ගැනීමේ ස්ථාන සහ සත්කාර නිවාස අධීක්ෂණය*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 11(ඇ) වගන්තිය යටතේ '*අධිකරණමය ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභසිද්ධිය, ඔවුන් රඳවාගෙන සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීමෙන් සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවාගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම*' ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලය පැවරී තිබේ. ඒ අනුව, කොමිෂන් සභාව විසින් නියමිත කාලාන්තර තුළ දී පොලිස් ස්ථාන සහ බන්ධනාගාර ද ඇතුළුව එවැනි රැඳවුම් ස්ථාන වෙත සංචාරයන් සිදුකරනු ලැබේ.

තව ද, යම් තැනැත්තෙකුගේ පුද්ගලික නිදහස අහිමිවෙන ස්ථාන සම්බන්ධයෙන් විමර්ශනය සහ සුපරීක්ෂණය සඳහා සීමා රහිත ප්‍රවේශයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 සහ 11 වැනි වගන්ති යටතේ හිමි වේ. මෙවැනි සංචාර පූර්ව වශයෙන් ප්‍රසිද්ධියට පත්කරනු නොලැබේ. ශාරීරික වධහිංසා පමුණුවාලීමේ සිද්ධි වැළැක්වීම සඳහා අනෙකුත් අදාළ රජයේ ආයතන සහ රාජ්‍ය-නොවන ආයතන සමඟ සිදුකරන සම්බන්ධීකරණ සහ සහයෝගිතා ප්‍රයත්නවලට අමතරව, කාර්යක්ෂම පූර්ව ක්‍රියාකාරී සහ ප්‍රතිචාරාත්මක පියවර ඔස්සේ ශාරීරික වධහිංසා පමුණුවාලීමේ අවස්ථා සහ සිරභාරයේ සිටීමේ දී සිදුවන අනෙකුත් ආකාරවල හිමිකම් උල්ලංඝනයවීම් වැළැක්වීම, එවැනි උල්ලංඝනය කිරීම් සිදුකරන නිලධාරීන් හඳුනාගැනීම සඳහා පියවර ආරම්භ කිරීම සහ ප්‍රතිකර්ම වශයෙන් වූ පියවර නිර්දේශ කිරීම මෙම සංචාරවල අරමුණ වේ.

දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක දුරකතන පහසුකම ද සහිත කවුන්ටරයක් ක්‍රියාත්මකව පවතින අතර ඒ සඳහා වධහිංසා පැමිණවීම්, නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් ආදී කටයුතුවලට අදාළ පැමිණිලි රාශියක් ඒ වෙත යොමු වේ. අදාළ බලධාරීන් සමඟ සම්බන්ධ වෙමින් කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ක්ෂණික සංචාර සිදුකිරීම ඔස්සේ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන සිදුකරනු ලැබේ. පොලිස් ස්ථාන වෙත සිදුකරන සංචාරවලට අමතරව, ශ්‍රී ලංකා පොලීසිය යටතේ පවතින ත්‍රස්ත විමර්ශන අංශය (TID) සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) වෙත ද කොමිෂන් සභාව විසින් විශේෂ සංචාරයන් සිදුකරනු ලැබේ.

පොලිස් ස්ථාන වෙත සිදුකරන සංචාරවල දී හඳුනාගත් පොදු ගැටලු වනුයේ:

- රඳවාගැනීමේ කටයුතුවලට අදාළ ලේඛනය ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම
- අත්අඩංගුවට ගැනීම්වල දී ඊට නියමිත ක්‍රියාවලිය අනුගමනය කිසෲිමට අපොහොසත්වීම
- සිරභාරයේ සිටීමේ දී අසතුටුදායක අයුරින් සත්කාර කිරීම හා වධහිංසා පමුණුවාලීම
- සැකකරුවන් අධිකරණය ඉදිරියට පමුණුවාලීමේ ප්‍රමාදයන්
- සැකකරුවන් රඳවන ස්ථානවල රැඳවුම්කරුවන්ගේ අධික සනත්වය හා මූලික අවශ්‍යතා හා සනීපාරක්ෂක පහසුකම් නොපැවතීම

පොලිස් ස්ථාන නියමිත කාලාන්තරවලදී අධීක්ෂණය කිරීමට අමතරව, කොමිෂන් සභාව විසින් බන්ධනාගාර, රිමාන්ඩ් නිවාස, තාවකාලික රැඳවුම් ස්ථාන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන, සහ ළමුන් සඳහා නිවාස, ආබාධිත තැනැත්තන් සඳහා නිවාස සහ සංක්‍රමණික රැඳවුම් මධ්‍යස්ථාන වැනි අනෙකුත් රැඳවුම් ස්ථාන වෙතද සංචාරයන් සිදුකරනු ලැබේ. කොමිෂන් සභාව විසින් සති අන්ත දින ද ඇතුළුව සතිය මුළුල්ලේ මෙම ස්ථාන වෙත පූර්ව දැනුම්දීම් වලින් තොරව සංචාර සිදුකරනු ලබන අතර වධහිංසා පමුණාලීම හා අසතුටුදායක අයුරින් සැලකීම සම්බන්ධයෙන් රැඳවියන් විසින් සිදුකරන චෝදනා පිළිබඳව විමර්ශනය කරනු ලැබේ. විශේෂයෙන්, බන්ධනාගාර වෙත මාසයකට වරක් සංචාරය කරනු ලැබේ. ඉල්ලීම මත, වසර තුළ ඊට වැඩි සංචාර සංඛ්‍යාවක්ද සිදුකරනු ලැබේ. සෞඛ්‍ය පිළිබඳව ඇති අයිතිවාසිකම් උල්ලංඝනය වීම, පවුල් සමඟ ඇතුළුව පිටස්තරයන් සමඟ පවතින සම්බන්ධතා, අභ්‍යන්තර ආරක්ෂක පහසුකම් නොතිබීම වැනි ගැටලු කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර තිබේ. අදාළ බලධාරීන් සමල සාකච්ඡා කර ඇතැම් ගැටලු ක්ෂණිකව විසඳීම සිදුකර තිබේ.

සාමාන්‍යයෙන්, මෙවැනි සංචාර ප්‍රාදේශීය කාර්යාල හරහා සිදුකෙරේ. රඳවා ගැනීමේ මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ සිට රැඳවියන්ගේ අයිතිවාසිකම් සහතික කිරීම දක්වා කොමිෂන් සභාවට පැවරී ඇති බලය ප්‍රකාරව, එකී කටයුතු ව්‍යාප්ත කිරීම පුළුල් කිරීමේ දී ප්‍රාදේශීය සහ උප-කාර්යාලවල අධීක්ෂණ ක්‍රියාකාරකම් වඩාත් වැදගත් වේ.

### 4.4.3. එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවල සේවය සඳහා ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා පිරිස් නියුක්ත කරවීම පිළිබඳව පරික්ෂාකාරීව සලකා බැලීම

2017 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා රජය විසින් සිදුකළ ඉල්ලීමකට අනුව, එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම් සඳහා එක්සත්

ජාතීන්ගේ සාමසාධක හමුදා නියුක්ත කරවීම පිළිබඳව පරික්ෂාකාරීව සලකා බැලීම කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. මානව හිමිකම් ගරුත්වය හා කැපවීම ද ඇතුළුව ඉහළතම අවංකත්වයක් මෙම කටයුතුවල නියුක්ත කරවන පිරිස් සපුරාලීම මෙම ක්‍රියාවලියේ දී සහතික කෙරේ. 2023 වර්ෂයේ දී 410ක් වූ සන්නද්ධ හමුදා භට පිරිසක්, එනම් ශ්‍රී ලංකා යුධ හමුදාවේ 291ක්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 118ක් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ එක් අයෙකු එසේ සේවයේ යෙදවීම කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර තහවුරු කරන ලදී.

### 4.4.4. වධහිංසා පමුණුවාලීමට එරෙහි සම්මුතිය (OPCAT) යටතේ ජාතික නිවාරක යාන්ත්‍රණය

'ආරක්ෂක' කෘත්‍යයක් අයත්වන රඳවාගැනීමේ ස්ථාන වෙත සිදුකරන සංචාරවලට අමතරව, වධහිංසා පමුණුවාලීමට එරෙහි සම්මුතිය විකල්ප සන්ධාන පත්‍රය (OPCAT) යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික නිවාරක යාන්ත්‍රණය (NPM) ලෙස කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාව විසින් වධහිංසා පමුණුවාලීමට එරෙහි සම්මුතිය විකල්ප සන්ධාන පත්‍රය (OPCAT) අපරානුමත කිරීමත් සමඟ අමාත්‍ය මණ්ඩලය විසින් 2017 වර්ෂයේ දී ලබාදුන් තීරණය සමගින් ශ්‍රී රජය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික නිවාරක යාන්ත්‍රණය (NPM) නම් කෙරිනි. 2022 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් ජාතික නිවාරක යාන්ත්‍රණය විධිමත්ව ස්ථාපනය කරන ලදී.

ජාතික නිවාරක යාන්ත්‍රණය, නිශ්චිත නීතියක් යටතේ ස්ථාපිත කර නොතිබුණ ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 11 (ඈ) වගන්තියයේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාවට ජාතික නිවාරක යාන්ත්‍රණය ලෙස ක්‍රියාත්මක විය හැකි ය. රැඳවියන්ගේ සුභසාධනය අධීක්ෂණය කිරීමේ බලය කොමිෂන් සභාව සතු බව එකී වගන්තියේ දැක්වේ. එසේම පනතේ 14 වැනි වගන්තියට අනුව, 'කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීමෙන් හෝ පැමිණිල්ලක් මත විමර්ශනය කළ හැකි බවට' සඳහන් වන අතර එහිම 28(2) වගන්තියට අනුව ඕනෑම රැඳවුම් ස්ථානයකට කලින් නොදන්වා සහ කවර හෝ වේලාවක දී ඇතුළුවීමට කොමිෂන් සභාවට බලය ඇත. ජාතික නිවාරක යාන්ත්‍රණය ස්ථාපනය කිරීමට ද බොහෝ පෙර කාලයක සිට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම බලය 1997 වර්ෂයේ සිට භාවිතා කරනු ලැබේ.

රැඳවුම් ස්ථානවල දී වධහිංසා පමුණුවාලීම් සම්බන්ධ අභියෝග හඳුනාගැනීමට සහ ඒවා වළක්වා ගැනීම සඳහා යෝග්‍ය නිර්දේශ සිදුකිරීම සඳහා 2023 වර්ෂයේ දී ජාතික නිවාරක යාන්ත්‍රණය විසින් පහත සංචාරයන් සිදුකරන ලදී.

ජාතික නිවාරක යාන්ත්‍රණය යටතේ 2022 සහ 2023 වර්ෂයේ දී පරීක්ෂා කළ රැඳවුම් ස්ථාන සමහරක් වනුයේ ත්‍රස්ත විමර්ශන අංශයේ (TID) මූලස්ථානය, ත්‍රස්ත විමර්ශන අංශයේ රැඳවුම් මධ්‍යස්ථානය - පොල්හේන්ගොඩ, ත්‍රස්ත විමර්ශන අංශයේ රැඳවුම් මධ්‍යස්ථානය - චෛත්‍ය පාර, ත්‍රස්ත විමර්ශන අංශයේ රැඳවුම් මධ්‍යස්ථානය - තංගල්ල, කොළඹ අපරාධ අංශයේ (CCD) මූලස්ථානය සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) මූලස්ථානය යි.

2023 වර්ෂයේ දී ජාතික නිවාරක යාන්ත්‍රණය විසින් සිදුකළ සංචාර

| ස්ථානය/ ආයතනය | සංචාර සංඛ්‍යාව |
|---|---|
| ප්‍රති-ත්‍රස්ත විමර්ශන අංශය (CTID) | 01 |
| අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID) | 01 |
| බන්ධනාගාර | 10 |
| ළමා නිවාස | 12 |
| කාන්තා රැඳවුම් නිවාස | 05 |
| බාල අපරාධකරුවන්ගේ නිවාස | 01 |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන | 01 |
| නිවෙස් අහිමි තැනැත්තන් රැඳවුම් ස්ථාන | 01 |
| පොලිස් ස්ථාන | 02 |

**මූලාශ්‍රය: කොමිෂන් සභාවේ ජාතික නිවාරණ යාන්ත්‍රණ පිළිබඳ වාර්තා**

### *4.4.5. බන්ධනාගාර පිළිබඳව සිදුකළ ජාතික අධ්‍යයනයේ ප්‍රතිඵලවල ප්‍රගතිය*

රැඳවුම් ස්ථානය/ ස්ථාන වෙත සංචාර සිදුකර එම ස්ථානවල තත්ත්වය අධීක්ෂණය කර එකී තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් බන්ධනාගාර පිළිබඳ පළමු ජාතික අධ්‍යයනය 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනය 2020 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. මෙම අධ්‍යයනය තුළින් සිදුකළ අනාවරණය කරගැනීම් හා නිර්දේශ ඔස්සේ බන්ධනාගාර පද්ධතියේ පවතින හිඩැස්, දණ්ඩ සහ ප්‍රතිශෝධන පියවර සේම පුළුල් අපරාධ නීති පද්ධතිය සහ බන්ධනාගාර පද්ධතිය පිළිබඳ පොදු අවබෝධය සම්බන්ධයෙන් යොමු වී ඇත. එසේම, සමස්ත බන්ධනාගාර පද්ධතියේම අඩුපාඩු මෙහි දී අවධානයට ලක්කර තිබේ.

පූර්ණ වශයෙන් දඬුවම් කිරීමේ පියවරක් වශයෙන් සිරගත කිරීම වශයෙන් පවතින අවබෝධය පුනරුත්ථාපන ක්‍රියාවලියක් බවට අවබෝධ වන සේ බන්ධනාගාර

නිලධාරින් අවබෝධය වෙනස් කිරීම ඔස්සේ සිරකරුවන් යළි සාර්ථක අන්දමින් සමාජය සමඟ ඒකාබද්ධවීම සහතික කිරීමේ අපේක්ෂාව  සඳහා බන්ධනාගාර නිලධාරින් වෙත පුහුණුවක් ලබාදීම අවශ්‍ය බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා ලදී. මීට අමතරව, පුනරුත්ථාපන කාර්යය සඳහා හිතකර වන ගැටුම් විසඳීම, ප්‍රචණ්ඩකාරී නොවන සන්නිවේදනය සහ සිරකරුවන් සමඟ සබඳතාවයක් ගොඩනඟා ගනුයේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරින්ට දැනුමක් නොමැති බව ද අවධානයට යොමු විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් JURE ව්‍යාපෘතිය මගින් අරමුදල් සම්පාදනය කර,  ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව  විසින් කොමිෂන් සභාව විසින් නිකුත් කළ බන්ධනාගාර අධ්‍යයනයේ නිර්දේශවලට අනුකූලව කලාප අටක බන්ධනාගාර නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු අටක් පවත්වන ලදී. යාපනය, මඩකලපුව, මහනුවර, බදුල්ල, මාතර, අම්පාර, වවුනියාව, සහ ත්‍රිකුණාමලය පිහිටි කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ 2023 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී පුහුණු පවත්වන ලදී.

වාර්තාකරණ වර්ෂයේ දී, යථෝක්තව සඳහන් කළ අධ්‍යයනයේ නිර්දේශවලට අනුකූලව,  බාල වයස්කාර වැරදිකරුවන්ගේ සුරක්ෂිතතාවය සහ මනා පැවැත්ම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව  විසින් පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. කොමිෂන් සභාවේ පුහුණු මාලාවේ පළමු අදියර වශයෙන් බාල වයස්කාර වැරදිකරුවන් නව දෙනෙකුගේ සහභාගිත්වයෙන් පුහුණු වැඩසටහනක් වටරැක පිහිටි බාල වයස්කාර වැරදිකරුවන්ගේ පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. ධනාත්මක චින්තනය වැනි මෙවලම් ඔස්සේ බාල වයස්කාර වැරදිකරුවන් නැවත සමාජය සමඟ ඒකාබද්ධවීමේ දී ඔවුන් තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීම සහ ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම මෙම පුහුණුවේ අභිප්‍රාය විය.

පුහුණු මාලාවේ දෙවැනි අදියර වශයෙන්, පුහුණු වැඩසටහනක් විශේෂයෙන් බාල වයස්කාර වැරදිකරුවන්ගේ පුහුණු ආයතනය සහ  පුහුණු පාසැල් වෙත සංචාරයන් හා අධීක්ෂණ කටයුතු සිදුකරන මානව හිමිකම් නිලධාරීන් සහ නීති නිලධාරීන් වෙනුවෙන් බාල වයස්කාර වැරදිකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති හා පරිචයන්, දේශීය නීති හා අධිකරණ රාමුව පිළිබඳ දැනුවත්බව, ශ්‍රී ලංකාවේ බාල වයස්කාර වැරදිකරුවන්ගේ තත්ත්වය, සහ රාජකාරි දරන්නන්ගේ භූමිකාව ඇතුළුව ඔවුන්ගේ ධාරිතා ගොඩනැංවීම සඳහා පවත්වන ලදී.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම පුහුණු මාලාවේ තෙවන හා අවසන් අදියර වශයෙන් වටරැක පිහිටි බාල වයස්කාර වැරදිකරුවන්ගේ පුහුණු ආයතනයේ බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් පුහුණු

වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණුවේ අරමුණ වූයේ බන්ධනාගාර පිළිබඳ ජාතික අධ්‍යයනයේ දී දක්වා ඇති බාල වයස්කාර වැරදිකරුවන්ගේ සුරක්ෂිතතාවය හා යහපැවැත්ම කෙරෙහි බලපෑමක් ඇතිකරන, මානව හිමිකම්, බාල වයස්කාර වැරදිකරුවන්ගේ අයිතිවාසිකම්, බන්ධනාගාර අවකාශය තුළ ජාත්‍යන්තර ප්‍රමිති හා පරිචයන්, සහ බාල වයස්කාර වැරදිකරුවන්ට අදාළ දේශීය නීති සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන්ට දැනුමක් නොමැතිවීම වැනි ඇතැම් ගැටලුවලට විසඳුමක් ලබාදීම යි. බාල වයස්කාර වැරදිකරුවන්ගේ වගකීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත මාරු කළ යුතු බව බන්ධනාගාර නිලධාරීන්ගේ අදහස විය. මේ සම්බන්ධයෙන් වූ ඔවුන්ගේ අදහස වෙනස් කිරීමට හා හවුල්කාරිත්ව වගකීම හා අදාළ පාර්ශවකරුවන්ගේ ඒකාබද්ධ ආයතනික ජාලයක් සඳහා වන අවශ්‍යතාවය පිළිබඳ හැඳිනගැනීම ඔස්සේ ඔවුන්ගේ සහයෝගිතාවය වැඩිදියුණු කිරීමට මෙම පුහුණුව උපයෝගී විය.

## 4.5. විමර්ශන

### 4.5.1. ලැබී ඇති පැමිණිලි පිළිබඳව

නඩුවේ ස්වභාවය, පෙත්සම්කරුවන් හා වගඋත්තරකරුවන් පිළිබඳ විස්තර, වගකිවයුතු විමර්ශන නිලධාරීන්, නඩුවේ තත්ත්වය වැනි සෑම නඩු කටයුත්තකම ප්‍රධාන විස්තර හඳුනාගැනීම සඳහා පරීක්ෂණ සහ විමර්ශන අංශය විසින් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලැබේ. කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය යටතට පැමිණිල්ල අයත් වේ නම් සහ බැලූ බැල්මට පෙනෙන පරිදි හිමිකම් උල්ලංඝනය වීමක් ප්‍රකට වේ නම්, වගඋත්තරකරුවන්ගෙන් වාර්තා ලබාගැනීම, පෙත්සම්කරුවන්ගෙන් සාක්ෂි රැස්කර ගැනීම, වාර්තා සඳහා නිරීක්ෂණ ලබාගැනීම ආදි කටයුතු සිදුකර මූලික විමර්ශනයක් පවත්වනු ලැබේ. හිමිකම් උල්ලංඝනයවීමේ බරපතලකම තක්සේරු කිරීම සඳහා සෑම වාර්තාවක් පිළිබඳවම මනා විශ්ලේෂණයක් සිදු කෙරේ. ඉන් අනතුරුව, කරුණු විභාග කිරීම සඳහා අදාළ පාර්ශවයන් සාමූහිකව හෝ තනි තනිව කැඳවීම සිදු කෙරේ. කරුණු විභාග කිරීම සිදුකර, මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව නිර්දේශ නිකුත් කිරීම, හිමිකම් උල්ලංඝනය වීම් නිවැරදි කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු නියෝග අදාළ අධිකාරීන් වෙත ලබාදීම සිදු කෙරේ (නිර්දේශ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා ඉහත 3.3 සහ පරිශිෂ්ටය 2 බලන්න).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට අයත් නොවන පැමිණිලි අනෙකුත් අදාළ රජයේ ආයතන වෙත යොමු කෙරේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිසම, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, කම්කරු කොමසාරිස්, නීති ආධාර කොමිසම එසේ පැමිණිලි යොමු කරන වෙනත් පාර්ශව යටතට ඇතුළත් වේ. යෝග්‍ය වාතාවරණයන් යටතේ පාර්ශවයන් අතර සාමදාන කිරීම් හා බේරුම් කිරීම් සිදුකිරීමට පහසුකම් සැලසීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පැවරී ඇත.

කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය විසින් යොමුකරන හා ප්‍රාදේශීය කාර්යාලවල සෘජුවම ගොනු කරන පැමිණිලි සම්බන්ධයෙන් මූලික විමර්ශන/ විභාග කිරීම් සිදුකරනු ලැබේ. මූලික විමර්ශන අවසන්වීමෙන් අනතුරුව, අදාළ සිද්ධිය පිළිබඳ වාර්තාව ඇතුළත් ගොනුව එහි විභාග කිරීම් පිළිබඳ වාර්තාව ද සමඟ ප්‍රධාන කාර්යාලයට යොමු කෙරේ.

අධිකරණ ඉදිරියේ විභාග වෙමින් පවතින නඩු සම්බන්ධයෙන් මැදිහත්වීමක් (ඒ පිළිබඳව සලකා බැලීම/ කටයුතු කිරීම) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු නොකරයි.

### 4.5.2. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්ව මෙහෙයවීමෙන් ආරම්භ කරන විමර්ශන (suo motu interventions)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවට එහි ස්ව මෙහෙයවීමෙන් (*suo motu*) ඇතැම් ගැටලුවලට මැදිහත් විය හැකි ය. බොහෝවිට ප්‍රමුඛතාවය ලබාදිය යුතු ගැටලු, මාධ්‍ය නිරීක්ෂණය ඔස්සේ හඳුනාගන්නා මැදිහත්වීමේ අවශ්‍යතාවය, සහ කොමිෂන් සභාවේ අවධානයට තනි තනි පුද්ගලයන් හෝ සංවිධාන විසින් රැගෙන එන ගැටලු මීට අයත් වේ. පරීක්ෂණ සහ විමර්ශන අංශයේ සහ පර්යේෂණ සහ අධීක්ෂණ අංශයේ සමීප සහයෝගිතාවයෙන් මෙම කාර්යය සිදු කෙරේ. 2023 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් විවිධ සිද්ධිවලට අදාළව *suo motu* විභාගකිරීම් 23ක් පවත්වා ඇත (තනි තනි පුද්ගලයන් සම්බන්ධිත *suo motu* විභාගකිරීම් සඳහා පහත 5.2 සහ *suo motu* විභාගකිරීම්වල සම්පූර්ණ ලැයිස්තුව සඳහා පරිශිෂ්ටය 3 බලන්න).

## 4.6. අධ්‍යාපනික හා කොමිෂන් සභාව ප්‍රජාවට සමීපස්ථ වීමේ කාර්යයන්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 වැනි වගන්තියෙන් පැවරී ඇති බලය ප්‍රකාරව, මානව හිමිකම් ගැටලුවලට අදාළව පොදු ජනතාවගේ දැනුවත්භාවය හා සංවේදිතාවය ඉහළ නැංවීම සඳහා සක්‍රිය ආකාරයෙන් නිරතවීමට කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරනු ලැබේ. කොමිෂන් සභාව පැවතීමේ මූලික අරමුණ වනුයේ පුරවැසියන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම බැවින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යයන්වල ඒකාබද්ධ වූ අංගයක් ලෙස පොදු ජනතාව සලකනු ලැබේ. පුරවැසියන්ගේ සාමූහික චෛතන්‍යයක් තුළ මානව හිමිකම් මතු කර දැක්වීමට කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරන අතර මානව හිමිකම් වැඩිදියුණු වන සමාජයක් හා සංස්කෘතියක් බිහිකිරීම දිරිමත් කෙරේ. එබැවින්, මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා රුකුලක් වූ එවැනි අවස්ථා රාශියක් කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ දී ආරම්භ කිරීම/ දියත් කිරීම සිදුකරන ලදී.

### 4.5.3. මානව හිමිකම් සම්බන්ධිත ප්‍රතිමාන සහ ගැටලු පිළිබඳව දැනුවත්බව ඉහළ නැංවීම

### අ) ජාත්‍යන්තර සැමරුම් දින උත්සවාකාරයෙන් සැමරීම

- ජාත්‍යන්තර මානව හිමිකම් දිනය -2023

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 දෙසැම්බර් මස 11 වැනි දිනැතිව ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 75 වන සංවත්සරය සමරන ලදී. "සැමට ගරුත්වය, නිදහස හා සාධාරණත්වය" එහි තේමාව විය. මෙම සමරු උත්සවය සභාපතිතුමා විසින් මෙහෙයවන ලද අතර වෙනත් කොමසාරිස්වරුන් ද මෙම අවස්ථාවට සහභාගී විය. රාජ්‍ය නිලධාරීන්, අමාත්‍යාංශ නිලධාරීන් සහ සිවිල් සමාජ නියෝජිතයින් විසින් මානව හිමිකම් මූලධර්මවල ප්‍රගමනය උදෙසා සාමූහික කැපවීම අවශ්‍ය බව අවධාරනය



කරන ලදී. මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු සභාපතිනිය වන මානව හිමිකම්

ක්‍රියාකාරිනී ආචාර්ය රාධිකා කුමාරස්වාමි මහත්මිය මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුතත්තා වශයෙන් සහභාගී විය.



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම අවස්ථාවේ දී *"මානව හිමිකම් ආරක්ෂාකරන්නන් සුරැකීම සඳහා පොදු මාර්ගෝපදේශ හා නිර්දේශ"*, *"ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ රෝගීන්ගේ සෞඛ්‍ය හා නිදහස සඳහා පවතින අයිතිය පිළිබඳ තොරතුරු සෙවීමේ මෙහෙයුම"* සම්බන්ධ වාර්තාව, සහ *"අත්අඩංගුවේ දී සිටියදී සහ එදිරිවාදී ලෙස හමුවීමේ දී සිදුවන මරණ වළක්වාගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සහ වෙනත් අධිකාරීන් වෙත නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ"* එළි දක්වන ලදී. මෙම මාර්ගෝපදේශ/ වාර්තා නිකුත් කිරීම බරපතල මානව හිමිකම් ගැටලු නිරාකරණය කිරීම සහ විවිධ අංශ තුළ වගවීම ඉහළ නැංවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ වගවීම ඉහළ නැංවීම අවධාරණය කරනු ලැබේ.



මෙම අවස්ථාව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන පාර්ශ්වකරුවන් අතර සංවාදය සහ සහයෝගීත්වය වර්ධනය කිරීම සඳහා වේදිකාවක් වශයෙන් පැවතිණි. වඩාත් සාධාරණ මෙන්ම අපක්ෂපාතී සමාජයක් උරුම කරගැනීමට මහත් පරිශ්‍රමයක යෙදෙන ජාතියක් වශයෙන් ජාතික මානව හිමිකම් දින සැමරුම ඉදිරි පරම්පරා සඳහා මානව හිමිකම් සුරැකීමේ සාමූහික ප්‍රයත්නයන්හි නිරතවීමේ වැදගත්කම ඉස්මතු කරමින් සැමට ගරුත්වය, නිදහස හා සාධරණය යන අගයයන් අඛණ්ඩව පවත්වා ගැනීම අවධාරණය කරයි.

- වධ හිංසනයට ගොදුරුවන්නන්ට උපකාර කිරීමේ ජාත්‍යන්තර දිනය - **2023**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දිවයින පුරා පොලිස් ස්ථාන නියෝජනය කරනු ලබන උප පොලිස් පරීක්ෂකවරුන් 170 දෙනෙකු සඳහා වැඩසටහනක් 2023 ජූනි මස 26 වන දින කළුතර පොලිස් අභ්‍යාස ආයතනයේ දී පවත්වන ලදී. අපරාධ, රථවාහන, සුළු වැරදි ආදී අංශ භාර ස්ථානාධිපතිවරු මේ සඳහා සහභාගී වූහ.




ජාත්‍යන්තර මානව හිමිකම් හා ආශ්‍රිත නීති සහ ඒවායේ යෙදවුම්, අදාළ දේශීය ව්‍යවස්ථාත්මක සහ ව්‍යවස්ථාදායක විධිවිධාන, වධහිංසනයෙන් නිදහස ලැබීම හා ආශ්‍රිත ව්‍යවස්ථාමය හා ව්‍යවස්ථාදායක විධිවිධානවල නෛතික අර්ථකතනය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ආදී පිළියම් යෙදීමේ ආයතන විසින් සපයන ලද සේවා සහ එවැනි අවස්ථා සම්බන්ධයෙන් ආයතනයෙහි භූමිකාව ආදී මාතෘකා මෙහිදී සහභාගීවූවන් වෙත ඉදිරිපත් කරන ලදී.

## *ආ) විවිධ අවධානිත කණ්ඩායම් සඳහා පුහුණු සහ සාකච්ඡා*

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තම ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල මඟින් වෙනත් රාජ්‍ය ආයතන විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සඳහා සම්පත් දායකයින් සැපයීමෙන් සහ කොමිෂන් සභාවට අදාළ මාතෘකා සම්බන්ධයෙන් වන සාකච්ඡා සඳහා සක්‍රිය දායකත්වය සපයමින් සහයෝගය දක්වයි. 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පුළුල් පරාසයක අභිමත විෂය ක්ෂේත්‍ර පිළිබඳ දේශන පවත්වන ලද අතර සාකච්ඡා සඳහා ද සහභාගී විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත සඳහන් තෝරාගත් අවස්ථා සඳහා දායකත්වය සැපයීය:

    - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වතු අංශයේ සේවකයින්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමට සහ වතු අංශයේ සේවකයින්ට සම ප්‍රවේශයක් සහිතව සෞඛ්‍ය ජාලයක් ස්ථාපනය කිරීම අරමුණු කරගනිමින් රත්නපුර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 05 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් 2023 වර්ෂයේ ජූලි සිට නොවැම්බර් මස දක්වා පවත්වන ලදී
    - විනය/ ප්‍රජා අධ්‍යයනය විෂයභාර ගුරුවරුන් සඳහා දෙදින පුහුණු වැඩසටහනක් මාතර, බදුල්ල සහ අනුරාධපුරයේ දී පැවැත්විණි.
    - වධ හිංසාව පිළිබඳ ජාතික නිවාරක යාන්ත්‍රණය පිළිබඳ ජාතික උපදේශනයක් 2023 නොවැම්බර් 30 වැනි දින පැවැත්විණි.
    - පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරීක්ෂකවරුන් පිරිසක් සහ වෙනත් පොලිස් නිලධාරීන් පිරිසක් ඉලක්ක කරගනිමින් මීගමුව ජාතික පොලිස් අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ජාත්‍යන්තර නීතිය, කාන්තා අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් යන

විවිධ තේමා පිළිබඳව යම් කාල පරිච්ඡේදයකට වරක් පැවැත්වෙන වැඩමුළුවල එක් අංගයක් වශයෙන් ඒ පිළිබඳව දැනුවත්බව ඉහළ නැංවීමේ දේශනමාලාවක් සූම් තාක්ෂණය සහ මයික්‍රොසොෆ්ට් ටීම්ස් තාක්ෂණය ඔස්සේ ක්‍රමානුකූලව වසර පුරා පැවැත්විණි.

- ආබාධ සහිත පුද්ගලයන්ගෙන් 3%ක ප්‍රතිශතයක් සඳහා රාජ්‍ය සේවයේ සේවා නියුක්තිය සපයනු ලබන 1988 අංක 27/28 දරන චක්‍රලේඛය සමාලෝචනය සහ සංශෝධනය කිරීම සඳහා JURE ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 ජූලි 19 වැනි දින වටමේස සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාව සඳහා රාජ්‍ය ආයතන සහ ආබාධිත ප්‍රජාව නියෝජනය කරමින් නියෝජිතයෝ සහභාගී වූහ. මෙම චක්‍රලේඛය සංශෝධනය කිරීම සඳහා මාර්ගෝපදේශ කොමිෂන් සභාව විසින් දැනට කෙටුම්පත් කරමින් සිටී. මෙම ප්‍රයත්නය ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව උපදේශන සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම තුළින් ආබාධිත පුද්ගලයන් සඳහා රැකියා අවස්ථා ලබාදීමට සම ප්‍රවේශය සැලසීම සඳහා විය.

- ජාතික මානසික සෞඛ්‍ය ආයතනය (NIMH) විසින් සිය හෙද කාර්ය මණ්ඩලය හා වෛද්‍යවරුන්ගේ දැනුම වැඩිකිරීමේ අරමුණින් එහි පරිශ්‍රය තුළ 2023 සැප්තැම්බර් මාසයේ දී සංවිධානය කළ සේවා ස්ථානවල සිදුවන ලිංගික හිංසනය පිළිබඳ වැඩමුළුව සඳහා දේශන සහාය ලබාදීම සිදුකරන ලදී.

- 2023 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය පුද්ගලයන් වෙත ලබාදීම සඳහා මාර්ගගත දුරස්ථ ඉගෙනුම් යාන්ත්‍රණයක් ක්‍රමවත්ව සකසන ලදී. මෙම සංකල්පය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන ලද්දේ විස්තීර්ණ දුරස්ථ අධ්‍යාපන යාන්ත්‍රණයක් සඳහා නිර්දේශය හා අන්තර්ගතය සංවර්ධනය කිරීම යි. මානව හිමිකම් පිළිබඳ මෙම පාඨමාලා මූලික, ප්‍රාරම්භ, අන්තර්මාධ්‍ය හා උසස් මට්ටමේ වශයෙන් විවිධ ප්‍රවීණතා මට්ටම් ආවරණය වන පරිදි ඕනෑම පුද්ගලයෙකුට/ පුද්ගලයන්ට අතථ්‍ය වශයෙන් ප්‍රවේශ විය හැකි ආකාරයෙන් නිර්මාණය කර තිබුණි. මෙහි සුවිශේෂී ඉලක්කය වන්නේ ආරම්භක මෙන්ම උසස් මට්ටම්වල ඉගෙනුම ලබන්නන් සඳහා අධ්‍යාපනය ලබාදෙමින් මානව හිමිකම් පිළිබඳ මහජනතාවගේ අවබෝධය මෙන්ම දැනුවත්භාවය වැඩිදියුණු කිරීම යි. 2023 වර්ෂ අවසානයේ දී අධ්‍යාපන උපදේශක විසින් සියලුම මට්ටම්වල පාඨමාලා සඳහා මොඩියුල සකස් කර තිබුණි. එම මොඩියුල 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.


- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බස්නාහිර, උතුර, ඌව සහ උතුරු මැද පළාත්වල ජීවත්වන ආබාධිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ්‍යතාවය වැඩිදියුණු කිරීස සඳහා ප්‍රවේශ්‍යතා විගණණ කණ්ඩායම් ස්ථාපනය කිරීමට එම පළාත්වල ආබාධිත පුද්ගලයන් සහ රජයේ නිලධාරීන් සඳහා ප්‍රවේශ්‍යතා විගණන පුහුණු පවත්වන ලදී. 2023 වර්ෂ අවසානය වනවිට, බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල මෙම පුහුණු අවසන් විය. මෙම පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවූවන් ද ආබාධිත පුද්ගලයන්ගේ හිමිකම් පිළිබඳව සංවේදිකරණය කරන ලදී. ආබාධිත පුද්ගල විගණණ කණ්ඩායම් රාජ්‍ය ආයතනවල ආබාධිත පුද්ගල ප්‍රවේශය පිළිබඳ විගණන පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ. එය ආබාධිත පුද්ගලයන්ගේ යටිතල අවශ්‍යතා ඉහළ නැංවීමට සහ පුද්ගල හිමිකම් සඳහා සහයෝගය දැක්වීමට ප්‍රථම පියවර වනු ඇත.

## *ඇ) උපදේශකත්වය සැපයීම*

රටෙහි තරුණ ප්‍රජාව ආශ්‍රයෙන් ආයෝජනය කිරීම, විශේෂයෙන්ම මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම තීරණාත්මක සහ ප්‍රගතිශීලී ඉදිරි පියවරක් වන සංදර්භය තුළ 2017 වර්ෂයේ දී පුනර්ජීවය ලද සීමාවාසික පුහුණු වැඩසටහන අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරන ලදී. ස්වේච්ඡාවෙන් සේවය කිරීමේ පදනම මත 2023 වර්ෂය පුරා ඕනෑම ශික්ෂාවක් යටතේ උපාධිය හදාරනු ලබන විද්‍යාර්ථීන්ගෙන් සහ මෑතක දී උපාධි ලද උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ භූමිකාව ඉටු කිරීම සඳහා පර්යේෂණ ඇතුළත්ව කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ තරුණ ප්‍රජාව තුළ පොදු යහපත සම්බන්ධ කටයුතුවල නියැලීම සඳහා වන කැපවීම වර්ධනය කරගැනීම සඳහා සාර්ථක අයදුම්කරුවන් යොමු කිරීම යි. සීමාවාසික පුහුණු අවම වශයෙන් මාස තුනක කාලයක් සඳහා නිර්මාණය කරන ලද අතර සීමාවාසික පුහුණුව ලබන්නන්ට අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරනවරුන්ගේ සමීප අධීක්ෂණය යටතේ ප්‍රධාන කාර්යාලයේ හෝ ප්‍රාදේශීය කාර්යාලයක පුහුණුව ලැබීම තෝරාගැනීමට අවස්ථාව ලබාදෙන ලදී, ඉහත වැඩසටහන පිළිබඳ දැන්වීම මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් පිටුවේ පළ කරන ලද අතර විද්‍යුත් තැපැල මගින් උපාධි ප්‍රදානය කරනු ලබන අධ්‍යාපන ආයතන දැනුවත් කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම සඳහා සීමාවාසික පුහුණුවන්නන් 145ක් 2023 වර්ෂයේ දී බඳවාගන්නා ලද අතර එය පූර්ව වර්ෂයේ බඳවාගන්නා ලද පුහුණුවන්නන් 89ට සාපේක්ෂව සැලකිය යුතු අන්දමෙන් ඉහළ

අගයකි. සීමාවාසික පුහුණුවන්නන් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල අතර බෙදී ගියේ පහත ආකාරයෙනි:




### *4.5.4 මාධ්‍ය සමඟ සම්බන්ධතාවය*

ආයතනය මහජනතාව සමඟ සමීපවීමේ උත්සාහයන්හි අංගයක් වශයෙන් කොමිෂන් සභාව විසින් ප්‍රචලිත කිරීම අත්‍යවශ්‍ය ලෙස සැලකෙන ප්‍රධාන කරුණු පිළිබඳව සහ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව මාධ්‍ය සමඟ සම්බන්ධතා පවත්වා ගන්නා ලදී. කොමිෂන් සභාව විසින් සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය මෙන්ම මාර්ගගත වේදිකාවන් ද ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගන්නා ලදී.

#### *අ) සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍ය හා ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය සමඟ කටයුතු කිරීම*

කොමිෂන් සභාවේ සියලුම ප්‍රතිපත්තිමය නිර්දේශ, මැදිහත්වීම් සහ උපදේශන ප්‍රකාශන මෙන්ම නියෝග කොමිෂන් සභාවේ වෙබ් අඩවියට උඩුගත කොට සාමාන්‍ය ජනතාවට ප්‍රවේශවීමට අවස්ථාව සලසා තිබේ. ඇතැම් අවස්ථාවලදී සිවිල් සමාජ සංවිධාන, කොමිෂන් සභාවේ තේමාත්මක උප-කමිටුවල සාමාජිකයන්, ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විදේශ ධූත කාර්යාල, අන්තර්ජාතික මානව හිමිකම්

සංවිධාන, ආසියා පැසිෆික් කලාපීය ජාතික මානව හිමිකම් ආයතන සන්ධානයේ සන්නිවේදන ජාලය, සහ , ආසියා පැසිෆික් කලාපීය ජාතික මානව හිමිකම් ආයතන සමඟ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් තොරතුරු හුවමාරු කරගනු ලැබේ. එබඳු යථාවත් කිරීම් සහ තොරතුරු මහජනතාවගේ දැනගැනීම පිණිස දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමේ විශේෂ උපදෙස් සහිතව කොමිෂන් සභාවේ සියලුම ප්‍රාදේශීය කාර්යාල වෙත ද යොමුකරනු ලැබේ. කොමිෂන් සභාව විසින් ආසියානු පැසිෆික් සංසදයේ ප්‍රවෘත්තිවල පළ කිරීමට ද තොරතුරු ව්‍යාප්ත කරනු ලබන අතර එම ප්‍රවෘත්ති කලාපය තුළ මෙන්ම ගෝලීය වශයෙන් පුළුල් ග්‍රාහක ප්‍රජාවක් සඳහා එමගින් තොරතුරු සපයනු ලැබේ.

### ආ) මාර්ගගත වේදිකා භාවිතය

කොමිෂන් සභාව විසින් ආයතනය වෙත ලැබුණු පැමිණිලි සඳහා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම සඳහා එහි නිරීක්ෂණ හා නිර්දේශ පිළිබඳ මහජන දැනුවත්භාවය ඇතිකිරීමට ෆේස්බුක් සහ ට්විටර් වැනි සමාජ මාධ්‍ය වේදිකා ක්‍රමවත්ව භාවිතා කරනු ලැබේ.

## 4.5.5 සිවිල් සමාජය සමඟ සම්බන්ධතාවය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විශේෂයෙන්ම ප්‍රාදේශීය කාර්යාල මගින් සිවිල් සමාජ සංවිධාන සමඟ සමීපව සම්බන්ධවී සිටී. කොමිෂන් සභාවේ කාර්යයන් සහ ක්‍රියාකාරකම් පෝෂණය කිරීමට සහයෝගය දක්වන සිවිල් සමාජ සංවිධාන ආයතනය විසින් ඉහළ සම්මානයට බඳුන් කරනු ලබන අතර කොමිෂන් සභාව විසින් විශේෂයෙන්ම මානව හිමිකම් හා සම්බන්ධ කාර්යන්හි නිරත සිවිල් සමාජ සංවිධානවල කටයුතු සඳහා දායකත්වය සපයනු ලැබේ. 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිවිල් සමාජයේ උපකාරය/ සම්බන්ධතාවය සහිතව සිය සංකල්ප දිවයින පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

### අ) ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු

ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු මගින් කොමිෂන් සභාව ලබන සමීප සහයෝගිත්වය, මානව හිමිකම් උල්ලංඝනය වීම් හෝ කොමිෂන් සභාවේ මැදිහත්වීම අවශ්‍ය අවස්ථා හඳුනාගෙන කොමිෂන් සභාවට සහයෝගය දැක්වීය. තව ද, මෙම සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය වශයෙන් මානව හිමිකම් සුරැකීමේ ක්‍රියාමාර්ග නිරීක්ෂණය සඳහා කොමිෂන් සභාවට සහයෝගය පළ කරයි. 2023 වර්ෂයේ දී කොමිෂන් සභාව මෙම සමිති සඳහා අඛණ්ඩව පහසුකම් සැපයීමේ නිරත විය.

### ආ) තේමාත්මක උප-කමිටුවල සාමාජිකයන් වශයෙන් සිවිල් සංවිධාන නියෝජිතවරුන්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තේමාත්මක උප කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කර කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා තවදුරත් සහයෝගය දැක්වීමට අවස්ථාව ලබා ගන්නා ලෙස සිවිල් සමාජයේ සහ සිවිල් සමාජ සංවිධානවල සියලුම සක්‍රිය සාමාජිකයින් වෙත ආරාධනා කරන ලදී. සිවිල් සමාජය උප - කමිටු ක්‍රියාකාරකම්වල නිරත වීම මඟින් කොමිෂන් සභාවට ස්වකීය ප්‍රතිපත්ති මට්ටමේ සංකල්ප/ ප්‍රයත්න වැඩිදියුණු කරගැනීමට වැඩිදියුණු කරගැනීමට ඒවායේ විශේෂඥ දැනුම සහ පළපුරුද්ද ලබාගැනීමේ අවස්ථාව හිමිවිය. (වැඩිදුර තොරතුරු සඳහා පහත 5.1 වෙත යොමු වන්න).

### ඇ) සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන විවිධ අවස්ථාවන් සඳහා සහභාගිත්වය

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ කාර්යමණ්ඩලය විසින් සිවිල් සමාජය විසින් සංවිධානය කරන ලද පහත ආකාරයේ අවස්ථා කිහිපයකට සහභාගී විය:

- VENASA සංවිධානය විසින් සංවිධානය කරන ලද LGBTQ ප්‍රජාවේ හිමිකම් පිළිබඳ සාකච්ඡාව
- පොදු මහජනතාව සඳහා වන නීති සහ මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද පොදු මානව හිමිකම් පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන
- Equity SL විසින් වන දින සංවිධානය කරන ලද 09 ජනවාරි මස 2023 LGBTQ පුද්ගලයින්ගේ විශ්ව වාර සමාලෝචනයේ (Universal Periodic Review) අනාවරණය කරගැනීම් ආශ්‍රිත සාකච්ඡාව

### ඇ) සිවිල් සමාජය සමඟ සාකච්ඡා පැවැත්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විසඳුම් ලබාදීම සඳහා සාකච්ඡා කිරීමට ස්වකීය අවශ්‍යතා හා දුක්ගැනවිලි ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස සිවිල් සමාජ සංවිධාන වෙත වර්ෂය ආරම්භයේ දී ආරාධනා කරන ලදී. එම සාකච්ඡා සඳහා උදාහරණ පහත පරිදි වේ:

- අපනයන සැකසුම් කලාපවල man power කාණ්ඩය යටතේ සේවය කරන සේවකයින්ගේ කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනයවීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් මැදිහත්වීමේ

හැකියාව පිළිබඳ රැස්වීමක් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ දී විශේෂඥ දැනුමැති තැනැත්තන් සහ අදාළ සිවිල් සංවිධානවල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 2023 අගෝස්තු මස 01 වැනි දින පවත්වන ලදී.

- වතු අංශයේ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල මානව හිමිකම් තහවුරු කරගැනීම සඳහා ඔවුන්ගේ පොදු අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරන කාර්යක්ෂම සිවිල් සමාජ ජාලයක් ඇතිකිරීම සඳහා ප්‍රජා මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමඟ සාකච්ඡාවක් කොමිෂන් සභාව විසින් 2023 නොවැම්බර් මස 04 වැනි දින හැටන් උප කාර්යාලයේ දී පවත්වන ලදී. මෙම අවස්ථාවට පුද්ගලයන් 52 ක් සහභාගි විය.

- ආබාධිත පුද්ගලයින්ගේ සංවිධානවල ඒකාබද්ධ පෙරමුණ සහ රජය අතර ආබාධිත පුද්ගලයින් දැනට මුහුණදෙන ගැටළු හා ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කරගැනීමට අනුගමනය කළ හැකි නිසි ප්‍රවේශ පිළිබඳ සාකච්ඡාවක් 2023 මාර්තු මස 21 දින පැවැත්විණි.

- LGBTQ පුද්ගලයින්ගේ යහපැවැත්ම පිළිබඳ සහ අදාළ ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එම ප්‍රජාවේ නියෝජිතයන් සමඟ 2023 අප්‍රේල් 19 දිනැතිව රැස්වීමක් පවත්වන ලදී.

- ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින්ට ස්වකීය අවශ්‍යතා හා නිර්දේශ හුවමාරු කරගැනීම සඳහා අවස්ථාව සලසා දීමට සහ කොමිෂන් සභාවට ස්වකීය වර්තමාන වැඩසටහන් සහ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීමට පැවති සාකච්ඡාවක් මානව හිමිකම් කොමිෂන් සභාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් අතර 2023 ඔක්තෝබර් 10 වැනි දින පවත්වන ලදී.

මීට අමතරව සිවිල් සමාජය සමඟ හැකිතාක් රැස්වීම් පැවැත්වීමට ප්‍රාදේශීය කාර්යාල වෙත උපදෙස් ලබාදෙන ලදී. මෙම නියෝග අනුව, ප්‍රාදේශීය කාර්යාල රැසක් සිවිල් සමාජ නියෝජිතයින් සමඟ රැස්වීම් පවත්වන ලද අතර ඔවුන්ගේ ගැටලු අවබෝධ කරගැනීමට සහ විසඳීමට කටයුතු කරන ලදී.

### ඉ) සිවිල් සමාජ සංවිධාන සඳහා පුහුණුව

2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිවිල් සමාජ සංවිධානවල සාමාජිකයන් සඳහා පුහුණුවීම් රැසක් සහ සංවේදීකරණ වැඩසටහන් රැසක් පවත්වන ලදී. පහත දැක්වෙන්නේ එබඳු පුහුණු කිහිපයකි:

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගීත්වයෙන් සාමාන්‍ය ජනතාව සඳහා මානව හිමිකම්මූලික මිනිස් / අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවක් මාතර දී පැවැත්විණි .
- මානව හිමිකම්ළමා ,ළමා අයිතිවාසිකම් ,මූලික මිනිස් අයිතිවාසිකම් , අපයෝජනය ආදී විවිධ තේමා ඔස්සේ සිසුන් ඉලක්ක කරගනිමින් දැනුවත් දේශවල පාසල් සහ ප්‍ර කල්මුණේ ආදී ,කිරීමේ වැඩසටහන් මාලාවත් අම්පාර .වෙනත් ආයතන පාදක කරගනිමින් පවත්වන ලදී
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සංවිධානය කළ ආබාධිත පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් මාතර හා ගාල්ලේ දී පැවැත්විණි .

මීට අමතරව පාසල් හා විශ්වවිද්‍යාල සිසුන්, සන්නද්ධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන්, රජයේ නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් ආදී වශයෙන් පුද්ගලයින්ගෙන් පුළුල් හරස්කඩක් පෞද්ගලිකව කොමිෂන් සභාව වෙත කැඳවා කොමිෂන් සභාව විසින් පළ කරන ලද අත් පත්‍රිකා, පෝස්ටර් ආදිය බෙදා දෙන ලදී. එම අවස්ථාවන්හි දී කොමිෂන් සභාව විසින් තම ආයතන පරිශ්‍රය තුළ මෙම කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීමට අවස්ථාව උදා කරගන්නා ලදී.

## *5 වැනි පරිච්ඡේදය: තේමාත්මක මැදිහත්වීම්*

***5.1.*** *තේමාත්මක උප කමිටු*
***5.2.*** *පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් මැදිහත්වීම්*
***5.2.1.*** *අත්අඩංගුවේදී සිදුවන මරණ සහ නීති විරෝධී ඝාතන*
***5.2.2*** *වධහිංසා පැමිණවීම*
***5.2.3.*** *පුද්ගල නිදහස සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය*
***5.2.4.*** *සාමකාමී ලෙස රැස්වීමේ අයිතිය*
***5.2.5.*** *ප්‍රකාශනයේ නිදහස*
***5.2.6.*** *සුළුතර අයිතිවාසිකම්*
***5.2.6. LGBTIQ*** *අයිතිවාසිකම්*
***5.2.7.*** *ළමා අයිතිවාසිකම් සහ අධ්‍යාපනයේ අයිතිය*
***5.2.8.*** *සෞඛ්‍ය අයිතිය*
***5.2.9.*** *ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්*
***5.2.10.*** *වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්*
***5.2.11.*** *ආදිවාසීන්ගේ අයිතිවාසිකම්*
***5.2.12.*** *ජීවත්වීමේ අයිතිය*

## 5.1. තේමාත්මක උප කමිටු

2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිශ්චිත තේමාත්මක කරුණු සඳහා උප කමිටු 09ක් පත්කරන ලදී. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 10 වන වගන්තිය යටතේ එහි අභිනියෝගය අනුව ශ්‍රී ලංකා රජයට සිදුකළ යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මෙම කමිටු විසින් එක් එක් තේමාවට අදාළ නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ නිල පිළිවෙත් සමාලෝචනය කර කරුණු ඉදිරිපත් කිරීම වැනි දේ අපේක්ෂා කෙරේ. තවද, අදාළ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික මැදිහත්වීම් පිළිබඳව උප කමිටු මගින් කොමිෂන් සභාවට උපදෙස් සැපයීම ද මෙමගින් අපේක්ෂා කරන තවත් අරමුණකි. මෙකී උප කමිටු වනුයේ;

1. ආබාධිත පුද්ගලයින් පිළිබඳ උප කමිටුව
2. අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ උප කමිටුව (මානව හිමිකම් දෘෂ්ටිකෝණයකින්)
3. LGBTIQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුව
4. වතුකරයේ සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුව
5. වධහිංසා පැමිණවීම සහ අත්අඩංගුවේදී හිරිහැරයට ලක්වීමවැළැක්වීම පිළිබඳ උප කමිටුව
6. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ උප කමිටුව
7. වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුව
8. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුව
9. සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුව

මෙම උප කමිටුවලට විශේෂඥයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුළත් වේ. සෑම කමිටුවකම කොමසාරිස්වරුන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු සභාපතිත්වය දරන අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් එක් එක් උප කමිටුවේ ලේකම්වරුන් ලෙස කටයුතු කරයි.

2023 වසර තුළ, පැරිස් මූලධර්මවලට අනුකූලව, කමිටුවල නියෝජනයේ විවිධත්වය වැඩි කිරීම සඳහා, කොමිෂන් සභාව විසින් උප කමිටුවල සංයුතිය සහ තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳ අභ්‍යන්තර සමාලෝචනය අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ වත්මන් සන්දර්භය තුළ අදාළ වන ගැටළු සම්බන්ධයෙන් නව උප කමිටු කිහිපයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

## 05.2. පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් මැදිහත්වීම්
### 5.2.1. අත්අඩංගුවේදී සිදුවන මරණ සහ නීති විරෝධී ඝාතන

පසුගිය සිව් වසර තුළ, ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හා සම්බන්ධ වූ අත්අඩංගුවේ දී මරණයට පත්වීම සහ නීති විරෝධී ඝාතන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. 2023 වර්ෂයේදී අත්අඩංගුවේ දී මරණයට පත්වීම සහ නීති විරෝධී ඝාතන වැළැක්වීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පහත සඳහන් මැදිහත්වීම් සිදු කළේය.

- අත්අඩංගුවේ දී සිදුවන මරණ වැළැක්වීමට සහ මුහුණදීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ දියත් කිරීම

අනාගතයේදී පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන මෙවැනි බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් වැළැක්වීමේ තීරණාත්මක අවශ්‍යතාවය හඳුනා ගනිමින්, කොමිෂන් සභාව විසින් "අත්අඩංගුවේ දී සිදුවන මරණ සහ නීති විරෝධී ඝාතන වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට අභියෝග තක්සේරු කිරීමේ මෙවලමක් සහ නිර්දේශිත මාර්ගෝපදේශ" සකස් කිරීම සඳහා බහුවිධ විනය කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව අත්අඩංගුවේ දී සිදුවන මරණ වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය වෙනුවෙන් සංවර්ධනය කරන ලද පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශයන්, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී 2023 දෙසැම්බර් 11 වන දිනට යෙදුනු ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීමේ උත්සවයේ දී පිළිගන්වන ලදී .

- පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ රඳවා සිටි පුද්ගලයෙකුගේ මරණයක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම. **(HRC/SUO/MOTU/01/23)**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විධිමත් පැමිණිල්ලක් රහිතව ස්වකීය යෝජනාවක් මතමේ පිළිබඳව ස්වේච්ඡාවෙන් පරීක්ෂණයක් ආරම්භ කළේය. මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයුමකට සම්බන්ධ බවට චෝදනා එල්ල කරමින් සැකකරුව 2023.01.10 වන දින අත්අඩංගුවට ගෙන තිබුණි. අත්අඩංගුවට ගැනීමෙන් පසු, එම පුද්ගලයා ප්‍රශ්න කිරීම්වලට අවනතවීම ප්‍රතික්ෂේප කරමින් කලබලයක් ඇති කළ බව කියනු ලැබේ. එම අවස්ථාවේදී පොලීසිය තත්ත්වය පාලනය කිරීමට උත්සාහ කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සැකකරු ඇද වැටී සිහිසුන් වූ බව පැවසේ. කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයේ දී සැකකරුගේ මරණය ස්වාභාවික හේතූන් මත සිදු නොවූ බවත් ඔහුගේ ශරීරයේ තුවාල කිහිපයක් දක්නට ලැබුණු බවත් අනාවරණය විය. විමර්ශනය අඛණ්ඩව සිදුකෙරෙමින් පවතී.

- විශේෂ කාර්ය බලකාය සමඟ ඇති වූ වෙඩි හුවමාරුවකින් මිනීමැරුමකට සැක කෙරෙන පුද්ගලයෙකු මරණයට පත්වීම.
  **(HRC/SUO/MOTU/20/23)**

දකුණු පළාතේ කරගොඩ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ හිටපු පොලිස් පරීක්ෂක බාලේන්ද්‍රසිංහ ඝාතනයේ සැකකරුවෙකු වන සංජීව ප්‍රේමකුමාර සිල්වා නැමැත්තාගේ මරණයට හේතු වූ වෙඩි හුවමාරුව සම්බන්ධයෙන් තවත් ස්වේච්ඡා පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. 2023 ඔක්තෝබර් 12 වන දින මීටියාගොඩදී විශේෂ කාර්ය සාධක බලකාය (STF) සමඟ ඇති වූ වෙඩි හුවමාරුවකදී සැකකරු තුවාල ලබා ඇති අතර, ඔහු අත්අඩංගුවට ගන්නා අතරතුර තුවාල ලබා බලපිටිය රෝහලේදී මිය ගියේය. කොමිෂන් සභාව විසින් පිලිවෙලින් 2023.10.31 සහ 2023.11.17 යන දිනවල වී.කා.,බ. මූලස්ථානයෙන් සහ මීටියාගොඩ පොලිස් ස්ථානාධිපති (OIC) ගෙන් සවිස්තරාත්මක වාර්තා ඉල්ලා ඇත. කොමිෂන් සභාව තවදුරටත් බලපිටිය රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී (JMO) වෙතින් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව 2023.11.24 දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය. වාර්තා කරන වර්ෂය අවසන් වන විට ඉල්ලා සිටි වාර්තා කිසිවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී නොමැති අතර ඉහත විමර්ශනය අඛණ්ඩව සිදුවෙමින් පවතී.

- විශේෂ කාර්ය බලකාය විසින් රඳවාගෙන සිටි සැකකරුවෙකුගේ මරණය
  **(HRC/SUO/MOTU/17/23)**

මියගිය පුද්ගලයා 2023 ඔක්තෝබර් 12 වන දින හම්බන්තොට දී මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටියදී විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබුණි. මියගිය පුද්ගලයා අවිස්සාවේල්ලේදී සිදු වූ මිනීමැරුමක් සම්බන්ධයෙන් අවශ්‍යව සිටි අයෙකු බැවින් පසුව ඔහු අවිස්සාවේල්ල පොලීසියට මාරු කර යවා තිබුණි. ඝාතනය සඳහා භාවිතා කළ බව කියන ආයුධය සොයා ගැනීමට පොලිස් නිලධාරීන්ට සහාය වෙමින් සිටියදී පලා යාමට උත්සාහ කිරීමේදී සැකකරුට මාරාන්තික තුවාල සිදුවී ඇති බව කියනු ලැබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කණ්ඩායමක් 2023 ඔක්තෝබර් 17 වන දින අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට ගොස් නිරීක්ෂණ සිදු කළහ. තවද, කොමිෂන් සභාව අවිස්සාවේල්ල රෝහලේ අධිකරණ වෛද්‍යවරයාගෙන් තොරතුරු වාර්තාවක්, හම්බන්තොට ස්ථානාධිපතිවරයාගෙන් සවිස්තර වාර්තාවක් සහ විශේෂ කාර්ය බලකාය සහ අවිස්සාවේල්ල පොලිස් අධිකාරීවරයා විසින් සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් පිළිබඳ වාර්තාවක් යනාදිය ඉල්ලා ඇත. පෙත්සම්කරුවන්ගෙන් ද සාක්ෂි කැඳවන ලදී. දැනට පරීක්ෂණ සිදුවෙමින් පවතී.

- පොලිස් අත්අඩංගුවේ සිටියදී කාන්තාවක් මිය යාම **(HRC/SUO/MOTU/11/2)**

චිත්‍රපට නිෂ්පාදකවරයෙකුගේ නිවසේ ගෘහ සේවිකාවක් ලෙස සේවය කළ බදුල්ලේ පදිංචි 42 හැවිරිදි තිදරු මවක්, රන් මුද්දක් සොරකම් කිරීමේ චෝදනාව මත අත්අඩංගුවට ගැනීමෙන් පසු වැලිකඩ පොලිසියේ අත්අඩංගුවේ සිටියදී 2023 මැයි 11 වන දින මිය ගියාය. මියගිය කාන්තාවගේ ඥාතීන් චෝදනා කළේ ඇය පොලිස් අත්අඩංගුවේ සිටියදී පොලිස් නිලධාරීන් ඇයට පහර දුන් බවයි. ස්වේච්ඡාවෙන් පරීක්ෂණයක් ආරම්භ කරමින්, මානව හිමිකම් කොමිෂන් සභාවේ කණ්ඩායමක් වැලිකඩ පොලිස් ස්ථානයට ගොස් ඔවුන්ගේ නිරීක්ෂණ සිදු කළ අතර එම පොලිස් ස්ථානයෙන් වාර්තාවක් ද ඉල්ලා සිටියහ. මෙම නඩුව පිළිබඳ පරීක්ෂණ දැනට සිදුවෙමින් පවතී.

### *5.2.2 වධහිංසා පැමිණවීම*

කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම මෙන්ම විධිමත් පැමිණිල්ලක් රහිතව ස්වේච්ඡාවෙන් සිදුකරන විමර්ශන හරහා වධහිංසා පැමිණවීමෙන් නිදහස් වීමේ අයිතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාව මැදිහත් වේ.

- අත්අඩංගුවට ගැනීමේදී පොලීසිය විසින් සැකකරුවෙකුට වධහිංසා පැමිණවීම සහ අමානුෂික ලෙස සැලකීම (පැමිණිලි අංකය: **HRC/1604/15)**

2015 වර්ෂයේ දී සැකකරුවෙකුට අමානුෂික ලෙස පහරදීම සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානයට එරෙහි මෙම පැමිණිල්ලෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කොමිසම විසින් සොයා ගන්නා ලදී. බරපතළ තුවාල හේතුවෙන් වින්දිතයා කොළඹ මහ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කරන ලද අතර 2015.05.07 දින මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද අතර පසුව ඇප මත මුදා හරින ලදී. කොමිසම ඉදිරියේ සාක්ෂි දෙමින් පැමිණිලිකරු චෝදනා කළේ අත්අඩංගුවට ගැනීමෙන් පසු දින 04 ක් සිරගත කරන ලද බවත්, එහිදී ක්‍රිකට් පිත්තකින් පහර දුන් බවත්, කැඩුණු සේදුම් බක්කියකින් කකුල දරුණු ලෙස කැපූ බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ තුවාල සිදු වූ බවත්ය. ඔහු සිය තුවාල සඳහා ජාතික රෝහලේ ප්‍රතිකාර ලබා ඇත. තුවාල අහම්බෙන් සිදු වූ ඒවා බව පවසමින් වැලිකඩ පොලිස් ස්ථානය චෝදනා ප්‍රතික්ෂේප කළේය. අධිකරණ වෛද්‍ය වාර්තාවේ වින්දිතයාගේ ශරීරයේ තුවාල දහයක් ලැයිස්තුගත කර ඇති අතර, ඔහුගේ ප්‍රකාශයට අනුකූලව කුරිරු ලෙස අඩත්තෙට්ටමට භාජනය කිරීම

පෙන්නුම් කරන බරපතල තුවාල ද ඇතුළත් වේ. පහරදීම සහ කැඩුණු සේදුම් බක්කියකින් තුවාල සිදුකිරීම යන ප්‍රකාශයට සහාය වන අන්දමින් මොට බලයක් යොදා සිදුකළ තුවාල කිහිපයක් ඇති බව වාර්තාවෙන් තහවුරු විය. අත්අඩංගුවට ගත් දිනයන්හි විෂමතා තිබුණද, වෛද්‍ය සාක්ෂිවලින් තහවුරු වූයේ වින්දිතයා පොලිස් අත්අඩංගුවේ සිටියදී පහර කෑමට ලක් වී ඇති බවයි.අධිකරණ වෛද්‍ය සාක්ෂි සහ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මත පදනම්ව, වධහිංසා පැමිණවීම සහ අමානුෂික ලෙස සැලකීම තහනම් කරන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ පොලීසිය වින්දිතයාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව නිගමනය විය. කොමිෂන් සභාව විසින් සෑම වගඋත්තරකරුවෙකුම රුපියල් 10,000 බැගින් පැමිණිලිකරුට රුපියල් 40,000 ක් ගෙවිය යුතු බවට නියෝග කළේය. වගඋත්තරකරුවන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගෙන කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස පොලිස්පතිවරයාට (පොලිස්පති) නියෝග කරන ලදී. නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නියම කර ඇති කාලසීමාවන්ගෙන් සතියක් ඇතුළත නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්දැයි කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙස ද කොමිෂන් සභාව පැමිණිලිකරුට නියම කළේය.

- පාසල් සිසුවෙකුට අමානුෂික ලෙස පහරදීම
  **(HRC/SUO/MOTU/02/23)**

දොළොස් හැවිරිදි සිසුවෙකුට පාසල් ගුරුවරයෙකු විසින් අමානුෂික ලෙස පහර දුන් බවට ලැබුණු චෝදනාවක් මත, කොමිසම ස්වකීය ඉල්ලීම මත මේ සම්බන්ධයෙන් විමර්ශනය කළේය. බේරුවල ප්‍රදේශයේ 7 වන ශ්‍රේණියේ සිසුවෙකු වන වින්දිතයා, පාසලේ ගුරුවරයෙකු වූ භික්ෂුවක් සිදුකළා යැයි කියනු ලබන පහරදීමකින් දරුණු තුවාල ලබා ඇත. කෙසේ වෙතත්, විමර්ශනය ඉදිරියට ගෙන යාමේදී, පැමිණිලිකරු කොමිෂන් සභාවට පැමිණ පෙනී සිටින ලෙසට කළ ඉල්ලීමට අනුකූල නොවූ අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි පරිදි සිද්ධියට අදාළ වැඩිදුර සාක්ෂි ඉදිරිපත් කළේ නැත. එබැවින්, පෙත්සම්කරුට උනන්දුවක් නොමැති බව මත පදනම්ව පරීක්ෂණය නතර කරන ලදී.

- අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම පිළිබඳ විමර්ශනය
  **(HRC/SUO/MOTU/05/23)**

කප්පම් ගැනීම සහ තවත් පුද්ගලයෙකුට තුවක්කුවක් පෙන්වා තර්ජනය කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු මීගමුව පොලිසියේ අපරාධ විමර්ශන අංශය විසින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු කටුනායක ප්‍රදේශයට රැගෙන ගොස් වගුරු බිමක වින්දිතයා විසින් එහි සඟවා තිබූ අත් බෝම්බයක් සහ පිස්තෝලයක් ලබා ගත් බවත්, එම අවස්ථාවේදී ඔහු අත් බෝම්බය ක්‍රියාත්මක කර පොලීසියට එරෙහිව පිස්තෝලය භාවිතා කිරීමට උත්සාහ කළ බවත් පොලීසිය පවසයි.

ආත්මාරක්ෂාව සඳහා සැකකරුට වෙඩි තැබූ බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු තුවාල ලබා පසුව මිය ගිය බවත් පොලීසිය පැවසීය. මේ අනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කළේය. කෙසේ වෙතත්, පැමිණිලිකරුගේ උනන්දුව නොමැතිකම හේතුවෙන් කොමිෂන් සභාවට විමර්ශනය නතර කිරීමට සිදුවිය.

### *5.2.3. පුද්ගල නිදහස සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය*

කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම මෙන්ම විධිමත් පැමිණිල්ලක් නොමැතිව ස්වේච්ඡාවෙන් සිදුකරන විමර්ශන හරහා කොමිෂන් සභාව මැදිහත් වී ආරක්ෂා කිරීමට අපේක්ෂා කරන තවත් වැදගත් අයිතිවාසිකමක් වනුයේ පුද්ගල නිදහස සහ ආරක්ෂාව සඳහා ඇති අයිතියයි.

- පොලීසිය විසින් සැකකරුවෙකු අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම. (පැමිණිලි අංකය: **HRC/4670/22)**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් උල්ලංඝනය වන පරිදි, පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් පුද්ගලයෙකුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබාගෙන, පසුව 2022 නොවැම්බර් මාසයේදී වෙරළබඩ පොලිස් ස්ථානයට භාර දෙන ලද සිද්ධියක් සම්බන්ධයෙන් අදාළ පොලිස් නිලධාරීන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පතිවරයාට කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී. මෙසේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත් පැමිණිලිකරුගේ පුත්‍රයා පසුව කොළඹ අපරාධ කොට්ඨාශයට සහ පසුව ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට මාරු කර යවා ඇත. නැවත නැවත විමසීම් කළද, තම පුතා නිදහස් කිරීම ප්‍රමාද වීමට හේතුව පැමිණිලිකරුට දැනුම් දී නොමැත. පසුව, වින්දිතයාගේ නීතිඥවරයා 2022 නොවැම්බර් 25 වන දින කොමිෂන් සභාවට වාර්තා කළේ, තම සේවාදායකයා බැලීමට ඔහුට අවස්ථාවක් ලබා නොදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ රඳවා සිටින බවයි. ග්‍රෑන්ඩ්පාස් පොලිසියේ ස්ථානාධිපතිවරයා කියා සිටියේ තමන් වින්දිතයා අත්අඩංගුවට නොගත් නමුත් තවත් සැකකරුවෙකු පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ඔහුගෙන් ප්‍රශ්න කළ බව පිළිගන්නා බවයි. ග්‍රෑන්ඩ්පාස් පොලීසිය පසුව ප්‍රකාශ කළේ හෙරොයින් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් ජූඩ් අරවින්ද 2022 නොවැම්බර් 28 වන දින අත්අඩංගුවට ගත් බවත් ඔහුට එරෙහිව පවතින තර්ජන හේතුවෙන් ඔහු අත්අඩංගුවේම තබා ගත් බවත්ය.

පැමිණිල්ල ලැබීමෙන් පසු, කොමිෂන් සභාවේ කාර්යභාර නිලධාරියා වෙරළබඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා අමතා කරුණු විමසූ අතර, වින්දිතයා 2022.11.23 දින ඇප මත නිදහස් කරන ලද බවට ඔහු ප්‍රකාශ කර තිබුණි. කෙසේ වෙතත්, පසුව ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය සහ අනෙකුත් අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට හෝ එහි ගොස් බැලීමට ගත් උත්සාහයන් අසාර්ථක වූ බව ඔප්පු විය. 2022 නොවැම්බර් 23 සිට 27 දක්වා ඔහු රඳවා තබා ගැනීම තහවුරු කරන සාක්ෂි සහ දිවුරුම් ප්‍රකාශ තිබියදීත්, ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ වින්දිතයාගේ භාරකාරත්වය පිළිබඳ කිසිදු වාර්තාවක් නොමැති බව විමර්ශනය මගින් හෙළි විය. ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන්ගේ ප්‍රකාශවල විෂමතා කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද අතර, වින්දිතයා 2022 නොවැම්බර් 23 සිට නොවැම්බර් 27 දක්වා නීති විරෝධී ලෙස රඳවාගෙන සිටි බවට ද තහවුරු කර ගන්නා ලදී. ග්‍රෑන්ඩ්පාස් පොලිසියේ ස්ථානාධිපතිවරයා දිවුරුම යටතේ අසත්‍ය ප්‍රකාශ ලබා දී විමර්ශනය සිදුකරගෙන යාමට සහයෝගය නොදැක්වූ බව ද නිරීක්ෂණය විය. නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නීති විරෝධී රඳවා තබා ගැනීම පිළිබඳව දැන සිටියද ඒ පිළිබඳව විමර්ශනය නොකළ බව ද කොමිෂන් සභාව සඳහන් කළේය. ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා සුදුසු විනය ක්‍රියාමාර්ග ගත යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කළේය. විනය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට අමතරව, පොලිස් ස්ථානවල රඳවා ගෙන සිටින රැඳවියන් පිළිබඳ විධිමත් අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරන ලෙසත්, ශ්‍රී ලංකා පොලිසියේ සියලුම ස්ථානාධිපතිවරුන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එවැනි ක්‍රමයක් පිළිබඳව ඇති දැනුවත් බව සහතික කරන ලෙසත් කොමිෂන් සභාව පොලිස්පතිවරයාට නියෝග කළේය. මෙම නිර්දේශ ක්‍රියාත්මක කර 2023 ජුනි 15 වන දිනට පෙර අදාළ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව වගඋත්තරකරුවන්ගෙන් ඉල්ලා සිටියේය, (ඉහත සඳහන් කර ඇති අවසාන දිනය හෝ එදිනට පෙර එකී වාර්තාව නොලැබුණි).

### *5.2.4. සාමකාමී ලෙස රැස්වීමේ අයිතිය*

වෘත්තීය සමිති ඇතුළු පුද්ගලයින්ගේ සාමකාමීව රැස්වීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව සක්‍රිය කාර්යභාරයක් ඉටු කර ඇත. 2022 වර්ෂයේ දී සහ ඉන්පසුව පවා රට පුරා පැතිර ගිය මහජන සිවිල් විරෝධතා සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, විරෝධතාකරුවන් විසින් ගෙන එන ලද පැමිණිලි සඳහා නීතිමය විසඳුම් ලබා දීමට අමතරව, සාමකාමී විරෝධතා සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීමට සහ අනාගත විරෝධතා වලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම වැළැක්වීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාකාරී පියවර ගන්නා ලදී . ඒ අනුව, 2023 වර්ෂයේ දී,

කොමිෂන් සභාව මෙකී නිදහස සුරක්ෂිත කිරීම උදෙසා නිර්මාණය කර ඇති පහත සඳහන් ආරම්භක පියවරයන් ගන්නා ලදී:

- සිවිල් විරෝධතා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස රාජ්‍ය සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් උදෙසා නිර්දේශිත මාර්ගෝපදේශ දියත් කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 'සිවිල් විරෝධතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා රාජ්‍ය සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා නිර්දේශිත මාර්ගෝපදේශ මාලාව' 2023 මැයි 12 වන දින කොළඹ දී එළිදැක්වීය. ඉහළ අධිකරණවල විනිසුරුවරුන්, එක්සත් ජාතීන්ගේ ආයතනවල නියෝජිතයින්, ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, විද්වතුන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙම මාර්ගෝපදේශ නීතිපති දෙපාර්තමේන්තුව, නීති විශාරදයින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ සිවිල් සමාජ නියෝජිතයින් ගණනාවක් සමඟ ශ්‍රීලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සභාපතිගේ නායකත්වයෙන් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආසන්න වශයෙන් වසරක පමණ කාලයක් මුළුල්ලේ කෙටුම්පත් කරන ලදී. මාර්ගෝපදේශ මාලාව කොටස් තුනකින් සමන්විත වේ: රාජ්‍යයේ වගකීම්; සිවිල් විරෝධතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් උදෙසා නිර්දේශිත මාර්ගෝපදේශ මාලාව; සහ ක්‍රියාත්මක කිරීම. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය සහ දියත් කිරීම සඳහා JURE ව්‍යාපෘතිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් අරමුදල් සපයන ලදී.

- විරෝධතා පාගමනක් සමනය කිරීම සඳහා පොලීසිය විසින් අ.වි.ශි.බ.ම.යට පහර දීම. **(HRC/SUO/MOTU/09/23)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලදී. මෙම නඩුවේ පැමිණිලිකරු වූයේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් මෙහෙයවන ලද විරෝධතා පාගමනකට 2023.04.03 වන දින කොළඹදී පොලීසිය ජල ප්‍රහාර එල්ල කිරීමට එරෙහිව අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයයි. සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට ඇතුළු වීමට උත්සාහ කළ අතර, එහි දී විරෝධතාකරුවන් විසුරුවා හැරීම සඳහා පොලීසිය ජල ප්‍රහාර එල්ල කළේය. සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව වගඋත්තරකරුගෙන් ඉල්ලා සිටියේය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය අඛණ්ඩව සිදු කෙරේ.

### 5.2.5. ප්‍රකාශනයේ නිදහස

ශ්‍රී ලංකාවේ ලේඛකයින් සහ කලාකරුවන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සක්‍රිය කාර්යභාරයක් ඉටු කරයි.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් **Medialk.com** වෙබ් අඩවිය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම (පැමිණිලි අංකය: **HRC/1044/21**)

මෙහි පැමිණිලිකරු චෝදනා කළේ ජනමාධ්‍ය අමාත්‍යාංශය තම වෙබ් අඩවිය වන Medialk.com ලියාපදිංචි කිරීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කළ බවයි. 2019 දී අයදුම්පතක් ඉදිරිපත් කර සමාලෝචනයකට භාජනය කිරීමෙන් පසු, ආරක්ෂක අමාත්‍යාංශය විසින් එම වෙබ් අඩවිය ආරක්ෂක ගැටළු මතු කරන බවට වාර්තාවක් නිකුත් කර ඇති අතර, එමඟින් ජනමාධ්‍ය අමාත්‍යාංශය ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ බවයි. මෙම ලියාපදිංචිය නොමැතිකම හේතුවෙන් තම වෙබ් අඩවියට මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම වළක්වන බවත්, එමඟින් ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කරන අතර රජයේ සිදුවීම් ආවරණය කිරීමේ හැකියාව සීමා කරන බවත් පැමිණිලිකරු ප්‍රකාශ කරයි. Medialk.com ලියාපදිංචි කිරීම සහ එහි මාධ්‍යවේදීන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම නිර්දේශ කරන ලෙස පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී. 2019 පාස්කු ප්‍රහාරයෙන් පසු, ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත්ව ඇති බව දක්වා ඇත. වගඋත්තරකරු කියා සිටියේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් තම ආයතනයට ආරක්ෂක නිෂ්කාශන ලබා ගැනීමට ඉඩප්‍රස්ථා ලබා නොදුන් බවත්, එහෙයින් තම ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට එය හේතු වූ බවත්ය.

විමර්ශනය කිරීමේදී, ජනමාධ්‍ය අමාත්‍යාංශය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරස්පර ප්‍රකාශ නිකුත් කර ඇති බව සොයා ගන්නා ලදී. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම විෂමතා සහ ලියාපදිංචිය ලබාදීමේ තීරණය සඳහා ආරක්ෂක නිෂ්කාශන මත යැපීම සැලකිල්ලට ගත්තේය. ප්‍රවෘත්ති වෙබ් අඩවි ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන බව සහතික කිරීම සඳහා මාධ්‍ය අමාත්‍යාංශයේ වගකීම ද පිළිගන්නා ලද අතර ඒ සමඟම ප්‍රකාශනයේ සහ තොරතුරු නිදහස සම්බන්ධව මූලික අයිතිවාසිකම් ද අවධාරණය කළේය. කරුණු මත පදනම්ව, අදාළ අමාත්‍යාංශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව සොයා ගත්තේය. අමාත්‍යාංශය විසින් සුදුසු විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත්, විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරන ලෙසත් කොමිෂන් සභාව නිර්දේශ කළේය.

## 5.2.6. *සංචරණයේ ඇති නිදහස*

*2023* වසර තුළ කොමිෂන් සභාව මැදිහත් වූයේ මාධ්‍යවේදීන්ගේ මූලික ගමන් කිරීමේ නිදහස ආරක්ෂා කිරීම සඳහා වන අතර, විශේෂයෙන් මාධ්‍යවේදීන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ රැකියා අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා එය අත්‍යවශ්‍ය වේ.

- මාධ්‍යවේදීන්ට ඉරණතිවු වෙත ගමන් කිරීම සීමා කිරීම (පැමිණිලි අංකය: **HRC/KI/015/2021)**

2021 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ඌ) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති පරිදි තමාට නිදහසේ ගමන් කිරීමේ අයිතිය උල්ලංඝනය කර ඇති බවට චෝදනා කරමින් පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ගොනු කළේය. පැමිණිලිකරු තවත් මාධ්‍යවේදීන් දෙදෙනෙකු සමඟ ඉරණතිවු වෙත ගමන් කරමින් සිටින අවස්ථාවක දී මුලන්කාවිල් හි ඉරණමිතානගර් හි මුරපොලකදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඔවුන්ව නවතා ඇත. එම පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය කළාප කාර්යාලය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් වාර්තාවක් ඉල්ලා සිටි අතර, 2023.03.16 දිනැති ලිපිය මගින් නාවික හමුදාව ප්‍රතිචාර දක්වා තිබුනේ එහි මූලස්ථානය සහ උතුරු මැද නාවික ප්‍රදේශය අතර "සන්නිවේදන ගැටලුවක්" හේතුවෙන් මෙම සිදුවීම සිදුවී ඇති බව පවසමිනි. මාධ්‍යවේදීන් ඉරණතිවු වෙත ඇතුළුවීම නාවික හමුදාව ප්‍රතික්ෂේප කළ අතර, අනාගතයේදී එම දූපතට යාමට කැමති මාධ්‍යවේදීන් කල්තියා දැනුම් දුන්නොත් පහසුකම් සැලසීමට හැකි වනු ඇති බවට ඔවුන් ප්‍රකාශ කළහ. කොමිෂන් සභාව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් ද ඉහත ගැටලුව සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටින ලදී. 2021 පෙබරවාරි 14 වන දින ආරම්භ කරන ලද "අපනයන ගම්මානයක්" හේතුවෙන් ඉරණතිවු ප්‍රදේශයට ඇතුළු වීමට අනේවාසික පුද්ගලයින්ට අවසර ලබා ගත යුතු බවට වාර්තා කළ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරයා, මෙම ප්‍රදේශයට ඇතුළු වීමට අපේක්ෂා කරන අනේවාසිකයින්ට ප්‍රවාහනය පහසුකම් සංවිධානය කරගැනීම සඳහා නාවික හමුදාවේ අවසරය ලබාගත් යුතු බව වැඩිදුරටත් සඳහන් විය. "සන්නිවේදන ගැටලුවක් " පිළිබඳ නාවික හමුදාවේ පැහැදිලි කිරීම පැමිණිලිකරු ප්‍රතික්ෂේප කරනු ලැබුවේ, අනේවාසිකයින්ට ඇතුළුවීමට අවසර නොමැති බව පෙන්නුම් කරන මාධ්‍ය ප්‍රකාශ උපුටා දක්වමින් ය. දූපත් පදිංචිකරුවන්ට පමණක් අවසර දීම සඳහා නාවික හමුදාව ලැයිස්තුවක් භාවිතා කරනු ඇසින් දුටු සාක්ෂියක් වෙත ද යොමු වුනි.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඌ) ව්‍යවස්ථාව යටතේ පිළිගෙන ඇති පරිදි, සංචරණයේ නිදහස මූලික මානව අයිතියක් බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සඳහන් කළේය. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) 12 වැනි වගන්තිය මගින් සංචරණයේ නිදහස විශේෂයෙන් පිළිගනී. පොදු විචාර අංක 27 හරහා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, මෙම නිදහසේ විෂය පථය පැහැදිලි කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද දක්වා ඇති පරිදි මෙම අයිතියේ අහිමි කළ නොහැකි ස්වභාවය සැලකිල්ලට ගෙන, එයට යම් ආකාරයක සීමාවක් පනවන්නේ නම් එය නීත්‍යානුකූල, ආවශ්‍යක සහ සමානුපාතික විය යුතුය.

පැමිණිලිකරුට පනවා ඇති සීමාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) ව්‍යවස්ථාවන් හි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල නොවන බැවින් ඉහත කී තත්ත්වය උදෙසා නීත්‍යානුකූල නෛතික පදනමක් නොමැති බවත්, එම හේතුව මත පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් කොමිෂන් සභාව සඳහන් කළේය. අනාගතයේදී මෙවැනි උල්ලංඝනයන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(3) (ඇ) සහ (4) වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කරන ලදී . ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(6) සහ (7) ව්‍යවස්ථාවන් යටතේ නීතියෙන් එවැනි සීමාවන්ට අවසර දී ඇත්නම් මිස, ඉරණතිවු වෙත පුරවැසියන් විසින් සිදුකරන සංචරණයන් සඳහා අනවසර සීමා පැනවීමෙන් වැළකී සිටීම; ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ට පූර්ව අවසරයකින් හෝ දැනුම්දීමකින් තොරව ඉරණතිවු වෙත ඇතුළු වීමට ඉඩ ලබාදෙන ලෙස උපදෙස් දීම; යනාදිය ඇතුළත් කොට උතුරු මැද නාවික ප්‍රදේශයේ නිලධාරීන්ට චක්‍රලේඛයක් නිකුත් කිරීම, සහ මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මාසයක් ඇතුළත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම එකී නිර්දේශ අතර වේ.

## 5.2.7 *සුළුතර අයිතිවාසිකම්*

අධීක්ෂණය, උපදේශනය, අධ්‍යාපනය සහ ජාත්‍යන්තර මැදිහත්වීම තුළින් සමාජය තුළ සමානාත්මතාවය සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වීම තුළින් සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2023 දී, ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පියවර කිහිපයක් ගන්නා ලදී:

- ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ පුරා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රවේශය සහ පෙනී සිටීම පුළුල් කිරීම සඳහා අඛණ්ඩ කැපවීමක් ලෙස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 පෙබරවාරි මාසයේදී යාපනයේ ක්ෂේත්‍ර සංචාරයක් පැවැත්වීය. උතුරු පළාතේ පුද්ගලයින් දිගු කාලයක් තිස්සේ

රඳවා තබා ගැනීම සම්බන්ධ තීරණාත්මක ගැටළු විසඳීමට මෙන්ම දේශපාලන බලපෑමෙන් තොර සංක්‍රාන්තික අධිකරණ යාන්ත්‍රණයන් ගවේෂණය කිරීම මෙම සංචාරයේ අපේක්ෂාව විය. මෙම සංචාරයේදී, පෙර කී ගැටළු තක්සේරු කිරීමේදී රජය පාර්ශවයෙන් සක්‍රිය පියවර ගැනීමේ දැඩි අවශ්‍යතාවය කොමිෂන් සභාව විසින් හඳුනා ගන්න ලදී. උතුරු පළාතේ ජනතාව අතර විශ්වාසය ඇති කිරීම සහ විශ්වාසය තහවුරු කිරීම සඳහා එවැනි පියවර ගැනීම ඉතා වැදගත් වේ. ඵලදායී හා සුදුසු විසඳුම් සොයා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, සිරකරුවන්ගේ රැකවරණය සහ අධීක්ෂණය කෙරෙහි වගකිව යුතු අමාත්‍යාංශයට මෙම කරුණු නිර්දේශ කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිසි පියවර ගෙන තිබේ.

- විශේෂයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය ජාවාරම, හොරබඩු ජාවාරම සහ හිරිහැර වැනි ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ක්‍රියාකාරීව කටයුතු කළේය. උදාහරණයක් ලෙස ගතහොත්, මන්නාරමේ ධීවරයින්ට බලපාන මානව හිමිකම් උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- කඳුකර දෙමළ ප්‍රජාවේ සුභසාධනය කෙරෙහි මානව හිමිකම් කොමිෂන් සභාව නිරන්තරයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, ප්‍රධාන වශයෙන් වතුකරයේ සේවයේ නියුතු මෙම ප්‍රජාවේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සුපරීක්ෂාකාරී සහ ක්‍රියාශීලී පියවර ගෙන ඇත. මෙම සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර වශයෙන්, විශේෂයෙන් නොගෙවූ ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සම්බන්ධ ගැටලු වැනි ගැටලු විසඳීම සඳහා කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇත. 2023 දී, කොමිෂන් සභාව මෙම නිර්දේශවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අදාළ සියලුම පාර්ශවකරුවන් කැඳවා ඔවුන්ව ක්‍රියාකාරීව අදාළ කටයුත්ත උදෙසා සම්බන්ධ කර ගන්නා ලදී .

### *4.5.6 LGBTIQ අයිතිවාසිකම්*

ශ්‍රී ලංකාවේ LGBTIQ ප්‍රජාවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඉදිරියට ගෙන යාම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව ක්‍රියාශීලී සහ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කර ඇති අතර, නීති ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටීම, දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම සහ මෙම ප්‍රජාව බොහෝ විට මුහුණ දෙන සමාජ අපකීර්තියට ආමන්ත්‍රණය කිරීම මගින් මෙම ආයතනය ක්‍රියාශීලී සහ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කර ඇත.

- සංක්‍රාන්තික පුද්ගලයින්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා පොලිස් නිලධාරීන්ට මාර්ගෝපදේශ නිකුත් කිරීම.

2023 මාර්තු 15 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සංක්‍රාන්තික පුද්ගලයින් ආරක්ෂා කිරීමට මාර්ගෝපදේශ මාලාවක් පොලිස් නිලධාරීන් සඳහා නිකුත් කරන ලදී. LGBTI ප්‍රජාව සමඟ අන්තර් ක්‍රියා කරන අතරතුර ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳ උපදෙස් සහිත විධිවිධාන 12ක් මෙම මාර්ගෝපදේශවල අඩංගු වේ. නීතිය ක්‍රියාත්මක කිරීමේ සන්දර්භය තුළ සහ ප්‍රජාව තුළ පුළුල් වශයෙන් සංක්‍රාන්තික පුද්ගලයින් සමඟ අන්තර්ක්‍රියා කිරීමේ දී ගෞරවයෙන් හා සුපිළිපන්භාවයෙන් සිදු කරන බව සහතික කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ වැදගත් සම්පතක් පෝෂකයන් ලෙස සේවය සපයන අතර එමඟින් මෙම ප්‍රජාවට ඔවුන් ලැබිය යුතු ආරක්ෂාව සහ ගෞරවය ලබා දෙයි. සම්මුතියෙන් සමලිංගික හැසිරීම් අපරාධයක් ලෙස සලකන දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්ති අහෝසි කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රබල උපදේශකයෙකු වී ඇති අතර එලෙස අඛණ්ඩව කටයුතු කරගෙන යාම ද සිදුකරනු ලබයි.

### *5.2.9. ළමා අයිතිවාසිකම් සහ අධ්‍යාපනයට ඇති අයිතිය*

ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අයිතිවාසිකම් ස්වාධීනව අධීක්ෂණය කිරීමට, ඒ වෙනුවෙන් පෙනී සිටීමට සහ ආරක්ෂා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අයිතිය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව ද කටයුතු කරයි. වාර්තා කරන වර්ෂය තුළ, අධ්‍යාපන අයිතිය ඇතුළුව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ද කොමිෂන් සභාව මැදිහත්වීම් කිහිපයක් සිදු කළේය:

- 2023 ජනවාරි මාසයේදී, රජය විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පාසලක් වසා දැමීමට සැලසුම් කරමින් සිටියේය. මෙම තීරණය නැවත සලකා බැලීමට රජයට බල කිරීම සඳහා කොමිෂන් සභාව මැදිහත් වූ අතර එමඟින් අධ්‍යාපනයේ අයිතිය ආරක්ෂා විය.

- අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර ඇගයීම් ප්‍රමාදය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම.

2022 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) [අ.පො.ස. (උසස් පෙළ)] විභාග ප්‍රශ්න පත්‍ර ඇගයීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් කොමිසමට ලැබුණු පැමිණිලි සහ මාධ්‍ය වාර්තා මත පදනම්ව, කොමිසම පරීක්ෂණයක් ආරම්භ කළේය. විශ්වවිද්‍යාල

ආචාර්යවරුන් ප්‍රශ්න පත්‍ර ඇගයීමෙන් ඉවත් වීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවී ඇති බව විමර්ශනයෙන් හෙළි විය. ඒ අනුව, 2023 අප්‍රේල් 25 වන දින, කොමිෂන් සභාව විසින් විභාග කොමසාරිස් ජනරාල්වරයා සහ විශ්වවිද්‍යාල ගුරු සංගම් සම්මේලනයේ (FUTA) සභාපතිවරයා අතර සාකච්ඡාවක් කැඳවන ලදී. විභාග කොමසාරිස් ජනරාල්වරයා පෙන්වා දෙනු ලැබුවේ, මෙම විභාගයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය, ප්‍රශ්න පත්‍ර සැකසීමේ සිට ප්‍රශ්න පත්‍ර අවසාන ඇගයීම දක්වා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ දායකත්වය මත රඳා පවතින බවයි. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පෞද්ගලික මට්ටමින් දායක වන බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළ අතර, අධික බදු ගැටළුවට විසඳුමක් සොයා ගැනීමට අපොහොසත් වීමට විරෝධය පළ කරමින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විභාග ඇගයීම් කටයුතුවලින් ඉවත් වීමට තීරණය කර ඇති බව විශ්වවිද්‍යාල ගුරු සංගම් සම්මේලනයේ සභාපතිවරයා වැඩිදුරටත් පැවසීය. විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගේ ඉල්ලීම් සාකච්ඡා කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් පත් කළ යුතු බවත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සහ මෙම විභාගයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පිළිබඳ ජාත්‍යන්තර පිළිගැනීම ආරක්ෂා කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් කටයුතු කළ යුතු බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ප්‍රකාශ කරන ලදී. තවද, විභාග පත්‍ර ඇගයීම්වලින් ඉවත් නොවන ලෙසත්, විභාග පත්‍ර ඇගයීම් අවසන් වන තුරු ඔවුන්ගේ විරෝධතාවය නතර කරන ලෙසත් සභාපතිවරයා, විශ්වවිද්‍යාල ගුරු සංගම් සම්මේලනය වෙතින් ඉල්ලා සිටින ලදී .

- ශිෂ්‍යයෙකුට ලබා දුන් ශාරීරික දඬුවම් (පැමිණිලි අංකය: **HRC/2650/18)**

හෝමාගම ප්‍රදේශයේ පාසලක නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු විසින් දරුවෙකුගේ කම්මුලට පහර දී ඔහුගේ කොණ්ඩය කපා ඇති ආකාරය හේතුවෙන් පාසලට පැමිණීම තහනම් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලදී. පාසලේ විදුහල්පතිවරයා නියෝජ්‍ය විදුහල්පතිවරයාගේ ක්‍රියාවන් සාධාරණීකරණය කර ඇති බවත්, පසුව දරුවාට වෙනස් කොට සැලකීම්වලට ලක් කර ඇති බවත් පැමිණිල්ලේ තවදුරටත් සඳහන් විය. මේ හේතුවෙන්, උසස් පෙළ සිසුවෙකු වන දරුවා ඉහත සඳහන් පාසලේ අධ්‍යාපනය නැවත ආරම්භ කිරීම ප්‍රතික්ෂේප කරමින් සිටියේය. කරුණු විමසීමේදී, නියෝජ්‍ය විදුහල්පතිවරයා ශිෂ්‍යයාගේ ආක්‍රමණශීලී හැසිරීම සහ ඔහුගේ කොණ්ඩය කැපීමේ විලාසය පාසලට සුදුසු නොවන බැවින් ඔහුට පහර දුන් බව පිළිගත්තේය. කෙසේ වෙතත්, පාසල ශිෂ්‍යයා සම්බන්ධයෙන් සිදුකළ අත්හිටුවීම ප්‍රතික්ෂේප කළ අතර ශිෂ්‍යයාට අධ්‍යාපනය දිගටම කරගෙන යාමට පාසල විවෘත විය.

දරුවාගේ අධ්‍යාපන අයිතිය උල්ලංඝනය නොවන බවට වග බලා ගැනීමේ අවශ්‍යතාවය විමර්ශනයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය. අධ්‍යාපන

අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 12/2016 චක්‍රලේඛය මගින් සිසුන්ට ශාරීරික දඬුවම් ලබා දීම තහනම් කර ඇති අතර, පාසල් බලධාරීන් එය උල්ලංඝනය කර ඇත. පාසල් බලධාරීන්ගේ හැසිරීම දණ්ඩ නීති සංග්‍රහය අනුව වරදක් විය. එබැවින්, නියෝජ්‍ය විදුහල්පතිවරයා අදාළ චක්‍රලේඛ උල්ලංඝනය කර ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පරිදි දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් කොමිෂන් සභාව නිගමනය කළේය. අනාගතයේදී එවැනි සිදුවීම් සිදුවීම වැළැක්වීම සඳහා එම නියෝජ්‍ය විදුහල්පතිවරයාට අනතුරු ඇඟවීමක් නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරන ලදී.

- ශිෂ්‍යත්ව විභාගයෙන් අඩු ලකුණු ලබාගත් සිසුන් ජනප්‍රිය පාසල්වලට ඇතුළත් කිරීම (පැමිණිලි අංකය: **HRC/703/22, HRC/503/22)**

2020 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු අධික ලෙස ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් විභාගය සමත් වූ තම දරුවන්ට ඉහළ සම්පත් මූලාශ්‍රයන් ඇති පාසල්වලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බවට පැමිණිලිකරුවන් චෝදනා කළහ. විභාගයෙන් සමත් නොවූ දරුවන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධිකාරිය යටතේ එවැනි පාසල්වලට ඇතුළත් කර ඇති අවස්ථාවන් ඉදිරිපත් කරමින්, එමගින් තම දරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන බවටත් ඔවුන් කරුණු ඉදිරිපත් කළහ.

පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණ තීරණය කරනු ලබන්නේ සිසුන්ගේ සමස්ත ප්‍රතිඵල සහ එක් එක් පාසලට ඇතුළත් වීමට පවතින ඉල්ලුම වැනි සාධක සැලකිල්ලට ගනිමින් බව පවසන අධ්‍යාපන අමාත්‍යාංශය එම යාන්ත්‍රණය සාධාරණීකරණය කළේය. 2020 විභාගය සඳහා නියම කර ඇති ඉහළ කඩඉම් ලකුණු මගින් පෙර වසරවලට සාපේක්ෂව විභාගයේදී විශිෂ්ට ලෙස සමත් වූ සිසුන් සංඛ්‍යාව වැඩි බව පිළිබිඹු වන අතර, අදාළ සෑම පාසලකම 6 ශ්‍රේණියට ඇතුළත් වීම පදනම් වී ඇත්තේ අයදුම් කළ පුරප්පාඩු ගණන මත බවත්, ඒවා බොහෝ විට පවතින පුරප්පාඩු ගණන ඉක්මවා යන බවත් - එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළම ලකුණු ඇති සිසුන් පමණක් තෝරා ගැනීමට සිදුවන බවත් අමාත්‍යාංශය තවදුරටත් පැහැදිලි කළේය. එවැනි සාධාරණීකරණයක් ඉදිරිපත් කර තිබිය දී වුව ද, පැමිණිලිකරුවන්ගේ ප්‍රධාන තර්කය වූයේ, විභාගයෙන් සත්‍ය ලෙසටම ඉහළ ලකුණු ලබා ගත් තමන්ගේම දරුවන් අභිබවා සුදුසුකම් නොලත් සිසුන් 23 දෙනෙකු ප්‍රධාන පාසල්වලට ඇතුළත් කර ඇති බවයි. පැමිණිලිකරුවන් එම ලැයිස්තුවම අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර, එහිදී අමාත්‍යාංශයෙන් කිසිදු පිළිගැනීමක් හෝ ප්‍රතිචාරයක් නොලැබුණු අතර, අමාත්‍යාංශයේ එවැනි ක්‍රියාමාර්ග

තුළින් තම දරුවන්ගේ අයිතිවාසිකම් සෘජුවම උල්ලංඝනය වීමට හේතු වී ඇති බව පෙත්සම්කරුවන්ගේ විශ්වාසයයි.

විමර්ශනයෙන් අනතුරුව, කොමිසම නිරීක්ෂණය කළේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු නොලැබුණ ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත සිසුන් කිහිප දෙනෙකු 6 සහ 7 ශ්‍රේණිවලට ඇතුළත් කර ඇති බවත්, ඒ සඳහා එම බලධාරීන් විසින් කිසිදු සාධාරණ පැහැදිලි කිරීමක් ලබා දී නොමැති බවත්ය. කෙසේ වෙතත්, පැමිණිලිකරුගේ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කිරීමට කොමිසමට නොහැකි විය. කරුණු එසේ හෙයින්, අතිශය තරඟකාරී විභාගයකින් ඉහළ ලකුණු ලබා ගත් සිසුන් පාසලට ඇතුළත් කර ගැනීම තවදුරටත් සලකා බැලිය යුතු බවට නිරීක්ෂණය කළේය. අවසාන වශයෙන්, ක්‍රියාත්මක වන චක්‍රලේඛ සහ විධිමත් යෝජනා ක්‍රමවලට අනුකූලව, ඉහළ ඉල්ලුමක් ඇති රජයේ පාසල්වල පුරප්පාඩු සඳහා ළමුන් ඇතුළත් කිරීමේදී වඩාත් විධිමත් හා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් අනුගමනය කරන ලෙස කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ කළේය.

### 5.2.10 *සෞඛ්‍ය අයිතිය*

සෞඛ්‍ය අයිතිය ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සැලකිල්ලට ගත යුතු අත්‍යවශ්‍ය කරුණක් ලෙස පවතින අතර, මෑත කාලීන වර්ධනයන් මෙම අයිතියේ වැදගත්කම තවදුරටත් අවධාරණය කර ඇත.

- 2023 මාර්තු මාසයේදී, ආර්ථික අර්බුදය හේතුවෙන් රජයේ රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධ හිඟයක් ඇති වී දැඩි ගැටලුවකට රට මුහුණ දුන්නේය. එකී තත්වයේ පවතින හදිසි බව හඳුනා ගනිමින්, මානව හිමිකම් කොමිෂන් සභාව වහාම පරීක්ෂණයක් ආරම්භ කළේය. කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා ආරම්භ කරමින් විමර්ශන ක්‍රියාවලියට පහසුකම් සැලසීම සහ අධීක්ෂණ කටයුතුවල නිරත විය.

- 2023 අගෝස්තු මාසයේදී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කඳුකර දෙමළ ප්‍රජාවට තම සේවය සපයන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ වින්නඹු මාතාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

- ජාතික මානසික සෞඛ්‍ය ආයතනය පිළිබඳව කරුණු සෙවීමේ මෙහෙයුම

ජාතික මානසික සෞඛ්‍ය ආයතනය යනු ශ්‍රී ලංකාවේ විශාලතම මානසික සෞඛ්‍ය ආයතනය වන අතර වාර්ෂිකව රෝගීන් 7,000 ක් පමණ ඊට ඇතුළත් වේ. රෝගීන්ට අමානුෂික හා පහත් ලෙස සැලකීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලිවලින් පසුව, කොමිෂන් සභාව විසින් ජාතික මානසික සෞඛ්‍ය ආයතනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කළේය. කරුණු සෙවීමේ කණ්ඩායමට මානව හිමිකම් සහ මහජන සෞඛ්‍ය පරිපාලන ක්ෂේත්‍රවල විශේෂිත දැනුමක් සහ අත්දැකීම් ඇති විශේෂඥයින් ඇතුළත් විය. කරුණු සෙවීමේ මෙහෙයුමේ ක්‍රියාවලියට ප්‍රාථමික ප්‍රතිකාර, බාහිර රෝගී ප්‍රතිකාර, නේවාසික ප්‍රතිකාර සහ විශේෂිත ප්‍රතිකාර යනාදී රෝහල් පරිශ්‍රයන් පරීක්ෂා කිරීම ඇතුළත් විය. 2023 ජූලි මාසයේදී ජාතික මානසික සෞඛ්‍ය ආයතනයෙහි හිටපු අධ්‍යක්ෂවරයෙකු සහ උපදේශක මනෝ චිකිත්සකයෙකු ඇතුළුව විශේෂඥයින් දෙදෙනෙකු එම කණ්ඩායමට නම් කරන ලදී. මෙමෙහෙයුමේ දී සොයා ගත් කරුණු පිළිබඳ වාර්තාව දැනට සකස් වෙමින් පවතී.

## 5.2.11 *ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්*

ශ්‍රී ලංකාවේ වෙසෙන ආබාධිත පුද්ගලයින්ගේ සිවිල්, දේශපාලනික, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ක්‍රියාකාරීව කටයුතු කර ඇත. මෙම කර්තව්‍යයන් අතර කොමිෂන් සභාව තුළ ආබාධිත පුද්ගලයන් සඳහා කැපවූ ඒකකයක් පිහිටුවීම ද වේ. අබාධිත පුද්ගලයින්ගේ සංවිධානවල ඒකාබද්ධ පෙරමුණ වැනි සංවිධාන සමඟ එක්ව, අබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනු පිණිස අබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ සංඥා භාෂා පනත් කෙටුම්පත ඇතුළු වැදගත් නීති ක්‍රියාත්මක කිරීම උදෙසා කටයුතු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව උත්සුක විය.

- ආබාධිත පුද්ගලයින්ට හිමිවන දීමනාව සමෘද්ධි බැංකුවලින් පමණක් ලබා ගැනීම අනිවාර්ය කිරීමට රජය ගත් තීරණය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආබාධිත ප්‍රජාව මුහුණ දෙන බොහෝ දුෂ්කරතාවන්ට විසඳුමක් සෙවීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.03.21 දින කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය සහ අබාධිත පුද්ගලයින්ගේ සංවිධානවල ඒකාබද්ධ පෙරමුණ සමඟ රැස්වීමක් පැවැත්වීය. 2023 මැයි මාසයේ සිට ඕනෑම බැංකුවක ආබාධිත පුද්ගලයින් සතුව ඇති තම පුද්ගලික ගිණුම් වෙත දීමනාව සෘජුවම මාරු කරන බවට කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ

අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ සහතිකය මත, රැස්වීම සාර්ථක අවසානයකට එළඹුණි.

- ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයට නිකුත් කරන ලද නිර්දේශ

2023 සැප්තැම්බර් 21 වන දින, ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කෙටුම්පත පිළිබඳ සිය නිරීක්ෂණ සහ නිර්දේශ කොමිෂන් සභාව විසින් අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී. ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගවීම් ඉටු කිරීම සහතික කිරීම මෙම පනත් කෙටුම්පතේ ඉලක්කයයි. ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඉටු කිරීම සඳහා නීතිමය රාමුවක් ස්ථාපිත කිරීම මෙම පනත් කෙටුම්පතේ අරමුණයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි නිර්දේශ පහත පරිදි විය:

අ. පනත් කෙටුම්පතේ රජයේ වගවීම් දක්වා ඇති විධිවිධානයන්ට 'යහපත් මට්ටමේ ඉදුම්හිටුම්' වල ප්‍රමිතිය වඩාත් පුළුල් ලෙස ඒකාබද්ධ කල යුතුය .

ආ.ආබාධිත කාන්තාවන් සහ ළමුන් 'බහුවිධ ආකාරයේ' හෝ 'වෙන් වෙන්ව' වෙනස්කම්වලට මුහුණ දෙන බවට වන මතය පනත් කෙටුම්පතට පුළුල් අන්දමින් ඒකාබද්ධ කළ යුතු අතර, ස්ත්‍රී-පුරුෂභාවය සහ වයස් මට්ටම් අනුව සංවේදී බව සුරැකෙන ලෙසට ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සපුරාලීම සඳහා වන ක්‍රියාමාර්ග රජය විසින් ගන්නා බවට නිශ්චිත කැපවීමක් ද ඇතුළත් විය යුතුය.

ඇ .පනත් කෙටුම්පත මගින් සලකා බලන පරිදි කොමිෂන් සභාවේ කාර්යභාරය ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයක් ලෙස පවත්වාගෙන යාමට නම් එහි නිශ්චිත ස්වභාවය සහ විෂය පථය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ නිසි අර්ථවත් උපදේශනයක් පැවැත්විය යුතුය.

ඈ.ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික කවුන්සිලයේ සංයුතිය, පත් කිරීමේ ක්‍රියාවලිය සහ බලතල සමාලෝචනය සිදු කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම මෙන්ම වඩා ස්වාධීනත්වයක් සහතික කිරීම සඳහා ය.

ඉ.ආබාධිත පුද්ගලයින් සඳහා වූ යෝජිත ජාතික කවුන්සිලය සඳහා වන රේඛීය අමාත්‍යාංශය විය යුත්තේ අධිකරණ අමාත්‍යාංශයයි .

- 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේදී අනුරාධපුර, උතුරු මැද පළාතේ මෙන්ම උතුරු පළාතේ ආබාධිත ප්‍රවේශ විගණන කණ්ඩායම් සඳහා ප්‍රවේශ්‍යතා විගණන පැවැත්වීම පිළිබඳ පුහුණු මාලාවක් පවත්වන ලදී.

### 5.2.12 *වැඩිහිටි අයිතිවාසිකම්*

වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අර්ථවත් පියවරයන් රැසක් අනුගමනය කර ඇත. රට පුරා ඇති වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් මුහුණ දෙන අභියෝග හොඳින් පරීක්ෂා කිරීමෙන් පසු මෙම පියවරයන් ගෙන ඇත. අඛණ්ඩ අධීක්ෂණය සහ බහු ක්ෂේත්‍ර චාරිකා හරහා, කොමිෂන් සභාව වැඩිහිටියන්ගේ අත්‍යවාශයක අවශ්‍යතාවන් සහ ඔවුන් පිළිබඳ දැක්විය යුතු සැළකිල්ල පිළිබඳ වටිනා අවබෝධයක් ලබා ගෙන ඇත.

- 2023 වර්ෂයේ මැයි මාසයේදී, සෑම පොලිස් ස්ථානයකම ‘වැඩිහිටි කවුළුවක්’ ස්ථාපිත කිරීම සඳහා පොලිස්පතිවරයාට නිර්දේශ කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවරක් ඉදිරියට තැබීය. මෙම පියවර මගින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ඵලදායී ලෙස ආරක්ෂා කරන විශේෂිත ආධාරක පද්ධතියක් නිර්මාණය කිරීමට උත්සාහ කෙරේ.

- පානදුර ‘සිසිල’ වැඩිහිටි නිවාසයේ පදිංචි වයෝවෘද්ධ කාන්තාවකට පහරදීමක් සිදු වූ බවට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා ලැබුණු තොරතුරු මත පදනම්ව, කොමිෂන් සභාව විසින් 2023 මැයි 8 වන දින එම නිවස පරීක්ෂා කර විමර්ශනය කිරීම සඳහා නිලධාරීන් කණ්ඩායමක් පිටත් කර හරින ලදී.

### 5.2.13. *ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම්*

ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවට අයත් ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරන්තරයෙන් සහ අඛණ්ඩව කටයුතු කරයි. ඒ පිළිබඳ මෑත කාලීන ව සිදුකළ විමර්ශනයක් වූයේ පසුගිය වසරේ දෙසැම්බර් 11 වන දින, එනම් 2022 වන දින, ඉගිනියාගල සේනානායක සමුද්‍රයේ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් ආදිවාසි පුද්ගලයින් පිරිසක් අත්අඩංගුවට ගෙන

රඳවා තබා ගැනීම පිළිබඳ විමර්ශනය කිරීමයි. ඉහත පරීක්ෂණය තවමත් සිදුකෙරෙමින් පවතී.

- 2023 ජනවාරි 18 වැනි දින ඌරුවරිගේ වන්නිල ඇත්තෝගේ ප්‍රධානත්වයෙන් යුතුව දඹාන, පොල්බද්දේ, හෙන්නානිගල, වාකරේ, කරක්චේනයි, තොකුර් සහ කට්ටපරිච්චාන් යන ප්‍රදේශවල ආදිවාසී ප්‍රජාවන් නියෝජනය කරන තවත් නායකයින් පිරිසක් (ආදිවාසී ප්‍රජාවේ) විසින් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. එහිදී පහත සඳහන් ප්‍රධාන කරුණු කිහිපයක් ඉස්මතු විය:
  - ආදිවාසී ප්‍රජාව සඳහා ව්‍යවස්ථාමය පිළිගැනීමක් නොමැතිකම.
  - ආදිවාසී ප්‍රජාවේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සැලකිල්ලට ගනිමින් ඔවුන්ට පවතින අද්විතීය ස්ථානය ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් නොමැතිකම.
  - ආදිවාසී ප්‍රජාවේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් කෙරෙහි කිසිදු සංවේදීතාවයකින් තොරව නීති ක්‍රියාත්මක කිරීම.
  - ආදිවාසී ප්‍රජාව සිය ජීවනෝපාය සඳහා සිදුකරන ක්‍රියාවලින් අපරාධ වැරදිවලට සමාන කරමින් නීති පනවන ආයතන හඳුනා ගැනීම.
  - ආදිවාසී ප්‍රජාවට ඔවුන්ගේ වාසස්ථාන සහ පාරම්පරික ඉඩම්වල සාමකාමීව ජීවත්වීම සඳහා පරිසරයක් සහතික කිරීම සඳහා යාන්ත්‍රණයකට ඉඩ පහසුකම් සැලසීම.

මෙම නායකයින් විසින් විභව විත්තිකරුවන් ලෙස ආයතන 10ක් හඳුනා ගන්නා ලදී, එනම්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පරිසර දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ඉඩම් දෙපාර්තමේන්තුව, සංරක්ෂණ දෙපාර්තමේන්තුව, විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව යනාදියයි. ඒ අනුව, ආදිවාසී ප්‍රජාවට අදාළ එවැනි ගැටළු පිළිබඳව ඉස්මතු කරවීමට සහ ආදිවාසි ප්‍රජාවට අදාළ වන අන්දමේ පුද්ගලික නීතියක් සකස් කිරීම සඳහා 2023 ජනවාරි 27 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දී මූලික සාකච්ඡාවක් පවත්වන ලදී.

## *5.2.14. ජීවනෝපාය සඳහා ඇති අයිතිය*

පුද්ගලයන්ට තමන් සහ ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීම සඳහා ජීවනෝපාය අත්‍යවශ්‍ය වේ. එබැවින්, විවිධ ක්‍රියාමාර්ග හරහා ජීවනෝපාය සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීමට කොමිෂන් සභාව දැඩි ලෙස පෙනී සිටී. එහෙයින් 2023 දී, ශ්‍රී

ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලි විමර්ශනය කිරීම හරහා වැඩදායි පියවර කිහිපයක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී:

- ශ්‍රී ලංකා යුධ හමුදාවේ නීති නිලධාරීන් හට වෘත්තීය දීමනා ලබා දීම ප්‍රතික්ෂේප කිරීම (පැමිණිලි අංකය: HRC/2499/17)
-

2017 අයවැය යෝජනා අනුව රජයේ ආයතනවලට අනුයුක්ත නීති නිලධාරීන් වීම හේතුවෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවට අනුයුක්ත නීති නිලධාරියෙකුට වෘත්තීය දීමනා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් සිදු වී ඇති බව කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලදී. පැමිණිලිකරුගේ තර්කය වූයේ 2017 අයවැය යෝජනා මත පදනම්ව ශ්‍රී ලංකාවේ විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, බලධාරීන් සහ රජයේ ආයතන ඔවුන්ගේ නීති නිලධාරීන්ට මෙම දීමනාව ගෙවා ඇති බවයි. 2017 අයවැය යෝජනා අනුව ආරක්ෂක හමුදාවන්හි නීතිඥයින්ට වෘත්තීය දීමනා සම්බන්ධයෙන්, 2017 ජුනි 17 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය DMS/0001/Vo.ll ප්‍රකාරව ආරක්ෂක හමුදාවන්හි නීතිමය තනතුරු සඳහා සෘජුවම බඳවාගෙන ඇති නීති නිලධාරීන්ට පමණක් මෙම දීමනාව ලබා ගැනීමට හිමිකමක් ඇති බව ශ්‍රී ලංකා යුධ හමුදාවේ තර්කය වේ. ඒ අනුව, හමුදාවට බැඳීමෙන් පසු නීතිඥයෙකු ලෙස ලියාපදිංචි වී පසුව පැමිණිලිකරුව නීති දෙපාර්තමේන්තුවට මාරු කර යවා ඇති හෙයින් ඔහු වෘත්තීය දීමනාව සඳහා සුදුසුකම් නොලබන තැනැත්තෙකු වේ.

මූලික බඳවා ගැනීමෙන් පසු නීතිඥවරුන් ලෙස සුදුසුකම් ලබා පසුව ශ්‍රී ලංකා හමුදාවේ නීති නිලධාරීන් ලෙස සේවය කරන නීති නිලධාරීන් හට අදාළ වෘත්තීය හිමිකම ප්‍රතික්ෂේප කිරීම වෙනස් කොට සැලකීමක් බවට පෙත්සම්කරු තර්ක කළේය. කොමිෂන් සභාවේ විමර්ශනයෙන් හෙළි වූයේ පෙත්සම්කරු ඇතුළු හමුදාවේ තවත් නීති නිලධාරීන් කිහිප දෙනෙකුට වෘත්තීය දීමනාව ලැබී නොමැති බවත් , ඔවුන් ඊට හිමිකම් ලැබීමට අවශ්‍ය අනෙකුත් සියලු සුදුසුකම් සපුරා තිබුණද නීති අධ්‍යක්ෂ වැනි ඇතැම් උසස් නිලධාරීන්ට ද එකී දීමනාව අහිමි වී ඇති නමුදු නීති නිලධාරී තනතුරුවලට සෘජුවම බඳවා ගත් ඔහුගේ යටත් නිලධාරීන් කිහිප දෙනෙකුට එකී දීමනාව හිමිවන බැවින්, මෙකී දීමනා ලබා දීම අහිමි කිරීම සමහර අවස්ථාවල මානසික අපයෝජනයක් වැනි තත්වයකට ද තුඩු දිය හැකි බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් ලෙස හඳුනාගත් කොමිෂන් සභාව, පෙත්සම්කාර නීති නිලධාරියාට සහ ඒ හා සමානව ස්ථානගත කර ඇති අනෙකුත් සියලුම නිලධාරීන්ට 2017 සිට ඔවුන්ට හිමි වී ඇති එකී වෘත්තීය දීමනාව ලැබෙන බව සහතික කිරීමට කටයුතු කරන ලෙස අදාළ බලධාරීන්ට නියෝග කළේය.

- සත්‍යාග්‍රහයකට සහභාගී වීම මත සේවකයින් අයුක්ති සහගත ලෙස සේවයෙන් පහ කිරීම (පැමිණිලි අංකය: HRC/1436|23)

ලංකා ඛනිජ තෙල් සංස්ථාව පෞද්ගලීකරණය කිරීමට එරෙහිව සත්‍යාග්‍රහයකට සහභාගී වීම හේතුවෙන්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ වෘත්තීය සමිති සංගමයේ සාමාජිකයින් වන පැමිණිලිකරු සහ තවත් වෘත්තීය සමිති ක්‍රියාකාරීන් 19 දෙනෙකු 2023 මාර්තු 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් පහ කරන ලද අතර එයදැඩි කළකෝලාහල තත්වයකට තුඩු විය. පැමිණිලිකරුවන් කරුණු ඉදිරිපත් කරමින් දක්වා තිබුණේ ඔවුන් කළකෝලාහල තත්වයට සම්බන්ධ නොවූ බවයි. පරිවාස හා පඩිනඩිවලට යටත්ව නැවත සේවයේ පිහිටුවන ලෙසට පෙත්සම්කරුවෝ ඉල්ලා සිටියහ. විමර්ශනයකින් පසු, 2023 අගෝස්තු 17 දිනැති වාර්තාවක් හරහා, ඛනිජ තෙල් සංස්ථාව ප්‍රකාශ කර සිටියේ පෙත්සම්කරුවන් බලගතු වෘත්තීය සමිති සාමාජිකයින් වන බැවින්, දැනට පවත්වාගෙන යනු ලබන විමර්ශන කටයුතු අඩාල කිරීමට ඔවුනට හැකියාවක් පවතින හෙයින්, ඔවුන්ව නැවත සේවයේ පිහිටුවීම විකල්පයක් නොවන බවයි.

විමර්ශනය කිරීමෙන් පසු, පෙත්සම්කරුවන්ගේ සේවය අවසන් කිරීමට සහ නැවත සේවයේ පිහිටුවීම ප්‍රතික්ෂේප කිරීමට හේතු අපැහැදිලි බව මානව හිමිකම් නිගමනය කළේය. අදාළ ගැටළුව විසඳීමේ ඇති දීර්ඝකාලීන ප්‍රමාදය පිළිබඳව ද එහි දී අදහස් දැක්වීනි. ඒ අනුව, කොමිෂන් සභාව සේවකයින් 03 දෙනෙකු ඔවුන්ගේ මුල් සේවා ස්ථානයේම නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කළ අතර, විෂමාචාරය පිළිබඳ කිසියම් සාක්ෂියක් හමු වුවහොත්, ඒ පිළිබඳව වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛවලට අනුකූලව නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු බවටත්; අනිවාර්ය නිවාඩු මත සිටින සේවකයින් ඔවුන්ගේ මුල් සේවා ස්ථානවලම නැවත සේවයේ පිහිටුවීමටත්, මාස 2 ක කාලයක් තුළ මූලික පරීක්ෂණ පවත්වා අවසන් කිරීමටත් නිර්දේශ ලබා දුනි.

ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම නවත්වා ඊට එරෙහිව කටයුතු කරන්නේ නම්, නැවත සේවයේ පිහිටුවන ලද සේවකයින්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට වගඋත්තරකරුට ඇති හැකියාවටකිසිදු බාධාවක් කොමිෂන් සභාවේ නිර්දේශය මගින් ඇති නොවන බවට ශ්‍රී.ලං.මා.හි.කො .ස. විසින් ඉතාමත් පැහැදිලිව දක්වා සිටින ලදී. තවද කොමිෂන් සභාවේ විධානවලට අනුකූල වන අයුරින් කටයුතු කිරීම සම්බන්ධව කොමිෂන් සභාවට කරුණු වාර්තා කරන ලෙසට වගඋත්තරකරුට සහ පෙත්සම්කරුවන්ට උපදෙස් දෙන ලදී.

- හිටපු උපකුලපතිවරයෙකුට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් අඛණ්ඩව සිදුකරන ලද අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් (පැමිණිලි අංකය: HRC/2764/21)

පෙත්සම්කරු ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ (SEUSL) හිටපු උපකුලපතිවරයෙකි. 2015 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණයට අසාර්ථක ලෙස තරඟ කිරීමෙන් පසු, ඔහු නැවත විශ්වවිද්‍යාලයට සම්බන්ධ විය. ඔහු නැවත පැමිණීමෙන් පසු, විශේෂයෙන් ඔහුගේ උසස්වීම් සහ නිවාඩු සම්බන්ධයෙන් ගැටළු කිහිපයකට මුහුණ දී තිබුණි. කුසලතා මත පදනම් වූ තනතුරක් වන මහාචාර්ය තනතුරට උසස් කිරීම සඳහා පෙත්සම්කරුගේ අයදුම්පත, 2014 දී ඔහු තනතුරින් ඉල්ලා අස්වීමට පෙර මෙන්ම , 2020 දී නැවත සේවයට බඳවා ගැනීමෙන් පසුව ද විශ්වවිද්‍යාලය විසින් දෙවරක් ප්‍රතික්ෂේප කර තිබුණි . ඊට අමතරව, 2016 දී ඔහුගේ නිවාඩු ඉල්ලීම ද ප්‍රතික්ෂේප කර තිබුණි. පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවීම ඔහුගේ ඉල්ලා අස්වීම හේතුවෙන් ඔහුගේ පෙර සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමක් සිදු නොවන බවත්, එහෙයින් ඔහුගේ සේවය මත පදනම් වූ උසස්වීම් සහ නිවාඩු වැනි ජ්‍යෙෂ්ඨත්ව ප්‍රතිලාභ සඳහා ඔහු නුසුදුසු වන බවත් අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් තර්ක කළේය. ඔහුව නැවත සේවයේ යෙදවීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) මාර්ගෝපදේශ අනුගමනය කරන බව විශ්ව විද්‍යාලය කියා සිටියේය.

වර්ෂ 2018 දී, පෙත්සම්කරු ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් කරන ලද අතර, ඒ අනුව ඔහු නැවතත් විශ්ව විද්‍යාල තනතුරෙන් ඉල්ලා අස්විය. එනමුදු 2020 දී ඔහුගේ පාර්ලිමේන්තු කාලය අවසන් වූ පසු, ඔහු නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා සිටි අතර,එක් වරක් පමණක් නැවත සේවයේ පිහිටුවීම ප්‍රදානය කිරීමේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය උපුටා දක්වමින් අග්නිදිග විශ්වවිද්‍යාලය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් ප්‍රකාශ කර සිටියේ, ඔහු විසින් පළමු වරට නැවත සේවයේ පිහිටුවීමේදී එකී වරප්‍රසාදය ලබාගෙන ඇති බවට තමන් විශ්වාස කරන බවයි.

කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයේදී හෙළි වූ කරුණු අනුව, පෙත්සම්කරු ඉල්ලා අස්වීමට පෙර ඉදිරිපත් කරන ලද උසස්වීම් සඳහා වූ මූලික අයදුම්පත සලකා බැලීම අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කිරීම ඔහුගේ සමානාත්මතාවයට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් බව සොයා ගන්නා ලදී. නැවත සේවයේ යෙදවීමෙන් පසු සප්ත වර්ෂික නිවාඩු ප්‍රතික්ෂේප කිරීම අසාධාරණ ක්‍රියාවක් බවට ද සලකන ලදී. 1983 වර්ෂයේදී දී ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහය උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය සඳහා මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරන බව ශ්‍රී.ලං.මා.හි.කො. .ස.විසින් සඳහන් කළේය. ඉල්ලා අස්වීම හේතුවෙන් පෙර සේවය

අවසන් කර නැවත සේවයේ යොදවන ලද පුද්ගලයින්ට අදාළ වන මෙකී සංග්‍රහයේ වගන්තිය ප්‍රකාරව මොහු ජ්‍යෙෂ්ඨත්ව ප්‍රතිලාභ සඳහා හිමිකම් නොකියන බව සඳහන් කල ද මහ මැතිවරණයකට තරඟ කිරීම සඳහා ඉල්ලා අස්වන විශ්ව විද්‍යාල සේවකයින් හට එකී විධිවිධානය අදාළ නොවන බවට සැලකිය යුතුය . 2014 වර්ෂයේ දී උපකුලපතිවරයා ලෙස සිටියදී ඉදිරිපත් කරන ලද පෙත්සම්කරුගේ උසස්වීම් අයදුම්පත, ඔහුගේ ඉල්ලා අස්වීම නොසලකා ක්‍රියාවට නැංවිය යුතු බව මානව හිමිකම් කොමිෂන් සභාව ලදී. පෙත්සම්කරුගේ ඉල්ලීම විශ්වවිද්‍යාල කවුන්සිලයට ඉදිරිපත් කිරීමට උපකුලපතිවරයා අපොහොසත් වූ බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා මේ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදු නොකළ බවත් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලදී.

ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(උ) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සොයාගන්න ලදී. තවද, අග්නිදිග විශ්ව විද්‍යාලය විසින් සිය ක්‍රියා පටිපාටිමය අක්‍රමිකතා නිවැරදි කර ගනිමින් මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වාර්තාවක් 2023.03.07 වන විට කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට ද නිර්දේශ කරන ලදී.

# 6 වැනි පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගීතාවය

**6.1.** ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම
**6.2** ජාත්‍යන්තර ආයතනවලට වාර්තා සහ ප්‍රකාශ ඉදිරිපත් කිරීම
**6.3** කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම
**6.4** ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයන් සමඟ වෙනත් සහයෝගිතා
**6.4.1.** ද්විපාර්ශ්වික රැස්වීම්
**6.4.2.** විදේශ අරමුදල් ලැබීම

## 6.1. ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම

2023 දී කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීමේදී කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත අභිනියෝගය ප්‍රකාරව අවශ්‍ය වන පරිදි ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් සංවිධාන සහ ආරක්ෂණ යාන්ත්‍රණ සමඟ සක්‍රිය සන්නිවේදනය සහ සහයෝගීතාව පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී.

2023 නොවැම්බර් මාසයේ දී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේදී සම්මත කර ගැනීමට ඉදිරිපත් කිරීමට නියමිත ජාතික මානව හිමිකම් ආයතනය පිළිබඳ 2023 යෝජනාව, අනුමත කරන ලෙස සහ ඊට සහාය දෙන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය. මානව හිමිකම් සහ දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීමේදී ජාතික මානව හිමිකම් ආයතනයහි වැදගත්කම සහ මෙම යෝජනාවට සහය දැක්වීම තුළින් මානව හිමිකම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ කැපවීම පෙන්නුම් කරන ආකාරය සහ එමගින් ජාත්‍යන්තර තත්ත්වය ඉහළ නැංවෙන්නේ කුමන අකාරයටදැයි යන්න කොමිෂන් සභාව අවධාරණය කළේය. ඊට අමතරව, එම යෝජනාවට දැඩි ලෙස සහාය දක්වන කොමිෂන් සභාව යළිත් අවධාරණය කළේය.

ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ ගෝලීය සන්ධානය විසින් 2022 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව "A" තත්වයේ සිට "B" තත්වයට පහත හෙලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් 2023 දී 'A තත්ත්වය' නැවත ලබා ගැනීම සඳහා නැවත ඉල්ලුම් කරන ලදී. පැරිස් මූලධර්ම සහස්වාධීනත්වය, බහුත්වවාදය සහ ඇතුළත්වීම පිළිබඳ එහි කැපවීමට අනුකූල වන පරිදි ඇතැම් ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළේය.

## 6.2 ජාත්‍යන්තර ආයතනවලට වාර්තා සහ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

2023 ජනවාරි මාසයේ දී, මානව හිමිකම් කමිටුව විසින් එහි 137 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව (6 වන වාර වාර්තාව) සමාලෝචනය කිරීම සඳහා රට තුළ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ වාර්තාවක්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය 2023 මාර්තු 6 වැනි දින මානව හිමිකම් කමිටුවේ 137 වැනි සැසිවාරයේදී කථන රැස්වීමකදී වාචිකව මෙම වාර්තාව ඉදිරිපත් කළාය. ශ්‍රී ලංකාව තුළ ICCPR ක්‍රියාත්මක කිරීම, රට තුළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකාවේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සුරැකීම සඳහා කොමිෂන් සභාවෙහි

කාර්යභාරය වැනි අදාළ කරුණු කිහිපයක් පිළිබඳව සභාපතිනිය සිය ආරම්භක ප්‍රකාශයේදී සිය අවධානය යොමු කළාය.

2023 මාර්තු මාසයේදී ජිනීවා හි ළමා අයිතිවාසිකම් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමාන්තර වාර්තාවක් සකස් කළේය. ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතු විය හැකි ප්‍රධාන සාධක කිහිපයක් වාර්තාව මගින් හඳුනාගෙන ඇති අතර එම උල්ලංඝනයන් නිවැරදි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (UNCRC) අනුකූලව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ඇතැම් පියවර ද වාර්තාවේ ඉස්මතු කර ඇත. 2019-2023 අතර කාලය තුළ ළමා අයිතිවාසිකම් සහතික කිරීමේදී ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් කොමිසම රජයේ ආයතන කිහිපයකින් තොරතුරු ලබාගෙන ඇත. ඒ අනුව, ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම; ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එහි බලපෑම; පවුල් සබඳතා අහිමි වූ දරුවන්; දේශගුණික විපර්යාස ළමා අයිතිවාසිකම් කෙරෙහි ඇති කරන බලපෑම; අභ්‍යන්තරව අවතැන් වූ දරුවන්; සහ ළමා ජාවාරම පිළිබඳ තොරතුරු වාර්තාවේ අඩංගු විය. මෙම වාර්තාව 2023 අගෝස්තු 10 වන දින ජිනීවාහි ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුති කමිටුවට ඉදිරිපත් කරන ලදි.

2023 සැප්තැම්බර් 11 සිට 29 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා හි පැවති බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුවේ විසිපස්වන සැසිවාරයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සභාපතිවරයා විසින් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදී. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බැඳීම් නිරීක්ෂණය කිරීම සහ කමිටුව හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතර අන්තර්ක්‍රියා වැඩි කිරීම වැනි මාතෘකා පිළිබඳව මෙම ප්‍රකාශයේ දී ආමන්ත්‍රණය කිරීම සිදුවුණි.

2023 දී, මානව හිමිකම් කවුන්සිලයේ 54 වන සැසිවාරය සඳහා ජාතික මානව හිමිකම් ආයතන කණ්ඩායමක් විසින් නිකුත් කරන ලද ප්‍රකාශය ද කොමිසම අනුමත කරන ලදි. වැඩිහිටි පුද්ගලයින්ගේ ආරක්ෂාව සඳහා පවතින හිඩැස් හඳුනාගෙන ඒවාට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම එම ප්‍රකාශය මගින් පිළිගැනීමට ලක් විය. වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීමටඔවුන්ගේ අයිතිවාසිකම් පැහැදිලිව දක්වා ඇති සම්මුතියක් වැනි ජාත්‍යන්තර රාමුවක් උපකාරීවන බව ද එමගින් අවධාරණය කෙරුණි.

## 6.3 කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම

'A' තත්ත්වයේ ආයතනයක් බවට නැවත පත්වීම සාක්ෂාත් කරගනු උදෙසා වර්ෂ 2023 දී ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ ගෝලීය සන්ධානය වෙත නැවත අයදුම් කිරීමට කොමිෂන් සභාව කටයුතු කළේය. 2021 දී, පැරිස් මූලධර්මවලට අනුකූලව ආයතනයේ ස්වාධීනත්වය පවත්වා ගැනීමට අපොහොසත් වීම සහ අත්අඩංගුවේ සිටියදී මරණ සහ වධහිංසා සම්බන්ධයෙන් කොමිසමට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණවල අසතුටුදායක තත්ත්වය හේතුවෙන් කොමිසම 'B' තත්ත්වයට පහත හෙලන ලදී. නැවත 'A' තත්ත්වයේ ආයතනයක් බවට සඳහා වන අයදුම්පත සලකා බැලීම සඳහා ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ ගෝලීය සන්ධානය විසින් උප කමිටුවක් කැඳවීය. මීට අදාළ සාකච්ඡා උප කමිටුව විසින් වර්ෂ 2023 දී පවත්වනු ඇත.

2022-2024 සඳහා වූ ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය සංසදයේ (CFNHRI) උපායමාර්ගික සැලැස්ම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය නිරීක්ෂණ ඉදිරිපත් කළේය. කොමිෂන් සභාව විසින් සැලැස්මේ සියලුම උපායමාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍ර ඉස්මතු කර දැක්වූ අතර, CFNHRI උපායමාර්ගික සැලැස්ම සම්බන්ධව ක්‍රීඩා, ව්‍යාපාර, දේශගුණික විපර්යාස, කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් සහ සෞඛ්‍ය සහ මානව හිමිකම් වැනි උපායමාර්ගික ප්‍රමුඛතා ක්ෂේත්‍ර තම ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

2023 මුල් භාගයේදී, ආසියා පැසිෆික් කලාපයේ ජාතික මානව හිමිකම් ආයතනවල කාර්යයන්ට ප්‍රජනන අයිතිවාසිකම් ඒකාබද්ධ කිරීම පිළිබඳව ආසියා පැසිෆික් සංසදය (APF) සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) විසින් සංවිධානය කරන ලද වැඩමුළු සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රායෝගිකව සහභාගී විය.

2023 සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති ආසියා පැසිෆික් සංසදයහි වාර්ෂික මහා සභා රැස්වීමට කොමිෂන් සභාව මාර්ගගත ක්‍රමය හරහා සහභාගී විය. ආසියා පැසිෆික් සංසදය යනු ජාතික මානව හිමිකම් ආයතන සඳහා තාක්ෂණික සහාය සපයන කලාපීය සංවිධානයයි.

## 6.4 ජාත්‍යන්තර සංවිධාන සහ ප්‍රවීණයන් සමඟ වෙනත් සහයෝගිතා

### 6.4.1. ද්වි-පාර්ශවීය රැස්වීම්

බහුවිධ අස්ථිතීන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් හරහා ජාත්‍යන්තර සහයෝගීතාවන් පුළුල් කිරීමට පියවර ගැනීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අවැසි බලය පවරා ඇත. ඒ අනුව:

- 2023 ජනවාරි මාසයේ දී, ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස් අතිගරු මයිකල් ඇපල්ටන් මහතා ශ්‍රී ලංකා මානව කොමිෂන් සභාවට ගොස් එහි සභාපතිනිය හමුවී අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කරුණු සාකච්ඡා කළේය.

- 2023 පෙබරවාරි මාසයේදී, ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති අතිගරු ජීන්-ෆ්‍රැන්කොයිස් පැක්ටෙට් මහතා කොමිෂන් සභාවට පැමිණ, මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය සහ එහි අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පවරා ඇති වගකීම් ඉටු කිරීමේදී මුහුණ දෙන අභියෝග පිළිබඳව සාකච්ඡා කළේය.

- ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා කැනඩා මහ කොමසාරිස් අතිගරු එරික් වොල්ෂ් මහතා 2023 අප්‍රේල් මාසයේදී කොමිෂන් සභාවට පැමිණ සභාපතිනිය සහ මානව හිමිකම් කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවූ අතර මානව හිමිකම් ක්ෂේත්‍ර සහ ඒ ආශ්‍රිත ගැටළු සම්බන්ධව ද්විපාර්ශ්වික සහයෝගීතාව කෙරෙහි සිය අවධානය යොමු කොට සාකච්ඡා කළේය.

### 6.4.2. විදේශ අරමුදල් ලැබීම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එහි මූලික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මූල්‍ය සම්පත්වලින් ප්‍රධාන කොටසක් සපයනු ලබන්නේ භාණ්ඩාගාරයෙනි. ඊට අමතරව, 2023 දී යුරෝපීය සංගමය (EU) - ශ්‍රී ලංකා අධිකරණ ප්‍රතිසංස්කරණ (JURE) වැඩසටහන හරහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වැනි පරිත්‍යාගශීලී ආයතන දෙකකින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අරමුදල් ලැබුණි. වගවීම, විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කර ඇති නවීන, කාර්යක්ෂම සහ අන්තර්ගත අධිකරණ අංශයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා අධිකරණ ප්‍රතිසංස්කරණ (JURE) වැඩසටහන ත්‍රිවිධාකාර ප්‍රවේශයක් ගනී.කොමිෂන් සභාව සඳහා අරමුදල් සැපයීමේ ප්‍රධාන ඉලක්කය වන්නේ මහජනතාවට වඩා හොඳින් සේවය කිරීමට හැකියාව ඇති ස්වාධීන ආයතනයක් ලෙස කොමිෂන් සභාවේ ධාරිතාවය ශක්තිමත් කිරීමයි. ඒ අනුව, කොමිෂන් සභාව

විසින් ශ්‍රී ලංකා අධිකරණ ප්‍රතිසංස්කරණ (JURE) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීමට ප්‍රධානත්වය ගෙන කටයුතු කළේය. UNDP සමඟ ඇති කරගත් ගිවිසුමට අනුව, කොමිෂන් සභාව වෙත පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීමේ කාර්යය පැවරී තිබුණි:

1. වතු අංශයේ සේවකයින්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම (රත්නපුර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල උප කාර්යාල පිහිටුවීම ඇතුළුව)
2. මානව හිමිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දුරස්ථ ඉගෙනුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
3. ආබාධිත පුද්ගලයින් සඳහා සාධාරණ වන අයුරින් නවාතැන් පහසුකම් සැපයීම
4. බන්ධනාගාර අධ්‍යයන නිර්දේශ ක්‍රියාත්මක කිරීම
5. පිරිස් පාලනය පිළිබඳ මාර්ගෝපදේශ දියත් කිරීම
6. කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව විමර්ශනවල සහ විමර්ශන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා විශේෂඥ තාක්ෂණික සහාය සහ ආධාර ලබා දීම
7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා මාධ්‍ය ඒකකයක් පිහිටුවීම
8. පර්යේෂණ ඒකකයක් පිහිටුවීම
9. කල්ගතවී ඇති ගොනු නිෂ්කාශනය සඳහා සහාය (Backlog)
10. කඩිනම් ප්‍රතිචාර ඒකකයක් පිහිටුවීම
11. ජාතික නිවාරක යාන්ත්‍රණය (NPM) සඳහා සහාය දැක්වීම

# 7 වන පරිච්ඡේදය: මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය කටයුතු

*7.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්*
*7.1.1. දේශීය පුහුණු අවස්ථා*
*7.1.2. ජාත්‍යන්තර වැඩසටහන්*
*7.2. සේවා නියුක්තිය සහ පුරප්පාඩු*
*7.3. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන*

### *7.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්*

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයේ වෘත්තීය විශිෂ්ටත්වය සහ ධාරිතාව වර්ධනය කිරීමට නිරන්තරයෙන් ප්‍රයත්න දරයි. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට ආයතනික විශිෂ්ටත්වය අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව අවබෝධ කරගෙන ඇත. එබැවින්, ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල යන ද්විත්වයෙහිම කාර්ය මණ්ඩලයන් හට ඔවුන්ගේ වෘත්තීයභාවය, කාර්යක්ෂමතාව, අභියෝග පිළිබඳ අවබෝධය සහ ඔවුන් සේවය ලබාදෙන ප්‍රජාවන්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා තම කුසලතාවන් භාවිතා කිරීමේ උපයෝගිතාවය වැඩි දියුණු කිරීම වැනි ප්‍රතිලාභයන් අත්පත් කර ගැනීමට දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ලබා ගත හැකි බොහෝමයක් පුහුණු අවස්ථාවන් වලට සහභාගිවීම දිරිමත් කරනු ලැබේ.

2023 දී පෙර වර්ෂවල මෙන් නොව, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවත්වන ලද වැඩසටහන් සහ පුහුණු අවස්ථාවලින් කොමිෂන් සභාවට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි විය.

#### *7.1.1. දේශීය පුහුණු අවස්ථා*

පහත දක්වා ඇති විවිධ අංශවල ධාරිතා වර්ධනය කරගැනීම අරමුණු කර ගනිමින්, කොමිෂන් සභාව විසින් අදාළ වසර තුළ එහි කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සැසි සහ වැඩමුළු රාශියක් සංවිධානය කළේය. 2023 ජනවාරි 23 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේදී ළමා ආරක්ෂණ අධිකාරියේ කාර්යයන් පිළිබඳව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී.

- 2023 ජූලි 24 වන දින කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා කඩිනම් ප්‍රතිචාර පිළිබඳ විශේෂ පුහුණුවක් සංවිධානය කරන ලදී.
- 2023 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අලුතින් බඳවා ගත් නිලධාරීන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහනක් කොමිෂන් සභාවේ දී පැවැත්විණි.
- 2023 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල සහායකයින් සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනයේදී ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්විණි.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා බාලවයස්කාර වැරදිකරුවන් සම්බන්ධයෙන් අදාළ වන නීති පිළිබඳ පුහුණුවක් 2023 ඔක්තෝබර් 16 වන දින කොළඹදී පැවැත්විණි.
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලය සඳහා වධහිංසා පිළිබඳ ජාතික නිවාරණ යාන්ත්‍රණය පිළිබඳ පුහුණුවක් 2023 නොවැම්බර් 13 වැනි දින පවත්වන ලදී.

### *7.1.2. ජාත්‍යන්තර වැඩසටහන්*

පෙර වර්ෂයට සාපේක්ෂව, වත්මන් වර්ෂයේදී කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සහභාගී වූ විදේශීය පුහුණු අවස්ථා සහ වැඩසටහන් රාශියක් තිබුණි. වර්ෂය මුළුල්ලේ පැවති එවැනි අවස්ථා බොහොමයක් එක්සත ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වැනි පරිත්‍යාගශීලී ආයතන විසින් පහසුකම් සපයන ලද ඒවා වන අතර එම පුහුණු ප්‍රධාන වශයෙන් ආසියානු රටවල පැවැත්විණි. මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහභාගී වූ විදේශීය පුහුණු අවස්ථා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් පහත දැක්වේ:-

| | සහභාගී වූවන්ගේ නම සහ තනතුර | කාලපරිච්ඡේදය | රට | වැඩසටහන |
|---|---|---|---|---|
| 01 | H.H.M.M.P.K. හේරත් මහත්මිය අධ්‍යක්ෂ – අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන | 21.05.2023 - 23.05.2023 | තායිලන්තය | ප්‍රජනක අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමේ උපදේශන සැලැස්ම පිළිබඳ UNFPA/APF වැඩමුළුව |
| 02 | M.A.N. චන්ද්‍රසිරි මහතා අධ්‍යක්ෂ – පර්යේෂණ හා අධීක්ෂණ | 04.06.2023- 10.06.2023 | තායිලන්තය | ආසියාවේ NHRI පිළිබඳ ව්‍යාපාර සහ මානව හිමිකම් පුහුණුව (UNDP විසින් අරමුදල් සපයන ලද) |
| 03 | K.K. විලවරජන් මහතා-අධ්‍යක්ෂ -ජාත්‍යන්තර සබඳතා | 18.06.2023 - 24.06.2023 | කොරියාව | 2023 දී කොරියානු ජනරජයේ සියෝල් හි දී මානව හිමිකම් නිලධාරීන් සඳහා හවුල්කාරිත්ව වැඩසටහන |
| 04 | A.W.M.අහමඩ් මහතා නීති නිලධාරි | 18.06.2023 - 21.06.2023 | මාලදිවයින | දකුණු ආසියාවේ ළමා අයිතිවාසිකම් ආයතන පිළිබඳ කලාපීය උපදේශනය |

| | | | | |
|---|---|---|---|---|
| 05 | W.C.D.අරුණශ්‍රී මහතා | 18.06.2023 - 21.06.2023 | මාලදිවයින | දකුණු ආසියාවේ ළමා අයිතිවාසිකම් ආයතන පිළිබඳ කලාපීය උපදේශනය |
| 06 | විනිසුරුL.T.B. දෙහිදෙනිය- සභාපති | 19.10.2023 - 23.10.2023 | රුසියාව | VII වන ජාත්‍යන්තර විද්‍යාත්මක හා ප්‍රායෝගික සමුළුව - මොස්කව් |
| 07 | මහාචාර්ය ෆාතිමා ෆසනා හනීෆා - කොමසාරිස් | 03.11.2023 - 11.11.2023 | ඉතාලිය | ආගමිකත්වය, ප්‍රචණ්ඩත්වය, දේශපාලන ප්‍රතිසංයුතින් පිළිබඳව ශ්‍රී ලංකාවෙන් සහ එහි ඩයස්පෝරාවෙන්ප්‍රත්‍යවේක්ෂණය කිරීමේ ජාත්‍යන්තර සමුළුව |
| 08 | M.A.N.චන්ද්‍රසිරි මහතා- අධ්‍යක්ෂ – පර්යේෂණ හා අධීක්ෂණ මහතා | 12.12.2023 - 17.12.2023 | නේපාලය | NPM නේපාල අධ්‍යයන චාරිකාව (UNDP JURE ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලදී) |
| 09 | N.J.D. විජයවිතාන මහත්මිය - පර්යේෂණ සහකාර | 12.12.2023 - 17.12.2023 | නේපාලය | NPM නේපාල අධ්‍යයන චාරිකාව (UNDP JURE ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලදී) |
| 10 | T. සුභාෂිණි මහත්මිය- වැඩසටහන් සහකාර | 12.12.2023 - 17.12.2023 | නේපාලය | NPM නේපාල අධ්‍යයන චාරිකාව (UNDP JURE ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලදී) |
| 11 | I.S. විතාන මහත්මිය- කළමණාකාර සහකාර | 12.12.2023 - 17.12.2023 | නේපාලය | NPM නේපාල අධ්‍යයන චාරිකාව (UNDP JURE ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන ලදී) |

### *7.2. සේවා නියුක්තිය සහ පුරප්පාඩු*

- 2023 ආරම්භයේදී, 2022.09.30 දිනට පැවති පුරප්පාඩු 84 න් නීති නිලධාරී තනතුරු 13 ක් සහ මානව හිමිකම් නිලධාරී තනතුරු 26 ක් පිරවීම සඳහා රජයේ සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටින ලදී . ඒ අනුව, රාජ්‍ය සේවය තුළින්ම එම පුරප්පාඩු පිරවීම සඳහා නීති නිලධාරීන් 13 ක් සහ මානව හිමිකම් නිලධාරීන් 16 ක් බඳවා ගන්නා ලද අතර, ඉතිරි මානව හිමිකම් නිලධාරී තනතුරු 11 සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන ලදී. මෙහි ඉතිරි

මානව හිමිකම් නිලධාරී පුරප්පාඩු 11 බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ 2024 වර්ෂය ආරම්භයේදී පැවැත්වේ.

- මීට අමතරව, සැලකිය යුතු කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ තනතුරු 04ක්, ජ්‍යෙෂ්ඨ මානව හිමිකම් නිලධාරී තනතුරු 05ක්, අභ්‍යන්තර විගණක තනතුරක් සහ කළමනාකරණ සේවා සහකාර තනතුරු 17ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීමට අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, කොමිෂන් සභාව විසින් එම පුරප්පාඩුවලින් 09ක් පුරවන ලදී.

- කාර්යාල සහායක සහ රියදුරු යන ආරම්භක මට්ටමේ තනතුරු සඳහා පවතින පුරප්පාඩු මත පදනම්ව බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සුදුසුකම් ලත් පුද්ගලයින් 08 දෙනෙකු බඳවා ගන්නා ලදී.

- නීති නිලධාරීන් 02, අධ්‍යාපන පුහුණු නිලධාරීන් 01, මානව හිමිකම් නිලධාරීන් 08, භාෂණ පරිවර්තකයින් 02, පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරීන් 01 සහ මෘදුකාංග/දෘඩාංග කාර්මික ශිල්පීන් 01 ලෙසට බඳවා ගැනීම් සිදුකිරීම සඳහා 2023.11.30 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ඇත. මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් 2024 දී ආරම්භ කෙරෙනු ඇත .

- වාර්තාකරණ වර්ෂය තුළ, පර්යේෂණ සහකාර සහ වැඩසටහන් සහකාර තනතුරු සඳහා කළමනාකරණ සහකාරවරුන් 02 දෙනෙකු පත් කරන ලදී (රාජකාරිවලට අනුයුක්ත කිරීම).

## 7.3. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

කොමිෂන් සභාවට එහි අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලැබුවේ තම මූලික ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ය. කොමිෂන් සභාවේ වැඩසටහන් කටයුතු සඳහා UNDP සහ UNICEF වෙතින් ද 2023 වර්ෂයේ දී සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් ලැබුණි. (බාහිර පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මූල්‍ය ආධාර පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 6.4.2 බලන්න).

2023 වර්ෂයේ දී බාහිර පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන ලද මූල්‍ය ආධාර පහත පරිදි වේ:

| පරිත්‍යාගශීලී නියෝජිතායතනය | අරමුණ | ලැබුණු අරමුදල | වියදම |
|---|---|---|---|
| **UNDP** | යුරෝපා සංගම්-ශ්‍රී ලංකා අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන (JURE) | 14,186,749.00 | 12,689,206.43 |
| **UNICEF** | යුරෝපා සංගම්-ශ්‍රී ලංකා අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන (JURE) | 1,497,000.00 | 1,497,000.00 |


- **වාර්ෂික මුළු මූල්‍ය ප්‍රතිපාදන (**2023.01.01 **සිට** 2023.12.31 **දක්වා**)

| | |
|---|---|
| ආරම්භක ශේෂය | **0.00** |
| භාණ්ඩාගාරයෙන් ලැබුනු අක්මුදල් | |
| පුනරාවර්තන | 253,798,000.00 |
| ප්‍රාග්ධන | 1,741,000.00 |
| UNICEF ව්‍යාපෘතිය | 1,497,000.00 |
| UNDP ව්‍යාපෘතිය | 14,186,749.00 |
| වෙනත් ලැබීම් | 360,845.87 |
| තැන්පතු ගිණුමේ ශුද්ධ වෙනස | (1,514,530.52) |
| අඩුකලා-භාණ්ඩාගාරය වෙත සිදුකළ ප්‍රේෂණ | 2,158,422.94 |
| මුළු ලැබීම් | **267,910,641.41** |
| වියදම් | |
| පුද්ගලික පඩිනඩි | 134,836,572.45 |

| | |
|---|---|
| ගමන් වියදම් | 1,083,203.83 |
| සැපයුම් | 14,448,300.41 |
| නඩත්තු වියදම් | 8,678,259.50 |
| සේවා | 81,799,339.14 |
| මාරුකිරීම් | 9,201,107.71 |
| මානව හිමිකම් වැඩසටහන් | 2,266,824.94 |
| ප්‍රාග්ධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම | 823,990.00 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම | 117,782.00 |
| ධාරිතා ගොඩනැංවීම | 139,055.00 |
| ශ්‍රීලංකාවේඅධිකරණඅංශයටසහායදැක්වීම (JURE)- UNICEF | 1,497,000.00 |
| ශ්‍රීලංකාවේඅධිකරණඅංශයටසහායදැක්වීම (JURE)- UNDP | 12,689,206.43 |
| බහුකාර්ය දෙපාර්තමේන්තුවේ උපචිත වියදම (ශීර්ෂය 334) | 330,000.00 |
| මුළු වියදම | **267,910,641.41** |

# පරිශිෂ්ට

## පරිශිෂ්ටය I: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාල ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ස්ථාන - සිතියම



# පරිශිෂ්ටය 2: නිර්දේශ ලැයිස්තුව

| | නඩු අංකය | නිකුත් කල දිනය | ලැබුණු පැමිණිලි වර්ගය | උල්ලංඝනය වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාව/න් | වගඋත්තරකරු/වන් |
|---|---|---|---|---|---|
| 1 | HRC/1424/22 | 9/1/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව12(1) | ආනන්ද විද්‍යාලය, කොළඹ 10 |
| 2 | HRC/AP/594/16 | 9/1/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | තඹුත්තේගම පොලීසිය |
| 3 | HRC/KL/146/21 | 9/1/2023 | රැකියාව | ව්‍යවස්ථාව12(1) | අග්නිදිග විශ්වවිද්‍යාලය |
| 4 | HRC/4325/16 | 9/1/2023 | වැඩ තහනම් කිරීම | ව්‍යවස්ථාව12(1) | ග්‍රාම සංවර්ධන බැංකුව |
| 5 | HRC/AP/145/14 | 9/1/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | ගිරිබාව පොලීසිය |
| 6 | HRC/BD/163/15 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | බදුල්ල බන්ධනාගාරය |
| 7 | HRC/1112/21 | 9/1/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව12(1) | රාජකීය විද්‍යාලය, කොළඹ 07 |
| 8 | HRC/1746/20 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | මාතලේ පොලීසිය |
| 9 | HRC/825/18 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | අහුන්ගල්ල පොලීසිය |
| 10 | HRC/3886/15 HRC/3885/15 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | මාරවිල පොලීසිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | HRC/K/267/21 | 9/1/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | පේරාදෙණිය පොලීසිය |
| 12 | HRC/AP/259/18 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | ගිරිබාව පොලීසිය |
| 13 | HRC/AM/68/14 | 9/1/2023 | දේපළ සඳහා අයිතිය | ව්‍යවස්ථාව12(1) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 14 | HRC/ANU/279/21 | 9/1/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | අනුරාධපුර පොලීසිය |
| 15 | HRC/4593/13 | 9/1/2023 | ස්ථානමාරු | ව්‍යවස්ථාව 12(1) | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 16 | HRC/2257/15<br>HRC/2606/15 | 9/1/2023 | වධහිංසා | ව්‍යවස්ථාව11 | වැලිපැන්න පොලීසිය |
| 17 | HRC/1827/17 | 9/1/2023 | හිරිහැර කිරීම | ව්‍යවස්ථාව12(1) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 18 | HRC/AP/514/14 | 9/1/2023 | අත්අඩංගුවට ගැනීම/රඳවා ගැනීම | ව්‍යවස්ථාව 13(1) | මහවිලච්චිය පොලීසිය |
| 19 | HRC/AM/96/18 | 9/1/2023 | දේපළ අයිතිය | ව්‍යවස්ථාව 12(1) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර |
| 20 | HRC/187/22 | 10/1/2023 | සේවා උසස්වීම් | ව්‍යවස්ථාව 12(1) | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 21 | HRC/755/20 | 31/1/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **22** | HRC/703/22<br>HRC/503/22 | 31/1/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| **23** | HRC/1044/21 | 31/1/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| **24** | HRC/832/15 | 31/1/2023 | විභාග | ව්‍යවස්ථාව 12(1) | කොළඹ විශ්වවිද්‍යාලය |
| **25** | HRC/K/133/22/A | 8/2/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | ධර්මරාජ විද්‍යාලය, මහනුවර |
| **26** | HRC/2315/17<br>HRC/2316/17 | 8/2/2023 | විභාග | ව්‍යවස්ථාව 12(1) | ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය |
| **27** | HRC/KND/160/22 | 8//2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | ධර්මරාජ විද්‍යාලය, මහනුවර |
| **28** | HRC/KND/131/22 | 8/2/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර |
| **29** | HRC/4574/15 | 8/2/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| **30** | HRC/2523/21 | 9/2/2023 | රැකියාව | ව්‍යවස්ථාව 12(1) | ශ්‍රී ලංකා පොලීසිය |
| **31** | HRC/AP/521/16 | 8/2/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | හබරණ පොලීසිය |
| **32** | HRC/KND/168/22 | 8/2/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | කිංග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර |
| **33** | HRC/2764/21 | 8/2/2023 | සේවා උසස්වීම් | ව්‍යවස්ථාව 12(1) | අග්නිදිග විශ්වවිද්‍යාලය |
| **34** | HRC/K/04/20 | 8/2/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | මහනුවර ධර්මරාජ විද්‍යාලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **35** | HRC/2499/17 | 24/2/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | ආරක්ෂක අමාත්‍යාංශය / ශ්‍රී ලංකා යුද හමුදාව |
| **36** | HRC/K/178/21 | 10/3/2023 | රැකියා අවසන් කිරීම | ව්‍යවස්ථාව 12(1) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| **37** | HRC/1062/19 | 9/3/2023 | බඳවා ගැනීම | ව්‍යවස්ථාව 12(1) | කොළඹ මහ නගර සභාව |
| **38** | HRC/575/17 | 8/3/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | ආරක්ෂක අමාත්‍යාංශය/පොලිස්පති |
| **39** | HRC/AM/22/14/ | 9/3/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | ඉගිනියාගල පොලීසිය |
| **40** | HRC/2698/21 | 9/3/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව12(1) | රාජකීය විද්‍යාලය, කොළඹ 07 |
| **41** | HRC/1140/12 | 21/3/2023 | හිරිහැර කිරීම | ව්‍යවස්ථාව 12(1) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **42** | HRC/1238/22 | 28/3/2023 | වැඩ තහනම් කිරීම | ව්‍යවස්ථාව12(1) | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය |
| **43** | HRC/3481/15 | 30/3/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | ප්‍රාදේශීය සභාව, මහර |
| **44** | HRC/BD/124/22 | 30/3/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව12(1) | ග්‍රාමසේවක |
| **45** | HRC/185/20 | 29/3/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව12(1) | රාජකීය විද්‍යාලය, කොළඹ 07 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **46** | HRC/1126/22 | 4/4/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව12(1) | කෑගල්ල විද්‍යාලය, කෑගල්ල |
| **47** | HRC/MR/SUO/MOTU /05/22 | 4/4/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | නගර සභාව, කුරුණෑගල / නාගරික සංවර්ධන අධිකාරිය / ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **48** | HRC/2650/18 | 4/4/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | මහින්ද රාජපක්ෂ විද්‍යාලය |
| **49** | HRC/4670/22 | 4/4/2023 | අත්අඩංගුවට ගැනීම/රඳවා ගැනීම | ව්‍යවස්ථාව 13(1) | ග්‍රෑන්ඩ්පාස් පොලීසිය |
| **50** | HRC/2819/17<br>HRC/2637/17 | 25/4/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | විශේෂ කාර්ය සාධක බලකාය |
| **51** | HRC/2602/20 | 25/4/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | විශේෂ කාර්ය සාධක බලකාය |
| **52** | SUO/MOTU/05/22 | 18/4/2023 | නීති විරෝධී ඝාතන | | ආරක්ෂක අමාත්‍යාංශය/පොලිස්පති |
| | HRC/KND/198/22 | | නීති විරෝධී ඝාතන | | |
| | HRC/1467/22 | | නීති විරෝධී ඝාතන | | |
| | HRC/1468/22 | | වධහිංසා | ව්‍යවස්ථාව11 | |
| | HRC/1173/22 | | නීති විරෝධී ඝාතන | | |
| | HRC/1461/22 | | වධහිංසා | ව්‍යවස්ථාව 11 | |
| | HRC/1161/22 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | හිරිහැර කිරීම | | |
| **53** | HRC/KND/610/22 | 4/5/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | කිංස්වුඩ් විද්‍යාලය, මහනුවර |
| **54** | HRC/3530/15<br>HRC/3531/15<br>HRC/3532/15 | 19/05/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය |
| **55** | HRC/1397/22<br>HRC/769/22 | 19/5/2023 | සේවා උසස්වීම් | ව්‍යවස්ථාව 12(1) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| **56** | HRC/2041/21 | 8/6/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | වයඹ විශ්වවිද්‍යාලය |
| **57** | HRC/BD/57/20 | 8/6/2023 | රාජ්‍ය අධිකාරීන්ගේ අක්‍රියබව | ව්‍යවස්ථාව 12(1) | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| **58** | HRC/2436/14 | 15/6/2023 | අත්අඩංගුවට ගැනීම | ව්‍යවස්ථාව 13(1) | සුරාබදු දෙපාර්තමේන්තුව |
| **59** | HRC/K/37/18 | 15/6/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | මහාමායා බාලිකා විද්‍යාලය |
| **60** | HRC/1623/21 | 15/6/2023 | රැකියාව | ව්‍යවස්ථාව 12(1) | ශ්‍රී ලංකා යුද හමුදාව |
| **61** | HRC/KND/399/22/M | 17/8/2023 | දේපළ අයිතිය | ව්‍යවස්ථාව 12(1) | ප්‍රාදේශීය සභාව, උඩුදුම්බර |
| **62** | HRC/1604/15 | 23/8/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | වැලිකඩ පොලීසිය |
| **63** | HRC/AM/52/20 | 1/9/2023 | අත්අඩංගුවට ගැනීම/රඳවා ගැනීම | ව්‍යවස්ථාව 13(1) | අම්පාර පොලීසිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| **64** | HRC/BD/215/22 | 1/9/2023 | අත්අඩංගුවට ගැනීම/රඳවා ගැනීම | ව්‍යවස්ථාව 13(1) | ඇතිමලේ පොලීසිය |
| **65** | HRC/833/19 | 13/9/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| **66** | HRC/KND/45/23 | 13/9/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | මහාමායා බාලිකා විද්‍යාලය |
| **67** | HRC/4227/15 | 2/10/2023 | රැකියාව | ව්‍යවස්ථාව 12(1) | මිණුම් දෙපාර්තමේන්තුව |
| **68** | HRC/KND/76/23 | 1/11/2023 | පාසල්වලට ඇතුළත් කිරීම | ව්‍යවස්ථාව 12(1) | මහනුවර උසස් බාලිකා විද්‍යාලය |
| **69** | HRC/2919/20 | 31/10/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | මත්තේගොඩ පොලීසිය |
| **70** | HRC/AP/237/16 | 1/11/2023 | වධහිංසා | ව්‍යවස්ථාව 11 | ගලෙන්බිඳුණුවැව පොලීසිය |
| **71** | HRC/4765/22 | 1/11/2023 | සේවා උසස්වීම් | ව්‍යවස්ථාව12(1) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| **72** | HRC/KI/15/21 | 8/12/2023 | යාම් ඊම් නිදහස | ව්‍යවස්ථාව14(1)(උ) | ශ්‍රී ලංකා නාවික හමුදාව |

## පරිශිෂ්ටය 3: විධිමත් පැමිණිල්ලකින් තොරව වුවද මානව හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳව විමර්ශනය කිරීම

| | දිනය | නඩු අංකය | විෂයගත කරුණ | වගඋත්තරකරු |
|---|---|---|---|---|
| 1 | | HRC/SUO/MOTU/01/23 | අධිකරණමය නොවන ඝාතන | පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය |
| 2 | | HRC/SUO/MOTU/02/23 | වධහිංසා | ඩී.එස්. සේනානායක ජාතික පාසල, බේරුවල |
| 3 | | HRC/SUO/MOTu/03/23 | වධහිංසා | මරදාන පොලීසිය |
| 4 | | HRC/SUO/MOTU/04/23 | අධිකරණමය නොවන ඝාතන | ශ්‍රී ලංකා හමුදාව |
| 5 | | HRC/SUO/MOTU/05/23 | අධිකරණමය නොවන ඝාතන | මීගමුව පොලීසිය |
| 6 | | HRC/SUO/MOTU/06/23 | එක්රැස්වීමේ නිදහස | පොලිස්පති |
| 7 | | HRC/SUO/MOTU/07/23 | ප්‍රකාශනයේ නිදහස සහ රැස්වීමේ නිදහස | ආරක්ෂක අමාත්‍යාංශය/ පොලිස්පති |
| 8 | | HRC/SUO/MOTU/08/23 | අධිකරණමය නොවන ඝාතන | මාරවිල පොලීසිය |
| 9 | | HRC/SUO/MOTU/09/23 | රැස්වීමේ නිදහස | පොලිස්පති |

| | | | | |
|---|---|---|---|---|
| **10** | | HRC/SUO/MOTU/10/23 | අධ්‍යාපනයේ ඇති අයිතිය | අධ්‍යාපන අමාත්‍යාංශය |
| **11** | | HRC/SUO/MOTU/11/23<br>HRC/2170/23 | අත්අඩංගුවේ දී මරණයට පත්වීම | වැලිකඩ පොලීසිය |
| **12** | | HRC/SUO/MOTU/12/23 | අත්අඩංගුවේ දී මරණයට පත්වීම | අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය ආයතනය |
| **13** | | HRC/SUO/MOTU/13/23 | අත්අඩංගුවේ තබා ගැනීම/රඳවා ගැනීම | බොරැල්ල පොලීසිය |
| **14** | | HRC/SUO/MOTU/14/23 | දේපළ අයිතිය | සහකාර වතු අධිකාරී |
| **15** | | HRC/SUO/MOTU/15/23 | සිරකරුවන්ගේ අයිතිවාසිකම් | ගාල්ල බන්ධනාගාරය |
| **16** | | HRC/SUO/MOTU/16/23 | අත්අඩංගුවේ දී මරණයට පත්වීම | දෙහිවල පොලීසිය |
| **17** | | HRC/SUO/MOTU/17/23 | අත්අඩංගුවේ දී මරණයට පත්වීම | අවිස්සාවේල්ල පොලීසිය |
| **18** | | HRC/SUO/MOTU/18/23 | අත්අඩංගුවේ තබා ගැනීම/රඳවා ගැනීම | ඇල්පිටිය පොලීසිය |
| **19** | | HRC/SUO/MOTU/19/23 | අධිකරණමය නොවන ඝාතන | කදාන පොලීසිය |

| | | | | |
|---|---|---|---|---|
| 20 | | HRC/SUO/MOTU/20/23 | අධිකරණමය නොවන ඝාතන | විශේෂ කාර්ය සාධක බලකාය |
| 21 | | HRC/SUO/MOTU/21/23 | අත්අඩංගුවේ තබා ගැනීම/රඳවා ගැනීම | අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව |
| 22 | | HRC/SUO/MOTU/22/23 | වධහිංසා | වටරැක බන්ධනාගාරය |
| 23 | | HRC/SUO/MOTU/23/23 | අත්අඩංගුවේ දී මරණයට පත්වීම | කළුතර බන්ධනාගාරය |